වාර්ෂික වාර්තාව

2023

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

අංක 42, NDB/EDB ගොඩනැගිල්ල, නවම් මාවත, කොළඹ 02.

"Your Vital Island" – ශ්‍රී ලංකාවේ ජාතික අපනයන සන්නාමය

වර්තමාන තරඟකාරී ගෝලීය වෙළඳපොළ තුළ, ශ්‍රී ලංකාව විසින් සිය අපනයන අංශය සඳහා සවිමත් ජාතික සන්නාමයක් ස්ථාපනය කරගැනීම ඉතාමත් වැදගත් කරුණකි. ඒකාබද්ධ සහ මනාව සැලසුම් කළ ප්‍රවර්ධන වැඩසටහනක් ඔස්සේ අන්තර්ජාතික වෙළඳපොළවල් තුළ ශ්‍රී ලංකාවේ පෙනී සිටීම සහ උසස් ගුණාත්මක තත්ත්වයේ විශ්වසනීය නිෂ්පාදන ප්‍රභවයක් ලෙස මෙරට ස්ථානගත කිරීම ඉහළ නැංවීම සිදුකළ හැකි ය.

මෙම අවශ්‍යතාවය හඳුනාගෙන, ජාත්‍යන්තර ගැනුම්කරුවන් සහ ශ්‍රී ලංකාවේ පාර්ශවකරුවන් සම්බන්ධ කෙරෙන සංසක්ත අනන්‍ය සන්නාමයක් යටතේ මෙරට අපනයනයන් පුළුල් වශයෙන් ප්‍රවර්ධනය කරන ජාතික අපනයන සන්නාම ප්‍රයත්නයක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් “Your Vital Island” නමින් වූ ශ්‍රී ලංකාවේ ජාතික අපනයන සන්නාමය සකස් කර ප්‍රකාශයට පත්කරන ලදී. මෙම සන්නාමය යටතේ තිරසර සහ විශ්වසනීය නිෂ්පාදන සඳහා ප්‍රකට ඉතා වැදගත් ප්‍රභවස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ ස්වභාවය මෙම සන්නාමය තුළ සංක්ෂිප්තව අන්තර්ගතව පවතී. ශ්‍රී ලංකාවේ අනන්‍ය ශක්තීන් සහ ශක්‍යතාවයන් මතුකර දක්වමින්, ගෝලීය වෙළඳපොළ ඉල්ලුම සපුරාලීම සහ ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රය තුළ වැදගත් භූමිකාවක් ඉටු කරන්නෙකු ලෙස ශ්‍රී ලංකාවේ කීර්තිය සවිමත් කරවීම මෙම "Your Vital Island" සන්නාමය ඔස්සේ අපේක්ෂා කෙරේ.

මෙරට ආර්ථිකය සහ මෙම ගතික ක්ෂේත්‍රය සඳහා දායකත්වය දරන දේශීය නිෂ්පාදකයන් යන දෙඅංශය සඳහාම ප්‍රතිලාභ සලස්වමින්, මෙම පරිපූර්ණ සන්නාම ක්‍රමෝපාය ඔස්සේ සිය අපනයන ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කරගැනීම සහ ගෝලීය වෙළඳපොළ තුළ ප්‍රමුඛ ස්ථානයක් සුරක්ෂිත කරගැනීම සමබරව පවත්වා ගැනීම ශ්‍රී ලංකාව විසින් අපේක්ෂා කෙරේ.

අපනයන වෙළඳාම ආශ්‍රිත ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සහයෝගිතාවයෙන් මෙරට අපනයන ක්ෂේත්‍රයේ සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරමින්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2022-2026 දක්වා වූ කාල සීමාව සඳහා ශ්‍රී ලංකාවේ ජාතික අපනයන සන්නාමයට අදාළව නිතර භාවිතාවන වැකිකඩ (taglines), ලාංඡන (logos) සහ ප්‍රවර්ධන සැලැස්ම සම්බන්ධිත කටයුතු සාර්ථක අයුරින් අවසන් කර ඇත. ඉහළ ගුණාත්මක තත්ත්වයේ, තිරසර සහ සත්‍ය වශයෙන් මෙරට නිෂ්පාදිත බවට ප්‍රකට විශ්වසනීය නිෂ්පාදන සඳහා ප්‍රමුඛතම ප්‍රභවස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම මෙම “Your Vital Island” වශයෙන් හැඳින්වෙන ජාතික අපනයන සන්නාමය ඔස්සේ නියෝජනය වේ. සිය අනන්‍ය හරය ආරක්ෂා කර ගනිමින්, ගෝලීය ප්‍රමිත සපුරාලන භාණ්ඩ සහ සේවා බෙදාහැරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති කැපවීම මෙමඟින් අවධාරණය කෙරේ.

"Your Vital Island" සිරස්තලය යටතේ ශ්‍රී ලංකාව විසින් ඉහළ ගුණාත්මක තත්ත්වයේ නිෂ්පාදන මාලාවක් ගෝලීය වෙළඳපොළ වෙත ප්‍රදර්ශනය කෙරේ. ඇඟළුම්, සිලෝන් තේ, කුළුබඩු, පොල් නිෂ්පාදන, ආහාර සහ පානවර්ග, මත්ස්‍ය නිෂ්පාදන, රබර් නිෂ්පාදන, සෙරමික් සහ පෝසිලේන් අයිතම, බෝට්ටු සහ නැව් තැනීමේ ද්‍රව්‍ය, විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් නිෂ්පාදන මීට ඇතුළත් වේ. මීට අමතරව, තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ සැපයුම් දාම කළමනාකරණය වැනි සේවා ක්ෂේත්‍රවල ද සුවිශේෂී දක්ෂතා පෙන්නුම් කරමින් ජාත්‍යන්තර වශයන් සිය පෙනීසිටීම, ශ්‍රී ලංකාව විසින් තවදුරටත් වැඩිදියුණු කරගනිමින් සිටී.

එකිනෙක වෙන්කර හඳුනාගත හැකි ලාංඡන සමඟින් එකිනෙකට අනන්‍ය වර්ණ තේමා සෑම ක්ෂේත්‍රයක් සඳහා ම නිර්මාණය කර, ඒවා ඒකීය ජාතික අපනයන සන්නාමයක් යටතේ ප්‍රවර්ධනය කෙරේ. මෙම මූලාරම්භය 2023 වර්ෂයේ නොවැම්බර් 23 දිනැතිව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ජනාධිපති අපනයන සම්මාන උළෙලේ දී නිල වශයෙන් ආරම්භ කරන ලදී. මෙම සන්නාමය ජාත්‍යන්තර වශයෙන් මුලින්ම ප්‍රසිද්ධියට පත්කිරීම සිදුවූයේ 2024 ජූනි මාසයේ එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර පැවති ඇඟළුම් සහ රෙදිපිළි ප්‍රදර්ශනයක දී ය.

"Your Vital Island" සන්නාමය සමඟින් සුවිශේෂී කුසලතා, තිරසරබව සහ සිය විශ්වසනීයත්වය තහවුරු කරමින් ජාත්‍යන්තර ඉල්ලුම සපුරාලීම සඳහා වන සිය සූදානම ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය විසින් ප්‍රදර්ශනය කෙරේ. අසමසම ගුණාත්මක තත්ත්වය, සුවිශේෂී අනන්‍ය නිෂ්පාදන, සහ එක් එක් ගැනුම්කරුවන්ගේ අවශ්‍යතා මත පදනම්ව ලබාදෙන සේවා වශයෙන් වූ සියලුම දෑ සත්‍ය වශයෙන්ම මෙරට නිෂ්පාදන බවට තහවුරු කිරීම සඳහා වූ කැපවීම මෙම සන්නාමය ඔස්සේ සංකේතවත් වේ.

සන්නාමය පිළිබඳ සකස් කළ වීඩියෝ, එක් එක් ක්ෂේත්‍ර ආශ්‍රිතව අධ්‍යයන, දැන්වීම් පත්‍රිකා, පොතක් සහ පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමක් වශයෙන් වූ සන්නාම පෙළගැස්මක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සකස් කර තිබේ. තිරසරබව, කුසලතාවය, සහ සත්‍ය වශයෙන් මෙරට නිෂ්පාදන බවට වූ විශ්වසනීයත්වය ප්‍රකට කරමින් ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ වන අතර, ගෝලීය මට්ටමින් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන ධනාත්මක ප්‍රතිරූපය එමඟින් තවදුරටත් වැඩිදියුණු වනු ඇත.

පටුන

		පිටු අංකය
	පටුන	1
	සභාපති / ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවිඩය	3
	හැඳින්වීම	4
	ආයතනික තොරතුරු - අධ්‍යක්ෂ මණ්ඩලය	5
	- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය	7
	ආයතනික පාලන වාර්තාව	8
	විගණන කමිටු වාර්තාව	13
	අවදානම් විශ්ලේෂණය	17
	මූල්‍ය වාර්තාව / 2014 සිට 2023 දක්වා මූල්‍ය කටයුතුවල සුවිශේෂී කරුණු	19
1.	**අපනයන කාර්යසාධනය 2023**	22
	අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය - 2023 ජනවාරි - දෙසැම්බර්	23
	1.1 2023 වර්ෂය තුළ දී ශ්‍රී ලංකාවේ අපනයනවල සංයුතිය	24
	1.2 2020-2023 දක්වා කාලසීමාව තුළ වෙළඳ අපනයනයන් මාසික වශයෙන්	24
	1.3 2022 සහ 2023 වර්ෂවල දී ක්ෂේත්‍ර වශයෙන් සැලකූවිට අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය	25
	1.4 2023 වර්ෂය තුළ සේවා අංශයේ අපනයන	26
	1.5 ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන ගමනාන්ත 15	26
	1.6 නිදහස් වෙළඳ ගිවිසුම්වල (FTA) පාර්ශවකරුවන් වෙත සිදුකළ අපනයන (ඉන්දියාව හා පකිස්තානය)	27
	1.7 ශ්‍රී ලංකාවෙන් සිදුකරන අපනයනවලට අදාළ විදේශීය අපනයන කලාපයන්	28
2.	**2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය**	29
	2.1 වෙළඳපොළ සංවර්ධනය සහ සන්නාමකරණය	29
	2.1.1 වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය - ජාත්‍යන්තර	29
	2.1.2 වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීවීම - දේශීය	36
	2.2 ව්‍යාපාරික හමුවීම් වැඩසටහන් (B2B Programmes)	37
	2.3 සන්නාම/ වෙළඳ ලකුණු/ භූගෝලීය දර්ශක	38
	2.4 වෙළඳපොළ වාණිජමය අගයක් ඇති යාවත්කාලීන තොරතුරු	40
	2.5 ශ්‍රී ලාංකික නිෂ්පාදන චීනය වෙත යැවීමේ දී වෙළඳපොළ නිෂ්කාශනය	41
3	**අපනයනකරුවන්ගේ කුසලතා සංවර්ධනය/ පුහුණුව**	43
	3.1 ජර්මනියේ Import Promotion Desk සමඟ සහයෝගීතාවයෙන් සුළු සහ මධ්‍ය පරිමාණ ආහාර අමුද්‍රව්‍ය නිෂ්පාදක/ අපනයන ව්‍යවසායකයින් සඳහා යුරෝපා වෙළඳපොළ වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම	43
	3.2 ආයතනික මනා අධීක්ෂණය සම්බන්ධිත ජර්මනියේ නව පනත පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය	43

		පිටු අංකය
	3.3 අනෙකුත් මාර්ගගත සම්මන්ත්‍රණ/ සමුළු/ වැඩමුළු	44
4	**නිමැවුම් / නිෂ්පාදන සංවර්ධන වැඩසටහන්**	45
	4.1 ශ්‍රී ලංකාවේ තිරසර කාබනික කෘෂිකාර්මික පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම	45
	4.2 ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානය (NPC) යළි පනගැන්වීම	45
5	**අපනයන සඳහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනයට පහසුකම් සැලසීම**	46
6	**ජනාධිපති අපනයන සම්මාන**	48
7	**අපනයන ආශ්‍රිත ප්‍රකාශන**	48
8	**අපනයනකරුවන්ගේ සංසදය**	48
9	**ඊ-වෙළඳපොළ - ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ප්‍රවර්ධනය කිරීම**	49
10	**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කෙටි සහ මධ්‍ය කාලීන වශයෙන් ගත යුතු පියවරවල සාරාංශයක් - 2022-2024**	50
11	**2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ නව සැලසුම්**	53
12.	**මූල්‍ය ප්‍රකාශන 2023**	54
	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	55
	2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	56
	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	57
	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	58
	කළමනාකාරිත්වයේ වගකීම පිළිබඳ ප්‍රකාශය	59
	පොදු තොරතුරු	60
	විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති	61
	මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	73
13.	**විගණකාධිපති වාර්තාව - 2023**	90

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවිඩය

ව්‍යවස්ථාදායක බලතල යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ජාතියේ ප්‍රමුඛතම වෙළඳ පහසුකම් සැපයීමේ ආයතනය ලෙස කටයුතු කරනු ලැබේ. ගෝලීය වෙළඳ කටයුතු සඳහා අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් කේන්ද්‍රීය ස්ථානය ලෙස, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙරට අපනයන ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

මෙහි ආරම්භ අවස්ථාවේ සිටම අපනයන දිරිගැන්වීම සහ අපනයන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම ඔස්සේ අපනයනකරුවන් වෙත සහාය ලබාදීම පිණිස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටී. අපගේ ජාතික ආර්ථිකයේ සීමිත අවකාශය හේතුවෙන්, අපනයන වර්ධනය තිරසාර අයුරින් පවත්වා ගැනීම අතිශයින් වැදගත් වේ. වර්ධනය වෙමින් පවතින ගෝලීයකරණය සහ ඒකාබද්ධතාවය මධ්‍යයේ වුව ද, මෙය කාර්යය සාක්ෂාත් කරගැනීම සඳහා අපගේ තරඟකාරී වාසිය උපයෝගී කරගැනීමට සහ ශ්‍රී ලංකාවේ තරඟකාරී වාසිය තරඟකාරී ශක්තීන් බවට පරිවර්තනය කරගැනීම අප විසින් අනිවාර්යෙන් සිදුකළ යුතු ය.

රජයේ දැක්ම වනුයේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ අංකුර ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීම, අගය එකතු කරන ක්ෂේත්‍රවල දායකත්වය ඉහළ නැංවීම, සහ වෙළඳපොළ තුළ සුවිශේෂී ලාභදායි අංශ (specialized niches) කෙරෙහි අවධානය යොමුකරමින් අපගේ වෙළඳපොළවල් විවිධාංගීකරණය කිරීම හරහා අපනයන ආර්ථිකය පුළුල් කිරීම මඟින් ශ්‍රී ලංකාව සමෘද්ධිමත් තත්ත්වයක් කරා ඉහළ නැංවීමයි. අපනයනයන් දිරිගැන්වීම සහ පහසුකම් සැලසීම, මෙකී වර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම පරිවර්තන ක්‍රියාවලිය තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

දැනට සිටින අපනයනකරුවන් සඳහා ඔවුන්ගේ දැනට පවතින වෙළඳපොළවල් පුළුල් කිරීම සඳහා සහාය ලබාදීම, නව අපනයන නිෂ්පාදන හඳුන්වාදීම, නව වෙළඳපොළවල් කරා විවිධාංගීකරණය, ධාරිතා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සහ අපනයන අභිමුඛ විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම අපගේ ක්‍රමෝපායික ආධාරක යටතට ඇතුළත් වේ. අපගේ ශක්තීන් උපරිම මට්ටමකට ළඟාකරගැනීම සහ ඉලක්කගත විදේශ විනිමය ඉපැයුම් අත්පත් කරගැනීම උදෙසා මෙම ප්‍රයත්නයන් සැලසුම් කර තිබේ.

2024 වර්ෂය වෙත එළඹෙන මෙම අවස්ථාවේ දී, ජාත්‍යන්තර පුරෝකථන ඔස්සේ වඩාත් හිතකර ව්‍යාපාරික පරිසරයක් පිළිබඳව ඇඟවීම් සිදුකර තිබේ. මා විසින් අනාගතය සම්බන්ධයෙන් සුබවාදී ආකල්පයක් හොබවන අතරම සුවිශේෂී වැඩිදියුණු තත්ත්වයන් අපට දැකගත හැකිවන බවට වූ විශ්වාසයද මා තුළ පවතී.

සමාප්තිය වශයෙන්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිත්වය ලබාදීම තුළින් රජය විසින් මා කෙරෙහි තැබූ විශ්වාසය සම්බන්ධයෙන් මාගේ අවංක කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

සිය වටිනා දායකත්වයන් ලබාදීම වෙනුවෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ප්‍රශංසාව පුද කරන අතරම සියලුම පාර්ශවකරුවන්ට ඔවුන්ගේ සහාය වෙනුවෙන් ස්තූතිය පුද කරමි. මෙම ආයතනයේ ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා වූ ප්‍රබල කැපවීම සහ අධිෂ්ඨානය වෙනුවෙන් මණ්ඩලයේ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය වෙත ද ප්‍රශංසාව පිරිනැමිය යුතු ය.

ශ්‍රී ලංකා ආර්ථිකයේ වඩාත්ම වැදගත් අංශය බවට අපනයන අංශය වර්තමානයේ දී පත්වී ඇති අතර, අප විසින් අඛණ්ඩව ප්‍රතිඵල ලබාදීමේ නිරත අතරම ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රයේ නව ඉසව් තුළ ජයග්‍රහණයන් සාක්ෂාත් කරගන්නා තවත් වසරක් කෙරෙහි අපේක්ෂා රඳවා සිටින්නෙමු.

ආචාර්ය කිංග්ස්ලි බර්නාඩ්
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

හැඳින්වීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යනු අපනයන සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වන අතර, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ 1979 වර්ෂයේ දී මෙය ස්ථාපනය කරන ලදී. 2023 වර්ෂයේ දී වෙළඳ භාණ්ඩ සහ සේවා අංශයේ අපනයනය තුළින් ඇමරිකානු ඩොලර් බිලියන 18.8ක විදේශ විනිමය ඉපැයුම් ලබා ගැනීමේ අරමුණැතිව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා නව ක්‍රමෝපායික ප්‍රවේශයක් අනුගමනය කරන ලද අතර එමඟින් රජය විසින් ඉලක්ක කරන ලද සංවර්ධන අරමුණු සඳහා දායකත්වය ලබා දෙන ලදී. ජාතික අපනයන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා නව ක්‍රමෝපායක් දියත් කිරීමේ දී සිය වගකීම් ඉටු කිරීම පිණිස ප්‍රතිපත්ති උපදේශක, අධීක්ෂක, ප්‍රවර්ධක, පහසුකම් සැපයුම්කරු සහ දැනුම් සම්පාදක වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිය භූමිකා ඉටුකරනු ලැබේ.

දැක්ම

සුවිශේෂී නිෂ්පාදන සහ සේවා සඳහා ප්‍රමුඛතම අපනයන කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම.

මෙහෙවර

ක්‍රමෝපායික සහයෝගිතාවය ඔස්සේ ශ්‍රී ලංකාවේ අපනයනයන් ගෝලීය වශයෙන් තරඟකාරීබවට පත්කිරීම.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යයන්

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වගකිවයුතු රජයේ නියෝජිතායතනයක් වශයෙන්, අප විසින් පහත කාර්යයන් ඉටු කරනු ලැබේ:

- **පහසුකම් සපයන්නා** – සියලුම පාර්ශවකරුවන් සමඟ අපනයන සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය සිදුකරමින් අපනයන සංවර්ධනය සඳහා කේන්ද්‍රීය ස්ථානය වශයෙන් කටයුතු කිරීම.
- **ප්‍රවර්ධකයා** – ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය සඳහා නිෂ්පාදිත, සැලසුම්, සන්නාම, වෙළඳපොළ සංවර්ධන සහ වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- **දැනුම් සම්පාදකයා** – අපනයනකරුවන් සඳහා අපනයන ව්‍යාපාර සම්බන්ධ සියලු කරුණු සහ වෙළඳපොළ වාණිජමය අගයක් ඇති යාවත්කාලීන තොරතුරුවලට අදාළව උපදේශක සේවා හා තොරතුරු සැපයීම.
- **අධීක්ෂක** – ගෝලීය සහ දේශීය ව්‍යාපාරික පරිසරය ඇගයීම සහ අපනයන කාර්යසාධනය අධීක්ෂණය සහ අපනයන ඉලක්ක වෙත ළඟාවීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.
- **ප්‍රතිපත්ති උපදේශක** – අපනයන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ජාතික අපනයන සංවර්ධන ප්‍රතිපත්තීන් පිළිබඳව රජයට උපදෙස් ලබා දීම.

ආයතනික තොරතුරු

අධ්‍යක්ෂ මණ්ඩලය - 2023

			සිට	දක්වා
1	සුරේෂ් ඩී. ද මැල් මහතා ආචාර්ය කිංග්ස්ලි බර්නාඩ් මහතා	සභාපති සහ ප්‍රධාන විධායක	11.12.2020 03.04.2023	31.03.2023 19.09.2024
2	ඉන්දිරා මල්වත්ත මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	03.04.2023	08.10.2024
3	ජගත් ප්‍රනාන්දු මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	03.04.2023	29.08.2024
4	ශිරෙන්ද්‍ර ලෝරන්ස් මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	03.04.2023	19.09.2024
5	අනුෂ්ක විජෙසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	03.04.2023	07.11.2023
6	කේ. ඒ. විමලෙන්තිරාජා මහතා අධ්‍යක්ෂ ජනරාල් (වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය.	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	02.03.2022	30.10.2024
7	ඩබ්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ මහතා අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සහ සංවර්ධන), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	05.01.2023	30.10.2024
8	ඒ.එච්.එස්. ෆරීදා මිය අධ්‍යක්ෂ ජනරාල් ධීවර සහ ජලජීවී අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	14.09.2020	මේ දක්වා
9	අයි. චන්දිම පතිරාජ මහතා අතිරේක ලේකම් (ආංශික සංවර්ධන) කර්මාන්ත අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	02.03.2023	මේ දක්වා
10	ශානිකා දිසානායක මිය අතිරේක ලේකම් විදේශ කටයුතු අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	03.05.2023	මේ දක්වා
11	රේණුකා එම්. වීරකෝන් මිය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	05.05.2022	මේ දක්වා

			සිට	දක්වා
12	කේ.එන්.කුමාරි සෝමරත්න මිය අතිරේක ලේකම් (සංවර්ධන) වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	14.12.2022	31.12.2023
13	සුනිල් ගලගම මහතා අතිරේක ලේකම් (සංවර්ධන) ආයෝජන ප්‍රර්ධන අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	14.12.2022	06.07.2023
14	ආචාර්ය ඊ.ආර්.එස්.පී. එදිරිමාන්න අතිරේක ලේකම් (කෘෂිකර්ම තාක්ෂණ), කෘෂිකර්ම අමාත්‍යාංශය.	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	31.08.2023	මේ දක්වා

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය - 2023

1.	සභාපති සහ ප්‍රධාන විධායක	සුරේෂ් ඩී. ද මැල් මහතා [31.03.2023 දින දක්වා] ආචාර්ය කිංග්ස්ලි බර්නාඩ් මහතා [03.04.2023 දින සිට]
2.	වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්	පී.වී.ඒ.එම්. බද්දේගමගේ මිය
3.	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන)	එස්.ආර්.පී. ඉන්ද්‍රකීර්ති මහතා
4.	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)	පී.වී.ඒ.එම්. බද්දේගමගේ මිය
5.	අධ්‍යක්ෂ - අලෙවි සංවර්ධන	අනෝමා ප්‍රේමතිලක මිය
6	අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන	සේපාලිකා ජයවර්ධන මිය
7.	අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති හා උපාය මාර්ගික සැලසුම්	ඕ.එම්.සී. කුමුදුනී මිය
8.	අධ්‍යක්ෂ - අපනයන සේවා	එල්.වයි.ආර්.අයි. කොඩිකාර මිය
9.	අධ්‍යක්ෂ - මුදල්	කේ.ඩී. පෙරේරා මහතා
10.	අධ්‍යක්ෂ - කෘෂි අපනයන	ජේ.එස්. බදුගම මහතා [2022.03.03 සිට]
11.	වැඩ බලන අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ	ඩී.කේ.ඩී.එස්. සිසිල් මහතා
12.	වැඩ බලන අධ්‍යක්ෂ – කාර්මික නිෂ්පාදන	මනෝජා දිසානායක මිය [2022.01.03 සිට]
13.	වැඩ බලන අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ	යූ. අක්මීමන මහතා
14.	වැඩ බලන අධ්‍යක්ෂ - වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු	අචිනි වීරවර්ධන මිය [2022.04.01 සිට]
15.	නීති නිලධාරිනී	ඩී.ටී. විජේරත්න මිය
16.	අභ්‍යන්තර විගණක	නිල්මිණි රණසිංහ මිය
17.	විගණකවරු	**විගණකාධිපති**
18.	බැංකුකරුවන්	ලංකා බැංකුව, සම්පත් බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව
19.	ප්‍රධාන කාර්යාලය	නො : 42, නවම් මාවත, කොළඹ 02.
20	පළාත් කාර්යාල	**දකුණු පළාත් කාර්යාලය** 1 වන මහල, අංක 5ඒ, සී.ඒ. ආර්යතිලක මාවත, මාතර.
		මධ්‍යම පළාත් කාර්යාලය 675, 3වන මහල, විලියම් ගොපල්ලව මාවත, මහනුවර.
		වයඹ පළාත් කාර්යාලය 2 වන මහල, ජී-සික්ස් ගොඩනැගිල්ල, අංක 42, මිහිඳු මාවත, කුරුණෑගල.
		උතුරු පළාත් කාර්යාලය NHDA ගොඩනැගිල්ල, වන සංරක්ෂණ කාර්යාල පාර, චුන්ඩික්කුලි, යාපනය

ආයතනික පාලන වාර්තාව

01. හැඳින්වීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යනු (SLEDB) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය උදෙසා 1979 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආයතනයි.

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වගකිවයුතු රජයේ නියෝජිතායතනයක් වශයෙන්, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පහත කාර්යයන් ඉටු කරනු ලැබේ.

- **පහසුකම් සපයන්නා** – අපනයන සංවර්ධනය සඳහා කේන්ද්‍රීය ස්ථානය වශයෙන් කටයුතු කරන අතර, සියලුම පාර්ශ්වකරුවන් සමඟ අපනයන සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය සිදු කිරීම.
- **ප්‍රවර්ධකයා** – ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය සඳහා නිෂ්පාදන, සැලසුම්, සන්නාම, වෙළඳපොළ සංවර්ධන හා වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- **දැනුම් සම්පාදකයා** – අපනයනකරුවන් සඳහා අපනයන ව්‍යාපාර සම්බන්ධ සියලු කරුණු සහ වෙළඳපොළ වාණිජමය අගයක් ඇති යාවත්කාලීන තොරතුරුවලට අදාළව උපදේශක සේවා හා තොරතුරු සැපයීම.
- **අධීක්ෂක** – ගෝලීය සහ දේශීය ව්‍යාපාරික පරිසරය ඇගයීම සහ අපනයන කාර්යසාධනය අධීක්ෂණය සහ අපනයන ඉලක්ක වෙත ළඟාවීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.
- **ප්‍රතිපත්ති උපදේශක** – අපනයන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා වන ජාතික අපනයන සංවර්ධන ප්‍රතිපත්තීන් පිළිබඳව රජයට උපදෙස් ලබා දීම.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මණ්ඩලයේ එහි සියලු කටයුතුවල විනිවිදභාවය, වගවීම හා සදාචාරාත්මක චර්යාව සහතික කිරීම උදෙසා ආයතනික පාලනයේ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා කැප වී සිටී. පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය සහ තිරසර වර්ධනය වැඩිදියුණු කිරීම උදෙසා මෙම ප්‍රතිපත්ති රැකගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය කැපවී සිටියි.

02. අධ්‍යක්ෂ මණ්ඩලය

ආයතනය වෙත ක්‍රමෝපායික මඟ පෙන්වීම සහ අධීක්ෂණ කටයුතු සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ. සමබර සහ ස්වාධීන තීරණ ගැනීමේ ක්‍රියාවලියක්

සහතික කරමින්, විවිධ පසුබිම් ඔස්සේ සහ විශේෂඥ දැනුමෙන් යුතුව රාජ්‍ය සහ පෞද්ගලික අංශ නියෝජනය කරන තැනැත්තන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. ආයතනයේ ක්‍රමෝපායික අරමුණු හා අනුගතවීම සහතික කරමින්, ප්‍රධාන ප්‍රතිපත්ති, අයවැය හා කාර්යසාධන වාර්තා සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චිත කාලාන්තරවලදී රැස්වෙනු ලැබේ.

අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්භාරය සහ වගකීම්

- අපනයන සංවර්ධන මණ්ඩලයේ ක්‍රමෝපායික මඟ පෙන්වීම සහ අරමුණු සකස් කිරීම
- ක්‍රියාකාරී සැලැස්ම, ක්‍රමෝපාය සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම
- මූල්‍ය කාර්යසාධනය සහ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම
- නෛතික හා නියාමන අවශ්‍යතාවල අනුකූලතාවය සහතික කිරීම
- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පත්කිරීම සහ කාර්යසාධනය ඇගයීම

සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු ය.

03. පරිපාලන මාර්ගෝපදේශ සංග්‍රහය සහ කමිටු

සේවකයන්, අධ්‍යක්ෂවරු සහ පාර්ශ්වකරුවන් වෙත චර්යා සහ ආචාර ධර්ම සංග්‍රහය මෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ හෝ මණ්ඩලය තුළ කටයුතු කිරීමේ දී විධිවිධාන සලස්වන ප්‍රමිත හා පරිචයන් සඳහා අනෙකුත් ආයතනික ප්‍රතිපත්ති ද ඇතුළුව අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි පිළිබඳ වැදගත් තොරතුරු සහ පැහැදිලි මඟ පෙන්වීමක් මත පරිපූර්ණ මාර්ගෝපදේශ සංග්‍රහයක් වශයෙන් අපනයන සංවර්ධන මණ්ඩලයේ පරිපාලන මාර්ගෝපදේශ සංග්‍රහය ක්‍රියා කෙරේ. මණ්ඩලයේ අභ්‍යන්තර මෙහෙයුම් අධීක්ෂණය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන ප්‍රධාන කමිටු ස්ථාපිත කර තිබේ:

1) **කළමනාකරණ කමිටුව:** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කරන ක්‍රමෝපායික විධාන ක්‍රියාත්මක කිරීම සහ ආයතනයේ දෛනික වැඩ කටයුතු අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව වගකිව යුතු වේ.
2) **විගණන කමිටුව:** මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, සහ අවදානම් කළමනාකරණ පරිචයන් අධීක්ෂණය කෙරේ.
3) **ප්‍රසම්පාදන කමිටු:** ප්‍රසම්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, ප්‍රසම්පාදන රෙගුලාසි/ මාර්ගෝපදේශවලට අනුකූලතාවය සහතික කිරීම, සහ ආයතනික අවශ්‍යතා සපුරාලීමට සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටු වගකිව යුතු ය. ප්‍රසම්පාදන කටයුතුවල ස්වභාවය පදනම් කරගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටු

ත්‍රිත්වයක්, එනම් දෙපාර්තමේන්තුගත ප්‍රසම්පාදන කමිටුව, උපදේශක ප්‍රසම්පාදන කමිටුව, සහ සුළු ප්‍රසම්පාදන කමිටුව පත්කරනු ලැබේ.

4) **පුහුණු කමිටුව:** පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම, දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් නම් කිරීම, පුහුණු වැඩසටහන් සකස් කිරීම, සහ සේවකයන්ගේ අඛණ්ඩ ඉගෙනුම සහ සංවර්ධනය සහතික කිරීම සඳහා එම පුහුණු වැඩසටහන්වල ඵලදායිතාවය ඇගයීම සම්බන්ධයෙන් පුහුණු කමිටුව වගකිව යුතු ය.

5) **මාරු කමිටුව:** අපනයන සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලමින් සාධාරණ හා පාරදෘශ්‍ය ක්‍රියාවලියක් සහතික කරමින් ආයතනය තුළ මාරුවීම් සිදුකිරීම සඳහා වන ඉල්ලීම් ඇගයීම සහ අනුමත කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ මාරු කමිටුව වගකීම දරනු ලැබේ.

6) **වෛද්‍ය කමිටුව:** වෛද්‍ය සහාය යෝජනා ක්‍රමය යටතේ අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවකයන් වෙත පිරිනැමෙන වරප්‍රසාද ලැබීමේ ක්‍රියාවලිය මෙම කමිටුව විසින් අධීක්ෂණය කරනු ලැබේ.

04. බඳවාගැනීමේ ක්‍රියා පටිපාටිය සහ උසස් කිරීමේ ක්‍රියා පටිපාටිය

සාධාරණ සහ විනිවිදභාවයකින් යුතු තෝරා ගැනීමේ ක්‍රියාවලියක් සහතික කරමින්, නව සේවකයින් බඳවා ගැනීම සඳහා වන නිර්ණායක සහ කාර්ය පටිපාටි, බඳවා ගැනීමේ පටිපාටියෙහි දක්වා තිබේ. අනෙක් අතින්, උසස් කිරීමේ ක්‍රියා පටිපාටිය මගින් ලකුණු සහ කාර්ය සාධනය මත පදනම්ව දැනට සිටින සේවකයන් ඉහළ තනතුරුවලට උසස් කිරීමේ නිර්ණායක සහ ක්‍රියාවලි නිර්වචනය කෙරේ.

05. විනිවිදභාවය සහ තොරතුරු අනාවරණය කිරීම

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එහි කටයුතුවල විනිවිදභාවය පවත්වාගැනීම වෙනුවෙන් කැපවී සිටින අතර, විවිධ මාර්ග ඔස්සේ පාර්ශ්වකරුවන් සමඟ නිරන්තරයෙන් සන්නිවේදනය පවත්වාගෙන යනු ලැබේ. වාර්ෂික වාර්තා, මූල්‍ය ප්‍රකාශන, සහ කාර්යසාධන යාවත්කාලීන කිරීම් ප්‍රකාශයට පත්කිරීම සහ පොදු ජනතාවට ඒවා සඳහා පිවිසිය හැකි පරිද්දෙන් පවත්වාගෙන යනු ලබයි. ආයතනය විසින් එහි කාර්යයන්, ප්‍රතිපත්ති හා පාලන ව්‍යුහය වැනි තොරතුරු රැගත් www.srilankabusiness.com යන නමින් හැඳින්වෙන නිල වෙබ් අඩවියක් ද පවත්වාගෙන යනු ලැබේ.

06. විමසීම් ස්ථානය / උපකාරක කවුළුව

පාරිභෝගිකයන් වෙත සහාය, මාර්ගෝපදේශ ලබාගැනීම, සහ අපනයන, පහසුකම් හෝ අනෙකුත් උපකාරී කාර්යයන්ට අදාළ සේවා ඉල්ලුම් කිරීම සඳහා සම්බන්ධ විය හැකි කේන්ද්‍රීය ස්ථානය ලෙස අපනයන සංවර්ධන මණ්ඩලයේ උපකාරක කවුළුව ක්‍රියාකෙරෙන අතර ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුමට අනුකූලව විමසීම් හා ගැටලු සඳහා කාලීන හා කාර්යක්ෂම අයුරින් විසඳුම් සැපයීම සිදු කෙරේ.

07. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකරන ආයතනික මට්ටමේ නියෝජනය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ආයතනික මට්ටමේ නියෝජනය ඔස්සේ සිය පාර්ශ්වකරුවන් සමඟ අදාළ පාර්ශ්ව සබඳතා පවත්වාගෙන යන අතර, ආයතනයේ ක්‍රමෝපායික දිශානතිය, ජයග්‍රහණ සහ හරාත්මක අරමුණුවල ඵලදායි සහයෝගීතාවයක් මීට අන්තර්ගත වේ. අපනයන ප්‍රවර්ධනය කරමින් සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය උදෙසා මෙහෙයවීම අවධාරණය කරමින්, මෙම සන්නිවේදන කාර්යය රජයේ ආයතන, කාර්මාන්ත හවුල්කරුවන්, සහ පොදු ජනතාව ඇතුළුව විවිධ පාර්ශ්වකරුවන් වෙත යොමු වේ.

08. අන්තර් නියෝජිතායතන සහයෝගිතාවය

අ) ජාතික මට්ටම:

අපනයනකරුවන්ගේ සංසදය

මෙහෙයුම් සහ වෙළඳාමේ ප්‍රතිපත්තිමය කරුණුවලට අදාළ ව්‍යාපාරික ප්‍රජාව සහ අපනයනකරුවන් මුහුණ දෙන විශේෂිත ගැටළු හඳුනාගැනීම සඳහා පොදු වේදිකාවක් සැපයීමට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයනකරුවන්ගේ සංසදයක් සංවිධානය කරන ලදී. ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතාගේ ප්‍රධානත්වයෙන් 23 වැනි අපනයනකරුවන්ගේ සංසදය 2023 නොවැම්බර් 2 වැනි දින පැවැත්විණි. සැසිය අතරතුර, අදාළ කරුණු අටක් පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, පසුකාලීන ක්‍රියාමාර්ග දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

මීට අමතරව, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අදාළ රේඛීය නියෝජිතායතන සමඟ සහයෝගයෙන්, අපනයනකරුවන් මුහුණ දෙන මූල්‍ය ගැටලු මෙන්ම ගෝලීය වෙළඳපොලේ තරඟකාරීව සිටීමට ඔවුන්ව සවිබල ගන්වන හිතකර පරිසරයක් ඇති කිරීම සඳහා පහසුකම් සලසන ලදී.

උපදේශක කමිටු

වර්තමානයේ දී, 2021 ජූලි මස 15 වැනි දින සිට පස් අවුරුදු කාලසීමාවක් සඳහා උපදේශක කමිටු විසි හතරක් (24) ක්‍රියාත්මක වේ. නිෂ්පාදන සහ සේවාවල වර්ධනය හා වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් මෙන්ම අපනයන වෙළඳ කටයුතුවල ක්‍රියාකාරී අංශවලට පිළියම් යොදමින් 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 10(1) වගන්තියට අනුකූලව මෙම කමිටු ක්‍රියාත්මක වේ.

අපනයන ක්ෂේත්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය, පුද්ගලික අංශයේ සංගම්, විශේෂඥ දැනුමෙන් හෙබි තැනැත්තන්, අදාළ රජයේ ආයතන නියෝජනය කිරීම සඳහා සහ අදාළ නිෂ්පාදන ක්ෂේත්‍රවල අත්දැකීම් සහිත සිය විශේෂඥ දැනුම මත පදනම්ව එකී ක්ෂේත්‍රවල කටයුතුවල නියැලෙන අදාළ ක්ෂේත්‍ර සඳහා දායකත්වය දැක්විය හැකි රේඛීය අමාත්‍යාංශ මඟින් නම් කරන තැනැත්තන්ගෙන් උපදේශක කමිටුවලට සාමාජිකයන් තෝරා පත්කරගෙන ඇත.

උපදේශක කමිටු සඳහා පුද්ගලික සහ රාජ්‍ය අංශයේ නියෝජනය මඟින්, අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි යෝජනා සම්පාදනය සහ ඒවායේ කාර්යක්ෂම ක්‍රියාත්මක වීම සිදුවිය හැකි පරිසරයක් නිර්මාණය වීම අපේක්ෂා කෙරේ.
පහත දැක්වෙන නිෂ්පාදන සහ සේවා අංශ ආවරණය වන පරිද්දෙන් උපදේශක කමිටු ක්‍රියාත්මක වේ.

1. ඇඟලුම්	2. ආයුර්වේද හා ශාකසාර නිෂ්පාදන සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය
3. බෝට්ටු හා නෞකා නිපදවීම	4. පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන
5. ඉදිකිරීමේ සේවා	6. අධ්‍යාපනික සේවා
7. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් උපාංග	8. අපනයන නිෂ්පාදන ගම්මාන
9. මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ	10. තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ව්‍යාපාරික ක්‍රියාවලි කළමනාකරණය
11. අලෝක ඉංජිනේරු කටයුතු	12. කාර්ය සංවිධානය
13. සමුද්‍රීය සහ අක් වෙරළ ඉංජිනේරු කටයුතු	14. ඛනිජ ද්‍රව්‍ය පාදක නිෂ්පාදන
15. ජාතික තත්ත්වපාලන යටිතල පහසුකම්	16. කාබනික නිෂ්පාදන
17. විසිතුරු මසුන්	18. ඖෂධ ද්‍රව්‍ය
19. සැකසුම් කළ ආහාර සහ පානවර්ග	20. ප්‍රාදේශීය සංවර්ධනය
21. රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන හා ප්ලාස්ටික්	22. මුහුදු ආහාර සහ ජලජීවී අංශය
23. කුළුබඩු සහ සාන්ද්‍රණ	24. වෙළඳ ප්‍රවාරණ සහ වෙළඳ තොරතුරු

ආ) ජාත්‍යන්තර මට්ටම:

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය තානාපති කාර්යාල, ජාත්‍යන්තර වෙළඳ මණ්ඩල, සහ වෙළඳ ප්‍රවර්ධන ආයතන (TPOs) සමඟ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහයෝගීතාවයන් ඇති කරගෙන තිබේ.
සමාප්තිය වශයෙන්, ආයතනික පාලනයේ ඉහළතම ප්‍රමිත ආරක්ෂා කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටියි. ආයතනයේ මෙහෙයුම්වලට අදාළ සියලුම කරුණුවලදී විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක චර්යාව ප්‍රවර්ධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අඛණ්ඩව කැපවී සිටියි.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

විගණන කමිටු වාර්තාව - 2023

හැඳින්වීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක් වශයෙන් විගණන කමිටුව පිහිටුවන ලදී. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය සඳහා වන මාර්ගෝපදේශවල 7.4.1 වැනි ඡේදයේ දක්වා ඇති පරිදි, සමාලෝචිත කාල සීමාව තුළ විගණන කමිටුවේ සභාපතිත්වය දරන ලද මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා ද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත විය.

යථොක්ත සඳහන් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව, විගණන කමිටුව අවම වශයෙන් කාර්තුවකට එක් වරක් බැගින් රැස්විය යුතු අතර, අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් 04ක් පැවැත්විය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් සහ ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරිවරයෙකු නිරීක්ෂක වශයෙන් සහභාගී වූ විගණන කමිටු හතරක් (04) පහත වගුවේ දක්වා ඇති පරිදි 2023 වර්ෂය තුළ දී පවත්වා ඇත.

විගණන කමිටු රැස්වීම්වල විස්තර - 2023

කාර්තුව	දිනය	සාමාජිකයන් සහ නිරීක්ෂකවරු
1 වැනි කාර්තුව	2023 මැයි 18	<u>සහභාගී වූ සාමාජිකයන්</u> කේ.ඒ.විමලේන්තිරරාජා මයා සභාපති (භාණ්ඩාගාර නියෝජිත) ඒ.එච්.එස්.ෆරීඩා මෙය විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික <u>සහභාගී නොවූ සාමාජිකයන්</u> නිලක්ෂි ගුණසේකර මෙය විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික <u>නිරීක්ෂක</u> එම්.පී.ජයතිලක මිය විගණන අධිකාරී
2 වැනි කාර්තුව	2023 ජූලි 13	<u>සහභාගී වූ සාමාජිකයන්</u> කේ.ඒ.විමලේන්තිරරාජා මයා සභාපති (භාණ්ඩාගාර නියෝජිත) ඒ.එච්.එස්.ෆරීඩා මෙය විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

		<u>සහභාගී නොවූ සාමාජිකයන්</u> අනුෂ්ක විජේසිංහ මයා විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික <u>නිරීක්ෂක</u> එම්.පී.ජයතිලක මිය විගණන අධිකාරී
3 වැනි කාර්තුව	2023 ඔක්තෝබර් 20	<u>සහභාගී වූ සාමාජිකයන්</u> කේ.ඒ.විමලේන්තිරරාජා මයා සභාපති (භාණ්ඩාගාර නියෝජිත) ඒ.එච්.එස්.ෆරීඩා මෙය විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික කේ.එන්.කුමාරි සෝමරත්න මෙය විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික <u>නිරීක්ෂක</u> එම්.පී.ජයතිලක මිය විගණන අධිකාරී
4 වැනි කාර්තුව	2023 දෙසැම්බර් 21	<u>සහභාගී වූ සාමාජිකයන්</u> කේ.ඒ.විමලේන්තිරරාජා මයා සභාපති (භාණ්ඩාගාර නියෝජිත) ඒ.එච්.එස්.ෆරීඩා මෙය විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික <u>සහභාගී නොවූ සාමාජිකයන්</u> කේ.එන්.කුමාරි සෝමරත්න මෙය විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික <u>නිරීක්ෂක</u> එම්.පී.ජයතිලක මිය විගණන අධිකාරී

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම පිණිස යහපාලනයක් සඳහා වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශවල සහ අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ දක්වා ඇති විෂය පථයට අනුව විගණන කමිටුව විසින් සිය කාර්ය සහ කර්තව්‍යයන් ඉටුකරන ලදී.

ප්‍රගතිය

සමාලෝචිත වර්ෂය තුළ දී, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයන් සහ විගණන ක්‍රියාවලි වැඩි දියුණුව කරා මෙහෙයවීමට විගණන කමිටුව දායකවී තිබෙන අතර, ආයතනයේ

මූල්‍ය කළමනාකරණ පරිචයන් සුවිශේෂී අයුරින් වැඩිදියුණු කිරීම සඳහා දායක වූ ප්‍රධාන නිර්දේශ, විධාන සහ යෝජනා කිහිපයක් ද ලබා දී තිබේ.

- කමිටුව විසින් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය, ඇගයීම සිදුකළ අතර එහි ඵලදායිතාවය සහ ආයතනික අරමුණු සමඟ අනුගතවීම සහතික කරමින් එකී සැලැස්ම වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ලබාදෙන ලදී.

- ගිණුම්කරණ ප්‍රමිත සමඟ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අනුකූලතාවය සහ මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම විගණන කමිටුව විසින් සහතික කරන ලදී. වැඩිදියුණු වූ මූල්‍ය විනිවිදභාවය සහ වගවීම සඳහා පරිපූර්ණ සමාලෝචනය සහ උපදෙස් දායක වී තිබේ.

- කමිටුව විසින් විගණකාධිපතිවරයාගේ විගණන විමසුම්, අභ්‍යන්තර විගණන වාර්තා සහ අපගමනයන් නිරවද්‍ය කිරීම සඳහා ගනු ලැබූ කළමනාකරණ පියවර සමාලෝචනය කර ඇගයීම සිදුකළ අතර, අඛණ්ඩ වැඩිදියුණු කිරීම් හා යහපත් පරිචයන්ට අනුගතවීම සහතික කරන ලදී.

- මණ්ඩලයේ ස්ථාවර වත්කම් වාර්තාකරණයේ දී සහ පවත්වාගෙන යෑමේ දී සිදුවන වැරදී සහ අතපසුවීම් මඟහැරවීම සඳහා ස්ථාවර වත්කම් ආශ්‍රිත කාර්ය පරිපාටි මාර්ගෝපදේශන අත්පොතක් පිළියෙල කිරීම සඳහා විගණන කමිටුවේ උපදෙස් හා මාර්ගෝපදේශ ලබාදෙන ලදී. ඒ අනුව, වත්කම් අත්පත් කරගැනීම, ඉවත් කිරීම, තක්සේරු කිරීම ආදී වශයෙන් වූ කාර්යයන් සඳහා අදාළ චක්‍රලේඛ අනුගමනය කරමින් කාර්ය පරිපාටි මාර්ගෝපදේශන අත්පොත පිළියෙල කරන ලදී.

- PL 1 සහ PL 3 ශ්‍රේණි සඳහා කළමනාකාරිත්වය විසින් යෝජනා කරන ලද වර්ෂයක් සඳහා සපත්තු කුට්ටම් දෙකක් ලබාදීම වෙනුවට, වර්ෂයක් සඳහා එක් සපත්තු කුට්ටමක් පමණක් ලබාදීම සම්බන්ධයෙන් විරුද්ධතාවයක් නොමැති බවට විගණන කමිටුව විසින් අනුමත කරන ලදී. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ආකාරයේ ආයතනවල PL ශ්‍රේණියේ සේවකයන් සඳහා සපත්තු කුට්ටම් දෙකක් ලබාදීම නියාමනය කරන විධිවිධානක් නොමැති බවට විගණන කමිටුව විසින් සඳහන් කරන ලදී. එසේ වුව ද, කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කළ පැහැදිලි කිරීම සැලකිල්ලට ගෙන, PL ශ්‍රේණියේ සේවකයන්ගේ මාසික වැටුප සහ විවිධ අඩු කරගැනීම්වලින් පසු ඔවුන් වෙත ලැබෙන වැටුප වැනි සාධක කිහිපයක් එකී සේවකයන්ගේ රාජකාරී සමඟ අවධානයට යොමු කිරීමෙන් අනතුරුව, 2023 වර්ෂයේ සිට සපත්තු කුට්ටම් එකක් පමණක් ලබාදීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමට විරුද්ධතාවයක් නොමැති බවට විගණන කමිටුව විසින් අනුමත කරන ලදී. PL ශ්‍රේණියේ සේවකයන් සඳහා සපත්තු කුට්ටමක් සැපයීම සඳහා වන පිරිවැය ගෙවිය යුතු වන්නේ භාණ්ඩාගාර අරමුදල්වලින් නොව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඉපැයූ ආදායමින් බවට ද සඳහන් කරන ලදී.

- මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් යෝජනා කළ පරිදි වෙළඳපොළ ප්‍රවේශ සහාය වැඩසටහන යටතේ මෝනාලිසා ප්‍රඩක්ට්ස් සමාගම වෙත මුදා හරින ලද 40%ක පූර්ව ගෙවීම් වශයෙන් වූ රු.මිලියන 2.0න් ශේෂ වූ රු.මිලියන 1.8ක මුදල අයකරගන්නා ලෙසට සහ 100%ක අධිභාරයෙන් 25%ක් අත්හරින ලෙස විගණන කමිටුව විසින් උපදෙස් ලබාදෙන ලදී (මෝනාලිසා සමාගම විසින් අධිභාරය 100% කින් අත්හැර දමන ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් ඉල්ලා සිටින ලදී). එබඳු වටිනාකමකින් යුතු මුදලක් අයකර ගැනීමට ගතවන කාලය සහ අධිකරණ තීන්දුව ලැබුණු දිනයේ සිට එනම්, 2023 නොවැම්බර් 10 වැනි දින සිට වසර දෙකක් ඇතුළත සමස්ත රු.මිලියන 3.3 (පූර්ව ගෙවීමේ රු.මිලියන 1.8ක් වූ ඉතිරිය සහ රු. මිලියන 1.5ක් වූ අධිභාරය) සැලකිල්ලට ගෙන මෙසේ උපදෙස් ලබා දෙන ලදී. වසර 2ක් ඇතුළත මෙය බේරුම් කිරීමට සමාගම විසින් අපොහොසත් වුවහොත්, ගිවිසුම ප්‍රකාරව, 100%ක අධිභාරයක් ගෙවීමට සමාගම බැඳී සිටියි. මෙම කරුණු සියල්ල අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත් බවට විගණන කමිටුව විසින් සඳහන් කරන ලදී.

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් ලබාදුන් කරුණු සහ පැහැදිලි කිරීම් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, රු.15,000/- ක රෙදිපිළි අත්තිකාරම් මුදලක් ගෙවීම සඳහා වූ යෝජනාව මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කමිටුව විසින් එකඟවන ලදී. සේවකයන්ගේ ඉල්ලීම අනුව මෙම රෙදිපිළි අත්තිකාරම් මුදල ගෙවීම සිදුකරන බැවින්, ඉල්ලීම් පරිදි මණ්ඩලයේ සියලුම සේවකයන් සඳහා මෙම රෙදිපිළි අත්තිකාරම් මුදල ගෙවන්නේ ද නැතහොත් මාණ්ඩලික නොවන ශ්‍රේණිවල සේවකයන් සඳහා පමණක් ගෙවන්නේ ද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කිරීම සඳහා විගණන කමිටුවේ නිර්දේශය ලබාදෙන ලදි.

- පිරිවැය - ඵලදායිතාවය කෙරෙහි අවධානය යොමුකරමින් සහ නිෂ්ඵල ආකාරයේ වියදම් අත්හැර දැමීමේ අවස්ථා හඳුනාගනිමින් විගණන කමිටුව විසින් කාර්තුමය මූල්‍ය කාර්යසාධනය අධීක්ෂණය කරන ලදී.

- කමිටුව විසින් කාර්තුමය කාර්යසාධන වාර්තා සමාලෝචනය කළ අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් කොපමණ සංඛ්‍යාවක් අපනයනකරුවන් බවට පත්වී තිබේ ද, කොපමණ සංඛ්‍යාවක් සිය ඇසුරුම් ප්‍රමිති වැඩිදියුණු කරගෙන තිබේ ද, කොපමණ සංඛ්‍යාවක් සිය නිෂ්පාදනවල ගුණාත්මකබව ඉහළ නංවා තිබේ ද වැනි විස්තර අන්තර්ගත කරමින් කාර්ය සාධනය වැඩිදියුණු කරගැනීමට සහ වාර්තා පිළියෙළ කිරීමේ පරිචයන් සඳහා අදහස් හා යෝජනා ලබා දෙන ලදී.

කේ.ඒ.විමලේන්තිරරාජා
සභාපති - විගණන කමිටුව
(අධ්‍යක්ෂ ජනරාල් - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය)

අවදානම් විශ්ලේෂණය

සංකීර්ණ සහ ගතික ගෝලීය පරිසරයක් මධ්‍යයේ වුව ද ශ්‍රී ලංකාවේ අපනයනයන් ප්‍රවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කැප වී සිටියි. අපගේ ප්‍රයත්නයන් යොමුවී ඇත්තේ අවස්ථා උපරිම කරගැනීම කෙරෙහි වන අතර, අපගේ මෙහෙයුම් සහ අරමුණු කෙරෙහි බලපාන විවිධ අවදානම් පැවතීම අප විසින් හඳුනාගනු ලැබේ. ප්‍රමුඛ අවදානම් සහ ඒවා අවම කරගැනීමේ ක්‍රමෝපාය විශේෂණය කර දැක්වීම අවදානම් විශ්ලේෂණයේ අරමුණ වේ.

අභ්‍යන්තර මෙහෙයුම් අවදානම්

1. **මානව සම්පත් හිඟතාවය:**
   විදේශ රැකියා සඳහා හෝ වෙනත් විදේශ රටවලට සංක්‍රමණය වීම සඳහා නිලධාරීන් රැකියාවලින් ඉවත්වීමේ වර්තමාන ප්‍රවණතාවය හේතුවෙන් අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්ය සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවදානමක් ඇතිව තිබේ. මෙයට පිළියමක් ලෙස, අදාළ කාර්යයන් නිසි කලට ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රමෝපායික ආකාරයෙන් අවශ්‍ය බඳවා ගැනීම් සැලසුම් කිරීම අවශ්‍ය කෙරේ.

2. **මූල්‍යමය පරායත්ත බව:**
   මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලබන අරමුදල් මත රඳා පැවතීම හේතුවෙන් සිය සංවර්ධන හා පරිපාලන කාර්යයන් දියත් කිරීමේ දී අපනයන සංවර්ධන මණ්ඩලය මූල්‍ය අවදානම්වලට මුහුණ දෙනු ලැබේ. අරමුදල් මූලාශ්‍ර විවිධාංගිකරණය කරගැනීම උදෙසා පුද්ගලික අංශය, විභව්‍ය අරමුදල් ප්‍රදානකරුවන් සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගීතාවයන් වර්ධනය කරගැනීම මඟින් මෙම අවදානම මඟහරවා ගත හැකි ය.

අපනයන කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධ අවදානම්

1. **වෙළඳපොළ අවදානම:**
   ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන්, භූ-දේශපාලනික පීඩනය සහ විචලනය වන්නා වූ පාරිභෝගික රුචිකත්වයන් ශ්‍රී ලංකාවේ අපනයනවල ඉල්ලුම කෙරෙහි බලපෑ හැකි ය. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම වෙළඳපොළ ප්‍රවණතා සමීප ආකාරයෙන් අධීක්ෂණය කිරීම, අපනයන වෙළඳපොළවල් විවිධාංගිකරණය කිරීම, සහ මෙම අවදානම මඟ හැරවීම සඳහා වෙළඳපොළ සම්බන්ධයෙන් වටිනාකමක් ඇති තොරතුරු වැඩිකරගැනීම සිදුකරනු ලැබේ.

2. **වෙළඳ ප්‍රතිපත්තිවල අවදානම:**
   තීරු බදු සහ තීරු බදු නොවන බාධක ඇතුළුව වෙළඳ ප්‍රතිපත්ති හා රෙගුලාසිවල සිදුවන වෙනස්වීම් අපනයන තරඟකාරිත්වය කෙරෙහි බලපෑ හැකි ය. මෙම විභව්‍ය සෘණාත්මක බලපෑම් මඟහරවා ගැනීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීම, දැනුවත් කිරීමේ මෙහෙයුම් සිදුකිරීම සහ ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැපයීම යන කාර්යය අපනයන සංවර්ධනය මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ.

3. **සැපයුම් දාම අවදානම්:**
   අමුද්‍රව්‍යවල හිඟතාවය, ප්‍රවාහන අවහිරතා හා භූ-දේශපාලනික ගැටලු ඇතුළුව සැපයුම් දාමවල ඇතිවන බාධා අපනයන නිෂ්පාදනය හා බෙදාහැරීම කෙරෙහි බලපානු ලැබිය හැකි ය. සැපයුම් දාම අවදානම් මඟ හරවා ගැනීම සඳහා සැපයුම් මූලාශ්‍ර විවිධාංගිකරණය කරගැනීම, කාර්ය සැපයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරගැනීම සහ ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය අපනයනකරුවන් සමඟ කටයුතු කරනු ලැබේ.

4. මූල්‍ය අවදානම:

විනිමය අනුපාතික, පොලී අනුපාතිකවල විචලනයන් සහ ණය අවදානම්, අපනයනකරුවන්ගේ මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි බලපානු ලැබිය හැකිය. මූල්‍ය අවදානම් මඟ හරවා ගැනීම සඳහා උපදේශන සේවා සැපයීම, හෙජිං යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම, සහ මූල්‍ය අරමුදල් වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සැපයීම, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ.

5. අනුකූලතා අවදානම්:

තත්ත්ව පාලන ප්‍රමිතීන්, පාරිසරික රෙගුලාසි, සහ කම්කරු නීති ඇතුළුව නියාමන අවශ්‍යතා සමඟ අනුකූල නොවීම ඔස්සේ කීර්තිනාමයට හානිවීම සහ නෛතික ගැටලු පැන නැඟීම සිදුවිය හැකි ය. අනුකූලතා අවදානම් මඟ හරවා ගැනීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ලබාදීම, විගණන සිදුකිරීම, සහ යහපත් පරිචයන් ප්‍රවර්ධනය කිරීම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදු කෙරේ.

6. තාක්ෂණික අවදානම:

තාක්ෂණයේ සීඝ්‍ර වැඩිදියුණුවීම් සහ ඩිජිටල් අවහිරතා ශ්‍රී ලංකාවේ අපනයනවල තරඟකාරිත්වය කෙරෙහි බලපෑ හැකි ය. තාක්ෂණික අවදානම් මඟහරවා ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තාක්ෂණික අනුගතවීම් ප්‍රවර්ධනය, ඩිජිටල් පුහුණු වැඩසටහන් ලබාදීම සහ තාක්ෂණික විසඳුම් සඳහා ප්‍රවේශවීමට පහසුකම් සැලසීම සිදුකෙරේ.

7. ස්වභාවික ආපදා අවදානම:

ගං වතුර සහ නියං තත්ත්වයන් ඇතුළු ස්වාභාවික ආපදාවලට ශ්‍රී ලංකාව ගොදුරුවීමේ අවදානමක් පවතින අතර එමඟින් අපනයන ක්‍රියාකාරකම්වලට බාධා ඇති වේ. ස්වභාවික අවදානම් මඟහරවා ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අදාළ නියෝජිතායතන සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම, ආපදා තත්ත්වයන් සඳහා පෙර සූදානම්වීමේ සැලසුම් සකස් කිරීම සහ එවැනි බලපෑම්වලට ලක්වූ අපනයනකරුවන් සඳහා සහාය ලබාදීම සිදුකෙරේ.

8. දේශපාලනික අවදානම:

දේශපාලනික අස්ථාවරබව, නියාමන කාර්යයන්ගේ වෙනස්වීම් සහ වෙළඳ ආරවුල් අපනයන මෙහෙයුම් කෙරෙහි බලපෑ හැකි ය. දේශපාලනික අවදානම් කළමනාකරණය කරගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දේශපාලනික ප්‍රවණතා අධීක්ෂණය කිරීම, අවදානම් තක්සේරු ලබාදීම සහ අපනයනකරුවන් වෙත සහාය ලබාදීම සිදු කෙරේ.

මෙම අවදානම් මධ්‍යයේ වුව ද, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා සහාය ලබාදීමට කැපවී සිටින අතර අවදානම් මඟ හැරවීම සහ තිරසර අපනයන සංවර්ධනයක් සඳහා පවතින අවස්ථා ලබාගැනීම සඳහා වන ප්‍රගාමී පියවර ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කෙරේ.

මූල්‍ය වාර්තාව / 2014 සිට 2023 දක්වා මූල්‍ය කටයුතුවල සුවිශේෂී කරුණු

1979 අංක 40 දරන පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර පවත්වා ගෙන යන ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන්, විනිවිදබව සහ වගවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කැපවීම අඛණ්ඩව පවතී. අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය අංශය විසින් කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ කරුණු සාකච්ඡා කර මූල්‍ය කළමනාකරණ කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRS) සමඟ අනුකූලවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS සහ LKASs) ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම, හිමිකම් වෙනස්වීම, මුදල් ප්‍රවාහ, සහ සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ඉතා සුපරික්ෂාකාරී අයුරින් පිළියෙල කර තිබේ. අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තොරතුරුවල සංගතබව සහ සංසන්දනාත්මක බව මෙම ප්‍රමිත මගින් සහතික කෙරෙන අතර එමඟින් එහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලැබේ.

අදාළ සටහන් යටතේ සාධාරණ අගය සම්බන්ධයෙන් අනාවරණය කිරීම් යෝග්‍ය වේයැයි හැඟෙන අවස්ථාවලදී හැර අපනයන සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ඓතිහාසික පිරිවැය පදනමට අනුගත වේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ පැහැදිලිබව වැඩිදියුණු කරමින්, වත්කම් සහ වගකීම් ඒවායේ ස්වභාවය අනුව සහ ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවයේ අනුපිළිවෙල අනුව වර්ගීකරණය කෙරේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නව ප්‍රමිතීන්, සංශෝධන සහ දැනට පවතින ප්‍රමිත සඳහා අර්ථ නිරූපණ ප්‍රකාශයට පත්කරන අතර, මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඒවායේ බලපෑම තක්සේරු කර නොමැත. එසේ වුව ද, බලාත්මක වීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන සඳහා අදාළ වේ යැයි අපේක්ෂා කරන මෙම ප්‍රමිතීන්, අර්ථ නිරූපණ සහ සංශෝධන ක්‍රියාවට නැංවීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටියි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකාරිත්වය විසින් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කරන බව සඳහන් කිරීම වැදගත් වි. මෙම සාධක සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාවය හේතුවෙන් අනාගතයේ දී වත්කම් හා වගකීම්වල ධාරණ අගය සඳහා ගැලපුම් කිරීමේ විභවයක් ඇති වේ. මූල්‍ය වාර්තාකරණය ඔස්සේ මණ්ඩලයේ තත්‍ය මූල්‍ය තත්ත්වය පිළිබිඹුවන බව සහතික කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය එහි ප්‍රවේශය සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරීව සිටියි.

2014 සිට 2023 දක්වා මූල්‍ය කටයුතුවල සුවිශේෂී කරුණු

රු.මි.

ආදායම්

අයිතමය	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
භාණ්ඩාගාර අරමුදල්	518.0	462.8	364.5	352.6	529.9	466.9	343.9	489.2	351.5	363.8
සංවර්ධන කටයුතු සඳහා අපනයනකරුවන්ගේ දායකත්වය	68.6	84.0	64.9	60.0	57.4	89.3	45.4	21.5	119.0	233.5
GIZ ආයතනයෙන් සංවර්ධන කටයුතු සඳහා අරමුදල්	-	-	-	-	-	-	-	-	-	8.1
ලාභාංශ ආදායම	38.0	54.1	42.9	60.2	40.2	34.8	38.6	40.3	90.7	58.2
අනෙකුත් ආදායම්	32.7	22.8	50.0	31.9	20.8	22.6	12.5	19.2	18.9	50.8
මුළු ආදායම	**657.2**	**623.6**	**522.2**	**504.6**	**648.2**	**613.6**	**440.4**	**570.3**	**580.0**	**714.4**

රු.මි.

වියදම්

අයිතමය	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
පුනරාවර්තන වියදම්	334.3	361.3	338.9	373.8	400.6	402.3	370.5	372.7	357.0	400.3
ප්‍රාග්ධන/ සංවර්ධන වියදම්	300.3	245.6	208.0	227.4	255.8	199.8	66.7	109.7	145.8	317.9
මුළු වියදම	**634.6**	**606.9**	**546.9**	**601.1**	**656.5**	**602.2**	**437.2**	**482.4**	**502.8**	**718.2**

රු.මි.

විස්තීර්ණ ආදායම

අයිතමය	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
ආදායම	657.2	623.6	522.2	504.6	648.2	613.6	440.4	570.3	580.0	714.4
වියදම (පුනරාවර්තන/ සංවර්ධන)	634.6	606.9	546.9	601.1	656.5	602.2	437.2	482.4	502.8	718.2
හානිය (impairment) සඳහා වෙන් කිරීම්	-	-	-	-	-	-	-	(0.4)	(137.4)	2.6
ඌනතාව/ අතිරික්තය	**22.6**	**16.7**	**(24.7)**	**(96.5)**	**(8.2)**	**11.4**	**3.2**	**88.3**	**214.7**	**(6.4)**
මූල්‍ය නොවන ගනුදෙනු										
ආශ්‍රිත සමාගම්වල ලාභය/ අලාභයේ කොටස	83.1	53.4	70.5	76.2	(91.2)	55.3	70.8	123.4	4.2	90.2
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-	-	-	-	-	-	95.5	(6.1)
මුළු විස්තීර්ණ ආදායම	**105.8**	**70.1**	**45.8**	**(20.3)**	**(99.4)**	**66.7**	**74.0**	**211.7**	**314.4**	**77.7**

මූල්‍ය තත්ත්වය

රු.මි.

අයිතමය	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
වත්කම්										
ජංගම නොවන වත්කම්	993.3	1,062.4	1,124.0	1,189.2	1,106.1	1,142.1	1,206.3	1,334.7	1,555.3	1,634.6
ජංගම වත්කම්	238.7	269.0	215.5	194.1	206.1	191.7	182.8	115.9	175.5	275.1
මුළු වත්කම්	**1,232.0**	**1,331.4**	**1,339.5**	**1,383.3**	**1,312.2**	**1,333.8**	**1,389.0**	**1,450.7**	**1,730.8**	**1,909.7**
හිමිකම් සහ වගකීම්										
හිමිකම්වල දායකත්වය	10.0	10.0	10.0	10.0	10.0	10.0	10.0	10.0	10.0	10.0
වියදමට එරෙහිව සමුච්චිත ආදායම	1,026.3	1,092.3	1,114.2	1,093.3	1,010.8	1,064.9	1,138.7	1,241.8	1,554.4	1,632.0
මුළු හිමිකම්	**1,036.3**	**1,102.3**	**1,124.2**	**1,103.3**	**1,020.8**	**1,074.9**	**1,148.7**	**1,251.8**	**1,564.4**	**1,642.0**
ලැබී ඇති ප්‍රදානයන්										
රජයේ ප්‍රදාන	13.2	38.8	44.3	49.7	54.4	56.1	60.5	62.8	65.0	78.7
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	(3.9)	(7.2)	(11.4)	(16.7)	(22.7)	(29.5)	(36.5)	(43.9)	(50.0)	(56.4)
	9.4	**31.6**	**33.0**	**33.0**	**31.7**	**26.6**	**23.9**	**18.9**	**14.9**	**22.3**
ජංගම නොවන වගකීම්										
ප්‍රතිපාදන සහ අනෙකුත් වගකීම්	26.5	29.2	30.5	19.4	52.4	57.4	22.7	37.1	58.4	175.4
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	84.4	93.2	88.1	90.0	79.0	75.4	77.3	68.2	27.8	34.0
අනෙකුත් ගෙවිය යුතු	75.5	75.1	63.8	137.5	128.3	99.4	116.4	74.7	65.4	36.0
මුළු ජංගම නොවන වගකීම්	**186.4**	**197.5**	**182.3**	**246.9**	**259.7**	**232.3**	**216.4**	**179.9**	**151.5**	**245.4**
මුළු හිමිකම් සහ වගකීම්	**1,232.0**	**1,331.4**	**1,339.5**	**1,383.3**	**1,312.2**	**1,333.8**	**1,389.0**	**1,450.7**	**1,730.8**	**1,909.7**

1 -11

අපනයන කාර්යසාධනය

2023

1. අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය - 2023 ජනවාරි - දෙසැම්බර්

ශ්‍රී ලංකා රේගුව වෙතින් ලබාගත් දත්තවලට අනුව, 2022 වර්ෂයේ අනුරූප කාල සීමාවට සාපේක්ෂව 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය ඇ.ඩො.මිලියන 11,910.7ක් දක්වා 9.12% කින් පහළ ගොස් තිබේ. වෙළඳ භාණ්ඩ අපනයනවල පහළ යෑමට හේතුවී ඇත්තේ විශේෂයෙන් ඇඟළුම් සහ රෙදිපිළි, රබර් හා රබර් පදනම් කරගත් නිෂ්පාදන සහ පොල් හා පොල් පදනම් කරගත් නිෂ්පාදන වැනි ක්ෂේත්‍රවල අපනයන නිෂ්පාදිත සඳහා ප්‍රධාන වශයෙන්ම යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපද වෙළඳපොළ තුළ අඩු වී ඇති ඉල්ලුම, නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම ආදී වශයෙන් වූ බාහිර සහ අභ්‍යන්තර සාධකවල බලපෑම යි.

වෙළඳ භාණ්ඩ අපනයනවලින් ඇ.ඩො. බිලියන 11.91ක් සහ සේවා අංශයේ අපනයනවලින් ඇ.ඩො. බිලියන 3.19ක් ඇතුළත් ඇ.ඩො. බිලියන 15.1ක් 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලසීමාව සඳහා සමස්ත අපනයන ඉපැයුම් වශයෙන් වාර්තා වී තිබේ. 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාවට වාර්තාවී ඇති අගයට සාපේක්ෂව මෙය 0.74% ක වැඩිවීමකි.



1.1 2023 වර්ෂය තුළ දී ශ්‍රී ලංකාවේ අපනයනවල සංයුතිය



1.2 2020-2023 දක්වා කාලසීමාව තුළ වෙළඳ අපනයනයන් මාසික වශයෙන්



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

1.3 2022 සහ 2023 වර්ෂවල දී ක්ෂේත්‍ර වශයෙන් සැලකූවිට අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය

නිෂ්පාදිතය	2022 වර්ෂය තුළ අපනයන (ඇ.ඩො.මිලියන වලින්)	2023 වර්ෂය තුළ අපනයන (ඇ.ඩො.මිලියන වලින්)	% වශයෙන් වර්ධනය
ඇඟළුම් සහ රෙදිපිළි	5,933.52	4,864.53	-18.02
තේ	1,258.81	1,309.90	4.06
රබර් සහ රබර් නිෂ්පාදිත	1,018.40	930.24	-8.66
පොල් සහ පොල් නිෂ්පාදිත	817.09	708.70	-13.27
දියමන්ති, මැණික් සහ ස්වර්ණාභරණ	399.77	388.16	-2.90
විදුලි සහ ඉලෙක්ට්‍රොනික් සංරචක	483.65	486.66	0.62
කුළුබඩු සහ සගන්ධ තෙල්	370.30	397.78	7.42
ආහාර සහ පාන වර්ග	426.39	427.97	0.37
මුහුදු ආහාර	269.02	262.24	-2.52
විසිතුරු මත්ස්‍යයින්	21.74	26.38	21.34
එළවළු	27.80	29.19	5.00
පලතුරු සහ ඇට වර්ග	38.78	43.26	11.55
අනෙකුත් අපනයන භෝග	92.42	91.30	-1.21
මල් සහ පත්‍ර	14.66	15.01	2.39
බෝට්ටු සෑදීම	17.40	78.50	351.15
පෙට්රෝලියම් නිෂ්පාදිත	283.23	372.04	31.36
අනෙකුත් වෙළඳ අපනයනයන්	1,633.42	1,478.84	-9.46
සමස්ත වෙළඳ අපනයන	**13,106.40**	**11,910.70**	**-9.12**
තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම කළමනාකරණය	1,112.4	1,226.87	10.29
ඉදිකිරීම් කටයුතු	9.1	354.80	3,819.6 3
මූල්‍ය සේවා	91.7	64.00	-30.24
ප්‍රවාහන සහ සැපයුම්දාම කළමනාකරණය	675.8	1,549.69	129.29
සමස්ත සේවා අපනයන	**1,889.0**	**3,195.36**	**69.15**
සමස්ත භාණ්ඩ සහ සේවා අපනයන	**14,995.4**	**15,106.06**	**0.74**

1.4 2023 වර්ෂය තුළ සේවා අංශයේ අපනයන

2022 වර්ෂයේ අනුයාත කාල සීමාවට සාපේක්ෂව 69.15% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ සේවා අපනයනවල වටිනාකම ඇ.ඩො. මිලියන 3,195.36ක් විය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇස්තමේන්තු කළ සේවා අපනයනවලට තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම කළමනාකරණය, ඉදිකිරීම් කටයුතු, මූල්‍ය සේවා, ප්‍රවාහන සහ සැපයුම්දාම කළමනාකරණය ඇතුළත් විය.

1.5 ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන ගමනාන්ත 15

2022 සහ 2023 වර්ෂවල ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන ගමනාන්ත 15 වෙත සිදුකරන ලද අපනයනයන්ගේ සංසන්දනයක් පහත වගුවේ දැක්වෙන අතර වෙළඳ භාණ්ඩ අපනයනවලින් ආසන්න වශයෙන් 70% ක්ම මෙම අපනයන වෙළඳපොළවල් 15 වෙත කේන්ද්‍රගතවී පවතී.

ඉහළතම අපනයන වෙළඳපොළවල් 10 අතුරින්, ඉතාලිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ප්‍රංශය තුළ 2023 වර්ෂයේ තුළ දී පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කර ඇත.

2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වෙළඳ අපනයනවලින් 23%ක් ලබාගනිමින් ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අපනයන ගමනාන්තය වශයෙන් පවතී. එක් එක් රට වශයෙන් සැලකූවිට, ශ්‍රී ලංකාවේ අපනයන සඳහා විශාලතම අපනයන වෙළඳපොළ වශයෙන් පවතින ඇමරිකා එක්සත් ජනපදය වෙත සිදුකරන අපනයන සැලකීමේ දී, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළ දී අපනයනවල වටිනාකම ඇ.ඩො.මිලියන 2,758.57ක් දක්වා 16.91% කින් අඩුවී තිබේ. මෙරට ඇති වූ ආර්ථික පසුබැස්ම හේතුවෙන් ශ්‍රී ලංකාවෙන් අපනයන කළ ඇඟළුම්, රබර් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම අඩුවීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන ගමනාන්ත 15

	රට	**2022** අපනයන (ඇ.ඩො. මිලියන)	**2023** අපනයන (ඇ.ඩො. මිලියන)	**%** වශයෙන් වර්ධනය **(22-23)**	**2023** වර්ෂයේ දී සමස්ත අපනයනවල පංගුවක් වශයෙන් **(%)**
1	ඇමරිකා එක්සත් ජනපදය	3,319.85	2,758.57	-16.91	23.16
2	එක්සත් රාජධානිය	966.04	846.16	-12.41	7.10
3	ඉන්දියාව	854.88	829.70	-2.95	6.97
4	ජර්මනිය	744.57	587.40	-21.11	4.93
5	ඉතාලිය	640.18	679.05	6.07	5.70
6	නෙදර්ලන්තය	428.27	343.47	-19.80	2.88
7	කැනඩාව	361.44	293.21	-18.88	2.46
8	එක්සත් අරාබි එමීර් රාජ්‍යය	345.82	357.09	3.26	3.00
9	බෙල්ජියම	307.68	221.45	-28.03	1.86
10	ප්‍රංශය	257.52	304.95	18.42	2.56
11	ඕස්ට්‍රේලියාව	254.40	226.51	-10.96	1.90
12	චීනය	253.11	257.73	1.83	2.16
13	ජපානය	226.30	188.76	-16.59	1.58
14	බංග්ලාදේශය	217.54	173.87	-20.07	1.46
15	මෙක්සිකෝව	190.30	182.77	-3.96	1.53
	අනෙකුත් රටවල්	3,738.50	3,660.01	-2.10	30.73
	එකතුව	**13,106.40**	**11,910.70**	**-9.12**	**100.00**

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

1.6 නිදහස් වෙළඳ ගිවිසුම්වල (FTA) පාර්ශවකරුවන් වෙත සිදුකළ අපනයන (ඉන්දියාව සහ පකිස්තානය)

සමස්ත වෙළඳ භාණ්ඩ අපනයනවලින් 7.2% ක අගයක් සහිත ඉන්දියාව සහ පකිස්තානය වෙත සිදුකළ අපනයන, පෙර වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී 3.21% කින් ඇ.ඩො.මිලියන 904.39 ක් දක්වා පහළ ගොස් තිබේ. පෙර වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළ දී ඉන්දියාවට සහ පකිස්තානයට සිදුකළ අපනයනයන් පිළිවෙලින් 2.95% කින් සහ 6.06% කින් පහළ ගොස් ඇත. ඉන්දියාවට සිදුකරන අපනයනවල සෘණාත්මක ක්‍රියාකාරිත්වය කෙරෙහි සත්ත්ව ආහාර අඩුවෙන් අපනයන කිරීම (12.92%) හේතුවී තිබෙන අතර, පකිස්තානයට සිදුකරන අපනයනවල සෘණාත්මක ක්‍රියාකාරිත්වය කෙරෙහි ෂීට් රබර් සහ අනෙකුත් වටිනා ගල් වර්ග අඩුවෙන් අපනයන කිරීම හේතුවී තිබේ.

1.7 ශ්‍රී ලංකාවෙන් සිදුකරන අපනයනවලට අදාළ විදේශීය අපනයන කලාපයන්

අනුයාත පූර්ව වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී එක් එක් අපනයන කලාප වෙත සිදුකරන ලද අපනයනවල සංසන්දනයක් පහත වගුවේ දැක්වේ.

කලාපය	අපනයන 2022 (ඇ.ඩො.මිලියන)	අපනයන 2023 (ඇ.ඩො.මිලියන)	% වශයෙන් වර්ධනය (22-23)	අපනයන පංගුව (%) 2023
ඇමරිකා එක්සත් ජනපදය	3,319.85	2,758.57	-16.91	23.16
එක්සත් රාජධානිය හැර යුරෝපා සංගමය	3,038.59	2,711.93	-10.75	22.77
දකුණු ආසියාව	1,261.36	1,192.75	-5.44	10.01
මැද පෙරදිග රටවල් (සයිප්‍රසය සහ ඊජිප්තුව හැර)	998.34	995.00	-0.33	8.35
ආසියානු සංවිධානය	374.13	327.95	-12.34	2.75
අප්‍රිකානු රටවල්	301.91	324.79	7.58	2.73
පොදු රාජ්‍ය මණ්ඩලයේ ස්වාධීන රාජ්‍යයන් (CIS Countries)	248.85	239.87	-3.61	2.01
ssඅනෙකුත් රටවල්	3,563.37	3359.84	-5.71	28.21
වෙළඳ භාණ්ඩ අපනයනවල සමස්ත එකතුව	**13,106.40**	**11,910.70**	**-9.12**	**100.00**

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකාවේ සමස්ත වෙළඳ භාණ්ඩ අපනයනවලින් 24% ක් වූ යුරෝපා සංගමය වෙත සිදුකළ අපනයන සැලකූ විට, පෙර වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 10.75% ක් දක්වා ඇ.ඩො. මිලියන 2,711.93කින් අඩුවී ඇත.

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී, යුරෝපා සංගමයේ ප්‍රධාන වෙළඳපොළවල් පහ වෙත සිදුකළ අපනයන මෙසේ වාර්තා වේ: ඉතාලිය ඇ.ඩො. මිලියන 679.05 (6.07% කින් ඉහළ ගොස් තිබේ), ජර්මනිය ඇ.ඩො. මිලියන 587.4 (21.11% කින් පහළ ගොස් තිබේ), නෙදර්ලන්තය ඇ.ඩො. මිලියන 343.47 (19.8% කින් පහළ ගොස් තිබේ), ප්‍රංශය ඇ.ඩො. මිලියන 304.95 (18.42% කින් ඉහළ ගොස් තිබේ), සහ බෙල්ජියම ඇ.ඩො. මිලියන 221.45 (28.03% කින් පහළ ගොස් තිබේ).

පෙර වර්ෂයේ අනුරූප කාල සීමාවට සාපේක්ෂව 2023 වර්ෂයේ දී යුරෝපා සංගමයේ ප්‍රධාන වෙළඳපොළවල් පහ වෙත සිදුකළ අපනයන පහළ බැසීමට හේතුවී ඇත්තේ ආර්ථික තත්ත්වයන්, ඉල්ලුමේ විචලනයන්, වෙළඳ ප්‍රතිපත්ති, විදේශීය බලපෑම්, පාරිභෝගික රුචිකත්වයන්ගේ වෙනස්වීම් සහ සැපයුම්දාමවල අවහිරතා වේ.

2. 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

2.1 වෙළඳපොළ සංවර්ධනය සහ සන්නාමකරණය

2.1.1 වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය - ජාත්‍යන්තර

- **ඩුබායිහි දී පැවති GULFOOD 2023 ප්‍රදර්ශනය**

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, ඩුබායි නගරයේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ දී 2023 පෙබරවාරි 20-24 දක්වා පැවති GULFOOD 2023 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කරන ලදී. GULFOOD යනු ගෝලීය වශයෙන් සංවිධානය කරන විශාලතම ආහාර සහ පානවර්ග ප්‍රදර්ශනවලින් එකක් වන අතර ප්‍රදර්ශකයන් 5,000ක් පමණ සහ රටවල් 200කට වැඩි සංඛ්‍යාවකින් 100,000කට අධික අමුත්තන් පිරිසක් මීට සම්බන්ධ කෙරේ.

GULFOOD 2023 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වයේ අරමුණ වනුයේ ප්‍රධාන වශයෙන් මැද පෙරදිග, අප්‍රිකානු සහ දකුණු ආසියානු කලාපයට (MEASA) ශ්‍රී ලාංකික ආහාර සහ පානවර්ග ප්‍රදර්ශනය සහ ප්‍රවර්ධනය කිරීමයි. ආහාර සහ පාන වර්ග, පොල් නිෂ්පාදන, කුළුබඩු සහ පලතුරු සහ එළවළු වර්ග ප්‍රදර්ශනය කරමින් සමාගම් 28ක් (සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 9 දෙනෙකු සහ ලංකා එළවළු සහ පලතුරු නිෂ්පාදකයන්ගේ, සැකසුම්කරුවන්ගේ සහ අපනයනකරුවන්ගේ සංගමය ද ඇතුළුව) මෙම ප්‍රදර්ශනය සඳහා සාර්ථක අයුරින් සහභාගී වන ලදී.

මේ දක්වා ක්‍රියාත්මක වී ඇති ඇණවුම්වල වටිනාකම ඇ.ඩො.මිලියන 6.5ක් පමණ වන අතර දැනට සාකච්ඡා මට්ටමේ පවතින ඇණවුම්වල වටිනාකම ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 8.5කි.

මීට අමතරව, මේ සඳහා සහභාගී වූ ඇතැම් සමාගම්වලට Carefore, LuLu, Wetzone Eg-Gourmet Goodness, Plant base, Earth Essence සහ Tropikal වැනි සුපිරි වෙළඳසැල්වලට සිය සන්නාම හඳුන්වාදීමට ද හැකි විය.

ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් විසින් ඉදිරිපත් කළ ශාකමය/ ස්වාභාවික නිෂ්පාදන සඳහා ගැනුම්කරුවන් උනන්දුවක් දක්වන ලදී. නිදසුන් වශයෙන් ශාකමය ද්‍රව්‍යවලින් සකස්කළ පැටිස් වර්ගය, පානයක් වශයෙන් පොල්කිරි, පලතුරු යුෂ, පොල් ජෑම්, පොලොස් මීට අයත්වන අතර නව වෙළඳපොළ අවස්ථා ග්‍රහණය කරගැනීමට, නව ඇසුරුම් ප්‍රවණතාවයන් පිළිබඳ දැනුම වැඩිදියුණු කරගැනීමට සහ දැනට සිටින ගැනුම්කරුවන් සමඟ සබඳතා ශක්තිමත් කරගැනීමට බහුතරයක් වූ සහභාගිකයන්ට හැකි විය.

- **ජර්මනියේ පැවති Biofach 2023 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය**

දශක දෙකකට අධික කාලයක් මුළුල්ලේ ජාත්‍යන්තර කාබනික ආහාර වෙළඳපොළ සඳහා විශ්වසනීය සහ ඉහළ ගුණාත්මක තත්ත්වයේ භාණ්ඩ සැපයුම්කරුවෙකු වශයෙන් පවතින ඉහළ ශක්‍යතාවය ප්‍රදර්ශනය කරමින් ශ්‍රී ලංකාව විසින් කාබනික වශයෙන් සහතික කළ කෘෂි නිෂ්පාදන රාශියක් අපනයන කරනු ලබන අතර පාරිභෝගිකයන් තුළ සුවිශේෂී පිළිගැනීමක් පවත්වා ගැනීම ද සිදුකරනු ලැබේ.

මෙම ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවට හිමි විශිෂ්ට ස්ථානය වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයන් අඛණ්ඩව සිදුකරමින්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජර්මනියේ ආනයන ප්‍රවර්ධන කවුළුව (IPD) සමඟ එක්ව, ජර්මනියේ නියුරෙම්බර්ග් 2023 පෙබරවාරි 14 සිට 17 වැනි දක්වා පැවති ලොව ප්‍රධානතම වෙළඳ ප්‍රදර්ශනයක් වන BIOFACH 2023 සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් 13 ක (සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 7ක් ද ඇතුළුව) සහභාගිත්වය සඳහා සහාය ලබාදෙන ලදී. නව සුළු හා මධ්‍ය පරිමාණ අපනයන ව්‍යවසායන් හතරක් ද පළමු වරට මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගී විය.

මීට සමගාමීව, සමාගම් දෙකකට ව්‍යාපාරික හමු (B2B meetings) සඳහා සහභාගීවීමේ අවස්ථාවට පහසුකම් සැලසීම ද සිදුකරන ලදී. ශ්‍රී ලංකාව සඳහා හිමිවූ ප්‍රදර්ශන ස්ථානය තුළ කුළුබඩු, පොල් ආශ්‍රිත නිෂ්පාදන, තේ, නැවුම් පළතුරු සහ එළවළු, පාන වර්ග, ශාකසාර නිෂ්පාදන සහ වියළි පලතුරු වැනි සහතිකලත් කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී. ප්‍රදර්ශනය තුළ ව්‍යාපාරික රැස්වීම් 412කට අධික සංඛ්‍යාවක් පවත්වන ලදී.

ඇ.ඩො. මිලියන 2.8ක අගයකින් යුතු තහවුරු කරන ලද ව්‍යාපාරික ඇණවුම් ලැබී ඇති අතර දැනට සාකච්ඡා මට්ටමේ පවතින ව්‍යාපාරික ඇණවුම්වල වටිනාකම ඇ.ඩො. මිලියන 5.6ක් පමණ වේ. අගෝස්තු දක්වා ක්‍රියාත්මක වී ඇති ඇණවුම්වල වටිනාකම ඇ.ඩො. මිලියන 0.185කි.

තවද, කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වූ අන්තර්ජාතික වෙළඳපොළ පිළිබඳ දැනුවත්භාවයක් ලබාගැනීමට හැකිවන පරිද්දෙන් GIZ සමඟ සහයෝගිතාවයෙන් කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන, නිෂ්පාදනය කිරීමේ නියැලෙන සුළු හා මධ්‍ය පරිමාණ සමාගම් 7ක් සඳහා BIOFACH ප්‍රදර්ශනය අතරතුර අධ්‍යයන දූත මෙහෙයක් සහ ජර්මනිය සහ නෙදර්ලන්තය වෙත ප්‍රදර්ශනයෙන් අනතුරුව අධ්‍යයන දූත මෙහෙයක් 2023 පෙබරවාරි 14 සිට 24 දක්වා කාල සීමාව තුළ සංවිධානය කරන ලදී. සහභාගිකයන්ට යුරෝපා සංගමයේ සමාගම් සමඟ සෘජු සම්බන්ධතා ගොඩනංවා ගැනීමට සහ අගය

එකතු කළ නිෂ්පාදන සමඟින් ජර්මනියේ වෙළඳපොළට ඇතුළුවීම සඳහා වූ ඇසුරුම් අවශ්‍යතා, සහතිකකරණය සහ අනෙකුත් වෙළඳපොළ ප්‍රවේශ අවශ්‍යතා සම්බන්ධයෙන් සිය ධාරිතාවයන් වැඩිදියුණු කරගැනීමට අවස්ථාවක් මෙමඟින් උදාවිය.

දැනට, ශ්‍රී ලංකාවේ මෙම සමාගම් 7 අතුරින් සමාගම් 4ක් යුරෝපා සංගමයේ ගැනුම්කරුවන් සමඟ සාකච්ඡා සිදුකරමින් පවතී.

- **ජපානයේ පැවති තොරතුරු තාක්ෂණ සතිය (IT Week)**

ඔසාකාවේ, ඉන්ටෙක්ස්හි පැවති Japan IT Week 2023 ප්‍රදර්ශනය සහ 2023 ජනවාරි 18 සිට 20 දක්වා පැවති ව්‍යාපාරික රැස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් 8ක සහභාගිත්වය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.
මෙම අවස්ථාවට පෙර, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දූත පිරිස සඳහා වෙළඳපොළ දැනුම හුවමාරු කරගැනීම පිළිබඳ සැසියක් පවත්වන ලද අතර, ටෝකියෝහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ටෝකියෝ සහ ඔසාකාහිදී 2023 ජනවාරි මස 16 වැනි දින ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් අදාළ Business match-making meetings ලෙස හැඳින්වෙන රැස්වීම් සඳහා පහසුකම් සලස්වන ලදී. ටෝකියෝ B2B රැස්වීම් ටෝකියෝ නගරයේ මිනාටෝ-කියුහි ෂිත් ඔපන් ලැබ් ස්ථානයේ දී පැවති අතර, ආසන්න වශයෙන් B2B රැස්වීම් 50ක් ආවරණය කරමින් ජපාන සමාගම් 30ක් පමණ මීට සහභාගි විය.
මෙම B2B රැස්වීම් අවස්ථාවන්හි දී, ව්‍යාපාරික රැස්වීම් 101ක් සාර්ථකව සංවිධානය කරන ලදී.
මීට අමතරව, ශ්‍රී ලාංකික සමාගම් 8ක් සඳහා එවැනි ආකාරයේම Business match-making meetings ලෙස හැඳින්වෙන රැස්වීම් 2023 ජනවාරි 18 වැනි දින ඔසාකාහි පිහිටි කොන්සියුලර් කාර්යාලය විසින් ඔසාකා වාණිජ මණ්ඩලයේ සහයෝගිතාවයෙන් සංවිධානය කරන ලදී. මේ දක්වා ක්‍රියාත්මක වී ඇති ඇණවුම්වල වටිනාකම ඇ.ඩො. 20,000ක් පමණ වන අතර දැනට සාකච්ඡා මට්ටමේ පවතින ඇණවුම්වල වටිනාකම ඇ.ඩො. 450,000 ක් පමණ වේ.

ජපානය වෙත Cloud based POS, Smart Grid Middleware, Health Care system, API Monetizer & API Aggregator, සේවා පරිවර්තන විසඳුම්, ජංගම දුරකතන යෙදුම් සහ පරිගණක ක්‍රීඩා වැනි නව නිෂ්පාදන/ මෘදුකාංග යෙදුම් හඳුන්වාදීමට සහභාගිකයන්ට හැකි විය.

- **ලක්සම්බර්ග් පැවති ICT Spring**

2023 ජුනි 26 සිට ජූලි 01 වැනි දින දක්වා බෙල්ජියම, ලක්සම්බර්ග් සහ ෆ්‍රැන්ක්ෆර්ට්හි පැවති ICT Spring Europe සහ ව්‍යාපාරික/ ජාලකරණ රැස්වීම් සඳහා නව අංකුර ව්‍යවසායන් තුනක් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 05ක් ඇතුළත් ශ්‍රී ලාංකික තාක්ෂණික සමාගම් 08ක සහභාගිත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු සංවිධානය කරන ලදී.
මෙම අවස්ථාවට පෙර, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එම දූත මණ්ඩලයේ සන්නිවේදන, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, අනුවර්තනය වැනි කුසලතා වැඩි දියුණු කිරීම සඳහා

යුරෝපා සංගමයේ වෙළඳපොළ තොරතුරු, ලක්සම්බර්ගි ව්‍යාපාරික සංස්කෘතිය, සාරධර්ම සහ වෙළඳපොළ වෙත ඉදිරිපත් කළ යුතු දෑ සකස්කිරීම යනාදිය සම්බන්ධයෙන් පූර්ව ප්‍රදර්ශන වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

රටවල් තුනෙහිම මීට අදාළ ප්‍රවර්ධන වැඩසටහන්/ ව්‍යාපාරික රැස්වීම් ඇතුළත් විය. 2023 ජූනි 29 -30 දක්වා ලක්සම්බර්ග්හි දී ICT Spring යුරෝපා වෙළඳ ප්‍රදර්ශනය පැවැත්විණි. එම ප්‍රදර්ශනයට පෙර, බ්‍රසල්ස්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලාංකික කණ්ඩායම වෙත බ්‍රසල්ස්හි තොරතුරු තාක්ෂණ සමාගම් සමඟ ව්‍යාපාරික රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සහභාගී වූ සමාගම් හතරක් සඳහා (Enhanzer, Huex, SLT, Arimac) ෆ්‍රැන්ක්ෆර්ට්හිදී ජර්මනියේ වාසය කරන ශ්‍රී ලාංකිකයකු සමඟ ව්‍යාපාරික රැස්වීම් සංවිධානය කරන ලදී. මෙම ප්‍රදර්ශනය අතරතුර ව්‍යාපාරික රැස්වීම් 83ක් පවත්වන ලදී. එම රැස්වීම් අතුරින්, රැස්වීම් 12ක් බ්‍රසල්ස්හි දී බෙල්ජියමේ තොරතුරු තාක්ෂණ සමාගම් 10ක් සමඟ සංවිධානය කරන ලදී. මෙරට එක් සමාගමක් විසින් ඇ.ඩො. 2,500ක පමණ වටිනාකමකින් යුතු ස්ථිරව තහවුරු කරන ලද ව්‍යාපාරික ඇණවුම් ලබාගන්නා ලදී. සමාගම් තුනකට ඇ.ඩො. 31,300ක වටිනාකමින් යුතු ඉදිරියේ දී ලැබීමට නියමිත ඇණවුම් හිමිවිය. අනෙකුත් සමාගම් විසින් ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකරගෙන යමින් පවතින අතර ඉදිරි මාස 06ක කාල සීමාව තුළ එකී කටයුතු සම්පූර්ණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ප්‍රදර්ශනය අතරතුර දී, සහභාගික සමාගම්වලට යුරෝපා වෙළඳපොළ වෙත නව නිෂ්පාදන/ මෘදුකාංග යෙදුම් හඳුන්වාදීමට හැකි විය. Immersive Technology products (AR/ VR/ simulation), Gamification (Gaming), Process Automation, ඩිජිටල් ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සඳහා Cloud ERP platform, Real-time production scheduling system, Block chain-based Carbon Registry, ඩිජිටල් බැංකුකරණ කටයුතු, Pod Cast Lister, Smart Digital Business Card, කෘත්‍රිම බුද්ධියෙන් බලගැන් වූ කොටස් වෙළඳපොළ මොඩියුල, ක්‍රියාකාරිත්ව අලෙවිකරණ කටයුතු, ව්‍යාපාරික තොරතුරු සහ දත්ත විශ්ලේෂණය, mCash Fintech platform, Telco Softwarization මීට ඇතුළත් වේ. තවද, බෙල්ජියම, ෆ්‍රැන්ක්ෆර්ට්, නෙදර්ලන්තය සහ ස්විට්සර්ලන්තය වැනි නව වෙළඳපොළවල් වෙත ප්‍රවේශවීමටද සහභාගිකයන්ට හැකිවිය.

මීට අමතරව, අදාළ පාර්ශවකරුවන් සහ එම රටවල රජයේ නිලධාරීන් සමඟ සම්බන්ධවීමේ සහ එම රටවල අංකුර ව්‍යවසායන්ගේ පරිසරය සම්බන්ධයෙන් අවබෝධ කරගැනීමේ අවස්ථාව ද සහභාගිකයන්ට හිමි විය.

තවද, මෙරට සමාගම් විසින් අලෙවිකරන නිෂ්පාදන හෝ සේවාවලට අදාළව හවුල්වීමේ කැමැත්තෙන් පසුවන ලක්සම්බර්ගි වාසය කරන ශ්‍රී ලාංකික සමාගම් හිමිකරුවන් හමුවීමේ අවස්ථාව ද සහභාගිකයන්ට හිමි විය.

- **ස්වීඩනයේ පැවති Retail Technology Expo 2023 සහ ඩෙන්මාර්ක්හි දී පැවති ව්‍යාපාරික රැස්වීම**

2023 මැයි 29 සිට ජූනි 01 දක්වා කාලසීමාව තුළ Retail Technology Expo 2023 ප්‍රදර්ශනය, ස්වීඩනයේ ගෝටෙන්බර්ග් සහ ස්ටොක්හෝම්හි දී ව්‍යාපාරික/ ජාලකරණ රැස්වීම් සහ නිකුත් කර ඇති ශ්‍රී ලංකා වාර්තාව පරිදි ඩෙන්මාර්කයේ කෝපන්හේගන් නගරයේ දී ප්‍රදර්ශන සහ ජාලකරණ රැස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ තාක්ෂණ සමාගම් 9ක් සහභාගීකරවීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු සංවිධානය කරන ලදී.

මෙම අවස්ථාවට සහභාගීවීමට පෙර, එම කණ්ඩායම වෙත ස්ටොක්හෝම්හි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලයේ සහයෝගයෙන් වෙළඳපොළ දැනුම හුවමාරු කරගැනීමේ සැසියක් සංවිධානය කරන ලදී.

එම ව්‍යාපාරික රැස්වීම් සහ ජාලකරණය සම්බන්ධ කටයුතු අතරතුර දී, කෝපන්හේගන්, ගෝතෙන්බර්ග් සහ ස්ටොක්හෝම් යන නගර ත්‍රිත්වයේ දී තානාපති කාර්යාලය විසින් ව්‍යාපාරික හමුවීම් 119ක් සංවිධානය කරන ලදී. සමාගමක් තුනක් විසින් ඇ.ඩො. මිලියන 0.741ක වටිනාකමින් යුතු ව්‍යාපාරික ඇණවුම් හිමිකර ගන්නා ලද අතර, වාර්ෂිකව ඇ.ඩො. මිලියන 1.062ක පමණ වටිනාකමින් යුතු ව්‍යාපාරික ඇණවුම් ලැබීමට ද අපේක්ෂිත ය. ඉතිරි සමාගම් විසින් ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකරගෙන යමින් පවතින අතර ඉදිරි මාස 06ක කාල සීමාව තුළ එකී කටයුතු සම්පූර්ණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඩෙන්මාර්කයේ ගැනුම්කරුවන් අතර ශ්‍රී ලාංකිකයන්ගේ හැකියාවන් පිළිබඳව අවබෝධයක් ඇතිකරලීම සඳහා ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය පිළිබඳ මෙරට වාර්තාව 2023 මැයි මස 30 වැනි දිනැතිව ඩෙන්මාර්කයේ දී නිකුත් කරන ලදී.

ප්‍රදර්ශනය අතරතුර දී, නව නිෂ්පාදන හඳුන්වා දීමට සහ ඩෙන්මාර්කයේ සහ ස්වීඩනයේ වෙළඳපොළවල් වෙත ඇතුළුවීමට සහභාගිකයන්ට හැකිවිය. අවන්හල් කළමනාකරණ යෙදුම්, ERP මෘදුකාංග, කෘත්‍රිම බුද්ධිය මත පාදනම් වූ ඩිජිටල් පරිවර්තන යෙදුම්, ව්‍යාසායන් සඳහා යෙදුම්, ඊ-වාණිජ්‍යය, ජංගම දුරකතන යෙදුම්, කෘත්‍රිම බුද්ධිය මත පාදක යෙදුම්, Fintech based mobile wallet, Telco application, පාරිභෝගික සේවා සඳහා යෙදුම්, ජංගම දුරකතන සහ වෙබ් අඩවි සඳහා යෙදුම් ආදිය මීට ඇතුළත් ය. තවද, ස්කැන්ඩිනේවියානු වෙළඳපොළ සඳහා නව මෘදුකාංග යෙදුම් හඳුන්වාදෙන ලදී.

මීට අමතරව, ස්කැන්ඩිනේවියානු වෙළඳපොළ සම්බන්ධයෙන් කෙළින්ම තොරතුරු ලබාගැනීමට, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, Asia House සහ දේශීය පාර්ශවකරුවන් කිහිප දෙනෙකු සමඟ සවිමත් සහයෝගීතාවයක් තහවුරු කරගැනීමට සහභාගිකයන්ට හැකිවිය. ස්වීඩන් වෙළඳපොළෙහි හැසිරීම, එහි පදිංචිකරුවන් සහ සංස්කෘතිය, සන්නාම සකස්වීම සහ සන්නාම වෙන්කොට හඳුනාගැනීම සම්බන්ධයෙන් දැනුමක් ද ඔවුන් විසින් අත්පත් කරගන්නා ලදී.

- **තායිලන්තයේ පැවති Thaifex Anuga 2023**

2023 මැයි මස 23 වැනි දින සිට 27 වැනි දින දක්වා තායිලන්තයේ දී පැවති Thaifex 2023 ප්‍රදර්ශනය සඳහා නව/ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 05ක් ද ඇතුළුව ආහාර සහ පානවර්ග නිෂ්පාදනයේ/ අපනයනයේ නියැලෙන ශ්‍රී ලාංකික සමාගම් 08ක් සහභාගිකරවීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු කරන ලදී. මීට සමාගාමීව, තායිලන්තය, චීනය, යුරෝපා සංගමය, ජපානය සහ ඕස්ට්‍රේලියාව වැනි රටවල ගැනුම්කරුවන් සමඟ ව්‍යාපාරික හමු 26ක් සංවිධානය කරන ලදී.

මීට සහභාගී වූ සමාගම්වලට ඇ.ඩො.මිලියන 1.73ක වටිනාකමකින් යුතු තහවුරු කළ ඇණවුම් 26 ක් ලැබුණු අතර ඇ.ඩො. මිලියන 2.77 ක වටිනාකමකින් යුතු ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

මීට අමතරව, ශ්‍රී ලාංකික ආහාර සහ පානවර්ග සමාගම් සඳහා ද අපේක්ෂා තැබිය හැකි අවස්ථා සහිත ඉහළ මට්ටමේ වර්ධන වේගයක් ඉදිරියට ඇතිවන ආසියානු-ශාන්තිකර කලාපයේ සෞඛ්‍යාරක්ෂිත ක්ෂණිකව ආහාරයට ගත හැකි ආහාරවේල් සහ කෙටිකෑම කර්මාන්තය නිරීක්ෂණය කිරීමට ද සහභාගිකයන්ට හැකි විය. නැගෙනහිර ආසියානු වෙළඳපොළ තුළ හලාල් සහතිකය සඳහා ඉහළ යමින් පවතින ඉල්ලුම ද නිරීක්ෂණයට ලක්විය.

තව ද, ආසියානු ගැනුම්කරුවන් (චීනය, ජපානය, තායිලන්තය, ඉන්දියාව) මෙන්ම යුරෝපා සංගමයේ සහ ඕස්ට්‍රේලියානු ගැනුම්කරුවන් හමුවීම සඳහා ද මෙය මනා වේදිකාවක් විය. ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් ඉදිරිපත් කළ ශාකමය සහ පැහැදිලි ලේබල් සහිත නිෂ්පාදිත කෙරෙහි ගැනුම්කරුවන් විසින් උනන්දුවක් දක්වන ලදී.

- **කැනඩාවේ පැවති SIAL Canada 2023 ප්‍රදර්ශනය**

2023 මැයි 9 -11 වැනි දින දක්වා කැනඩාවේ ටොරොන්ටෝහි පැවති SIAL Canada 2023 ප්‍රදර්ශනය සඳහා නව/ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 08ක් ඇතුළුව ශ්‍රී ලාංකික ප්‍රදර්ශකයන් 12 දෙනෙකු සහභාගීකරවීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු කරන ලදී.

සහභාගිකයන් සඳහා ප්‍රදර්ශනයට පෙරාතුව වැඩමුළුවක් පැවති අතර මණ්ඩලයේ සමාජ මාධ්‍ය ඔස්සේ පූර්ව ප්‍රචාරක වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රදර්ශනය පැවති කාලසීමාව තුළ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 3ක් ද ඇතුළුව නව සමාගම් හයක් කැනඩාවේ වෙළඳපොළ වෙත හඳුන්වා දෙන ලදී. තවද, අගය එකතුකළ පොල්මද නිෂ්පාදන, කුරුඳු, ශාකමය නිෂ්පාදන, ආහාර අතිරේක, අඩු සීනි නිෂ්පාදන, ස්වභාවික නිෂ්පාදන, කෙළින්ම ආහාරයට ගතහැකි පරිදි සැකසූ නිෂ්පාදන, සහ අනෙකුත් පාරිභෝගික ඇසුරුම් සම්බන්ධිත නව ප්‍රවණතා හඳුනාගැනීමට සහභාගිකයන්ට හැකිවිය. කැනේඩියානු අවන්හල්වල මෙරට ගම්මිරිස් සඳහා පවතින වෙළඳපොළ අවස්ථා ද හඳුනාගන්නා ලදී. ප්‍රාණජීව කැප්සියුලය නිෂ්පාදනය කිරීම නැනෝ තාක්ෂණය සමඟ බද්ධ කිරීම සඳහා කැනේඩියානු සමාගමක් සමඟ සහයෝගිතාවයෙන් කටයුතු කිරීම සහ කැනඩාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ නව ගැනුම්කරුවන් සමඟ සබඳතා ඇතිකර ගැනීම වශයෙන් වූ අවස්ථාවන් දෙකක් සෙත්සුව ආයුර්වේද හොස්පිට්ල් (පුද්ගලික) සමාගමට හිමි විය.

කැනඩා ශ්‍රී ලංකා ව්‍යාපාරික සම්මුතියේ සාමාජිකයන් සමඟ සබඳතා ඇතිකරගැනීමට ද සහභාගිකයන්ට හැකි විය.

ඇ.ඩො.81,000ක වටිනාකමින් යුතු ස්ථිර කළ ඇණවුම් ලැබුණු අතර, ඇ.ඩො. 540,700ක වටිනාකමකින් යුතු ඇණවුම් සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වෙමින් පවතී. ආයුර්වේද ආහාර අතිරේක දෙකකට අදාළව හවුල් ව්‍යවසායන් සම්බන්ධයෙන් ද සාකච්ඡා ආරම්භ වී තිබේ.

- **චීන ජාත්‍යන්තර සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායන්ගේ ප්‍රදර්ශනය International Small and Medium Enterprises Fair (CISMEF) 2023**

2023 ජූනි 27 සිට 30 වැනි දින දක්වා චීනයේ ගුවැන්ජෝහිදී පැවති CISMEF ප්‍රදර්ශනය සඳහා කුළුබඩු, මැණික් හා ස්වර්ණාභරණ, පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන, ඇඟළුම්, තේ සහ ජීවන චර්යා සමඟ අදාළ නිෂ්පාදන යන ක්ෂේත්‍ර නියෝජනය කරන ශ්‍රී ලාංකික සමාගම් 24ක් සහභාගීකරවීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු කරන ලදී.

එම ප්‍රදර්ශනය තුළ දී මැණික් හා ස්වර්ණාභරණ, ජීවන චර්යා සමඟ අදාළ නිෂ්පාදන, තේ ආදී නිෂ්පාදන අලෙවි කිරීම් වලින් ලැබූ ආදායම ඇ.ඩො. 40,700කි. මැණික් හා ස්වර්ණාභරණ, කොහු නිෂ්පාදන, ජීවන චර්යා සමඟ අදාළ නිෂ්පාදන, තේ සඳහා ඇ.ඩො. 291,500ක වටිනාකමින් යුතු තහවුරු කළ ඇණවුම් ලැබුණි. විමසීම් 25කට අදාළව සාකච්ඡා සිදුකෙරෙමින් පවතී.

ප්‍රදර්ශනය පැවැත්වෙන අතරතුර, වෙනත් රටවලින් සහභාගීවූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සමඟ සම්බන්ධ වී ගෝලීය වෙළඳ පරිසරය සම්බන්ධයෙන් සිය දැනුම වැඩිදියුණු කරගැනීමේ අවස්ථාවක් සහභාගිකයන්ට හිමිවිය.

තව ද, වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා නිරවද්‍ය මිලකරණය සමඟින් චීන වෙළඳපොළෙහි පවතින අවස්ථා සහ සිය දැනට පවතින නිෂ්පාදන පරාසය, ගුණාත්මකබව සහ සැලසුම සම්බන්ධයෙන් අවශ්‍යකරන වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් කෙළින්ම තොරතුරු ලබාගැනීමේ හැකියාව මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ නව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 07කට ලැබුණි.

- **සියෝල්හි පැවති ආහාර සහ හෝටල් ප්‍රදර්ශනය (Seoul Food & Hotel Show)**

2023 මැයි 30 වැනි දින සිට ජූනි 02 වැනි දින දක්වා දකුණු කොරියාවේ සියොල්හි පැවති Seoul Food & Hotel Show සඳහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 03ක් සමඟින් නව සමාගම් 05ක් ඇතුළුව ශ්‍රී ලාංකික ප්‍රදර්ශකයන් 06ක් සහභාගී කරවීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු කරන ලද අතර ඇ.ඩො. 50,000ක වටිනාකමින් යුතු ඇණවුම් සම්බන්ධයෙන් එකඟතා ඇතිකර ගැනීමේ සාකච්ඡා පැවත්වෙමින් පවතී. M/S Gain Holdings (Pvt) Ltd සහ Southern Cinnamon (Pvt) Ltd නැමති සමාගම් ප්‍රථම වරට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හරහා ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයකට සහභාගි විය.

තනි තනි ප්‍රදර්ශකයන් විසින් සමාජ මාධ්‍ය ජාල ඔස්සේ සිදුකළ ප්‍රචාරණ කටයුතු හේතුවෙන් දකුණු කොරියානු වාර්ගික වෙළඳපොළ වෙත සිය නිෂ්පාදන (ශ්‍රී ලංකාවේ ග්‍රොසරි භාණ්ඩ/ කජු/ කිතුල් නිෂ්පාදන ආදිය) හඳුන්වාදීමට සහභාගිකයන්ට හැකි විය. හවුල් ව්‍යවසායන් සඳහා පවතින විභව්‍ය සහයෝගීතාවයන් සම්බන්ධයෙන් ප්‍රදර්ශනයෙන් පසුව ව්‍යාපාරික හමු තුනක් ද පවත්වන ලදී.

දකුණු කොරියාවේ සුවඳ විලවුන් කර්මාන්තය සඳහා සිය අමුද්‍රව්‍ය (සගන්ධ තෙල්) සැපයීමේ අවස්ථාවක් සමාගම් දෙකකට හිමිවිය. සමාගම් දෙකකට මාර්ගගත අලෙවිසැලක් සම්බන්ධයෙන් අත්හදා බැලීමක් සිදුකිරීම සඳහා ඇණවුමක් කොරියානු පාර්ශවයෙන් ලැබුණි.

- **68 වැනි බැංකොක් මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනයේ (BGJF) ශ්‍රී ලංකා ප්‍රදර්ශන ශාලාව - 2023**

68 වැනි බැංකොක් මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනයේ (BGJF) - 2023 සඳහා සහභාගී වූ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික දූත පිරිස ශ්‍රී ලාංකික සමාගම් හතක (07) නියෝජනයෙන් යුක්ත විය; ඒ ආර් ජෙම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ජෙමෙක්ස් ලංකා, ග්ලෝබල් ජෙම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ජෙම් පැරඩයිස්, නැචුරල් සෆයර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සිලෝන් බියුටි ජෙම්ස්. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් විසින් දැරූ පිරිවැයෙන් කොටසක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශන කුටිය තුළ වටිනා සහ අර්ධ වටිනා මැණික් ගල් සහ මැණික් ඔබ්බවන ලද ස්වර්ණාභරණ ප්‍රදර්ශනය කරන ලදී.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තායි ට්‍රේඩ් සෙන්ටර් චෙන්නායි (TTCC) සමඟ 2017 වර්ෂයේ සිට ප්‍රවර්ධන ගිවිසුමකට එළඹී සිටින අතර බැංකොක් මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකාවේ සහභාගිත්වය වෙනුවෙන් කටයුතු ද සංවිධානය කරන ලදී. මෙම දිගුකාලීන අවබෝධතාවය මත පදනම්ව, මෙම වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම සඳහා වඩාත් ප්‍රමුඛ ස්ථානයක් වඩාත් හොඳ මිල ගණන් යටතේ ලබා ගැනීමේ හැකියාව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට හිමිවිය.

ශ්‍රී ලාංකික මැණික අපනයනකරුවන් සඳහා විවිධ විදේශ ගැනුම්කරුවන් වෙතින් වැඩි ඇණවුම් සංඛ්‍යාවක් ලබාගැනීමට සහ ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පවතින නව ප්‍රවණතා හඳුනාගැනීමට මෙම ප්‍රදර්ශනය සුවිශේෂී වේදිකාවක් සැපයූ බව 2023 වර්ෂයේ දී පැවති 68 වැනි BGJF ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ සමාගම් විසින් ප්‍රකාශ කරන ලදී.

2.1.2 වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීවීම - දේශීය

පහත දැක්වෙන දේශීය වෙළඳ ප්‍රදර්ශන සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමාගම්වල සහභාගිත්වය ලබාදීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු සංවිධානය කරන ලදී.

- **2023 ජනවාරි 7 – 9 වැනි දින දක්වා පැවති ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය (Facets Sri Lanka International Gem & Jewellery Show)** - ඇ.ඩො. මිලියන 10කට අධික අලෙවියක් සහ ඇණුවම් වාර්තා විය.
- **2023 පෙබරවාරි 3 - 5 වැනි දින දක්වා පැවති පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය** - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමාගම් 07ක් සහභාගි කරවීමට කටයුතු කරන ලදී. ප්‍රදර්ශනය තුළ සිදුකළ අලෙවි කටයුතුවල වටිනාකම රු.මිලියන 1.72 කි.
- **2023 මාර්තු 3 – 5 වැනි දින දක්වා පැවති යාපනය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය (JITF 2023) -** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමාගම් 10ක් සහභාගි කරවීමට කටයුතු කරන ලදී. ප්‍රදර්ශනය තුළ

සිදුකළ අලෙවි කටයුතුවල වටිනාකම රු.මිලියන 1.45 ක් වන අතර සමාගම් 06ක වක්‍ර අපනයනවල වටිනාකම රු.මිලියන 10.45 කි (එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජර්මනිය සහ ඕස්ට්‍රේලියාව).

- **2023 මාර්තු 31 වැනි දින සිට අප්‍රේල් 02 වැනි දින දක්වා පැවති "Made in Sri Lanka" ප්‍රදර්ශනය -** ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) විසින් පවත්වන ලද ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ තොරතුරු කුටියක් පවත්වාගෙන යෑමට කටයුතු කරන ලදී.
- **Boat Show 2023** සඳහා සම සංවිධායකත්වය දරන ලදී.

2.2 ව්‍යාපාරික හමුවීම් වැඩසටහන් (B2B Programmes)

වෙළඳපොළ සම්බන්ධතා ඇතිකර ගැනීම සහ කඩිනමින් ඇණවුම් ලබාගැනීමේ අරමුණැතිව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් විදේශ රටවල ගැණුම්කරුවන් සමඟ 55කට අධික "*ව්‍යාපාරික හමු*" සංඛ්‍යාවක් පවත්වා තිබේ (පොල් ආශ්‍රිත නිෂ්පාදන - 12, ආයුර්වේද නිෂ්පාදන - 02, මුහුදු ආහාර - 02, කැපූ මල් සහ ශාක පත්‍ර - 01, තේ - 01, පලතුරු සහ එළවළු - 01, සත්ත්ව ආහාර - 01, ඇඟළුම් - 01, ඉලෙක්ට්‍රොනික් සංරචක - 04, මැණික් සහ ස්වර්ණාභරණ - 02, රබර් පදනම්කරගත් නිෂ්පාදන - 02, බෝට්ටු නිෂ්පාදනය - 01, ආලෝකකරණ ඉංජිනේරු කටයුතු - 01, ඉදිකිරීම් සේවා -06, අධ්‍යාපන සේවා - 01, තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාරික ක්‍රියාවලි කළමණාකරණය - 01 සහ බහු නිෂ්පාදන - 12).

එකී ව්‍යාපාරික හමුවල ප්‍රතිඵල පහත දැක්වේ.

- කි.ග්‍රෑම් 5 බරින් යුතු කොහුබත් කැට (අඩි 20 බහාලුමක ධාරිතාවයක් සඳහා) සඳහා එක් සමාගමකට ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.85ක වටිනාකමකින් යුතු ඇණවුමක් ලැබුණි.
- පුනක්කු අපනයනය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික අපනයනකරුවන් සිවු දෙනෙකු ඉන්දීය ජාතික ගැනුම්කරුවෙකු වෙත හඳුන්වාදෙන ලදී. එයින් එක් සමාගමකට ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.35ක වටිනාකමකින් යුතු ඇණවුමක් ලබාගැනීමට හැකි විය.
- තායිවාන් ජාතික ගැණුම්කරුවෙකු වෙත දිසිදි පොල් අපනයන කටයුතුවල නිරත සමාගම් 08ක් හඳුන්වාදෙන ලදී.
- එක්සත් රාජධානියේ ගැණුම්කරුවෙකු වෙත පොල් වතුර නිෂ්පාදනයේ නියුතු අපනයන සමාගම් 09ක් හඳුන්වාදෙන ලදී.
- යුරෝපා සංගමයේ සහ එක්සත් ජනපද වෙළඳපොළවල් වෙත අවධානය යොමුකරමින් නේපාල ජාතික ගැනුම්කරුවෙකු වෙත ශාකසාර සහ ආයුර්වේද නිෂ්පාදන සමාගම් 04ක් හඳුන්වාදෙන ලදී.
- චීන වෙළඳපොළට මුහුදු ආහාර අපනයනකරුවන් දෙදෙනෙකු හඳුන්වාදෙන ලදී.
- චීන වෙළඳපොළට මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන් තිදෙනෙකු හඳුන්වාදෙන ලදී.
- නේපාලයේ, ඕමානයේ සහ උගන්ඩාවේ පැවති ව්‍යාපාරික ව්‍යාපෘති/ රැස්වීම්වලට සම්බන්ධවීම සඳහා ඉදිකිරීම් සමාගම් 04ක් වෙත සහාය ලබාදෙන ලදී.

- මොසැම්බික් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව යන රටවල් දෙකේම ඉදිකිරීම් කටයුතුවල නිරත සමාගම් 50කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් මොසැම්බික් වෙබිනා සම්මන්ත්‍රණය පවත්වන ලද අතර මොසැම්බික් රාජ්‍යයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කටයුතුවල නිරත සමාගම් 04ක් සම්බන්ධ කරවන ලදී. මීට අමතරව, අභිලාෂය ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසෙන පරිදි මොසැම්බික් රාජ්‍යය තුළ මූල්‍යායන පහසුකම් සහිතව දැනට කෙරීගෙන යන ව්‍යාපෘති 13ක තොරතුරු ශ්‍රී ලංකාවේ සමාගම් සමඟ හුවමාරු කරගන්නා ලදී.
- මාර්ගත ක්‍රමවේදය ඔස්සේ කථිකාචාර්යවරු ලෙස සේවය කිරීමට හැකිවන පරිදි ඉන්දුනීසියාවේ නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලය සමඟ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු සම්බන්ධ කරන ලද අතර (පුරප්පාඩු 04, අයදුම්පත් 18) එක් අයදුම්කරුවෙකු දැනටමත් පත්කර තිබේ.
- කැනඩාවේ වෙසෙන ශ්‍රී ලාංකික ඩයස්පෝරාව වෙත ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ලෙස පවතින තොරතුරු තාක්ෂණ සමාගම් 08ක් හඳුන්වාදෙන ලදී. ඩයස්පෝරාවේ සහයෝගය ඇතිව සමාගම් තුනක් විසින් දැනටමත් ව්‍යාපාරික සාකච්ඡා ආරම්භ කර තිබේ.

බහරේන්වල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සිදුකළ ඉල්ලීමක් පරිදි ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් බහරේන් වෙත කාන්තා ව්‍යවසායක දූත පිරිසක් යැවීමට කටයුතු කරන ලදී. ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව 2023 මාර්තු 7 – 11 වැනි දින දක්වා පැවති වැඩසටහනට කාන්තා ව්‍යවසායකයන් 09 දෙනෙකු සහභාගී වූ අතර එහිදී රැස්වීම්වාර සහ ප්‍රදර්ශන ගණනාවක් පවත්වන ලදී. සාධනීය අපේක්ෂා තැබිය හැකි පරිදි සය දෙනෙකු වෙතින් සම්බන්ධ විය හැකි තොරතුරු සහ බහරේන්වල සමාගමක් පිහිටුවීමට හවුල් ව්‍යවසාය අවස්ථාවක් ලැබුණි. තව ද, අප්‍රේල් මාසය තුළ දී සමාගම් දෙකක් විසින් විභව්‍ය ගැණුම්කරුවන් වෙත සාම්පල යැවීම ද සිදුකරන ලදී.

2.3 සන්නාම/ වෙළඳ ලකුණු/ භූගෝලීය දර්ශක

- **දේශීය කුරුඳු (Ceylon Cinnamon) සඳහා භූගෝලීය දර්ශකයක්**

භූගෝලීය දර්ශකයක් ලෙස සහතිකලත් නිෂ්පාදනයක් ලෙස දේශීය කුරුඳු අපනයනය ප්‍රවර්ධනය කිරීම පිණිස මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. කුරුඳු භූගෝලීය දර්ශකයක් ලෙස පවත්වාගෙන යෑමේ පාලන ක්‍රමවේදය ස්ථාපනය කිරීමේ කටයුතු දැනට කෙරීගෙන යමින් පවතී. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගිතාවයෙන් අගය දාමය තුළ වගාකරුවන්, සැකසුම්කරුවන්, නිෂ්පාදකයන් සහ අපනයනකරුවන් නියෝජනය වන දිස්ත්‍රික් සංවිධාන 12ක් ස්ථාපනය කර තිබේ. භූගෝලීය දර්ශකවල පිරිවිතර සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේද කෙසේ ස්ථාපනය කරන්නේ ද යන්න සම්බන්ධයෙන් මෙම සංවිධානවල සාමාජිකයන් පුහුණු කරන ලදී. කොළඹ, බදුල්ල, ගාල්ල, මාතර, කෑගල්ල, මහනුවර, ගම්පහ, කළුතර, හම්බන්තොට සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල දී සහභාගිකයන් 385 දෙනෙකු සඳහා ගොවි/ සැකසුම්කරු පුහුණු වැඩසටහන් පවත්වන ලදී. පුහුණු වැඩසටහන් දියත් කිරීම

සහ සාමාජිකයන්ගේ භූගෝලීය දර්ශක පිරිවිතරවලට අනුකූලතාවය සහ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සංවිධාන වගකීම දරනු ලැබේ.

දේශීය කුරුඳුවල භූගෝලීය දර්ශකය සඳහා ස්ථාපනය කරන ලද පිරිවිතරවලට අනුකූලව සැපයුම් දාමය තුළ පාලන මට්ටම් ත්‍රිත්වය (ස්වයං පාලනය, අභ්‍යන්තර පාලනය සහ බාහිර පාලනය) ක්‍රියාත්මක කිරීමේ අරමුණැතිව දිස්ත්‍රික් සංවිධානවල විධායක කමිටු සාමාජිකයන් ද ඇතුළත් වන පරිද්දෙන් භූගෝලීය දර්ශකයකින් ආරක්ෂා වූ දේශීය කුරුඳු සඳහා වූ සංගමය (ACCPGI) පිහිටුවන ලදී. මෙම සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම, 2023 අගෝස්තු 04 වැනි දින කිංග්ස්බරි හෝටලයේ දී පැවත්වීමට ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පහසුකම් සලස්වන ලදී.

පාලන සංගමයේ සහයෝගීතාවයෙන් භූගෝලීය දර්ශකයකින් ආරක්ෂා වූ දේශීය කුරුඳු සඳහා වූ සංගමයේ (ACCPGI) විධායක කමිටු සාමාජිකයන් සඳහා පුහුණුවක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ දී පවත්වන ලද අතර විධායක කමිටු සාමාජිකයන්ට අභ්‍යන්තර විගණකවරු ලෙස කටයුතු කිරීමට පහසුකම් සලස්වමින් සාමාජිකයන් වෙත මාර්ගෝපදේශ පොත් භාරදෙන ලදී.

සාමාජිකයන් 35 දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතුව අපනයනකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහනක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල පරිශ්‍රයේ දී 2023 මැයි 26 දිනැතිව පවත්වන ලදී.

ශ්‍රී ලංකාව තුළ වගාකළ, සැකසුම් කළ සහ නිෂ්පාදනය කළ 100% අමිශ්‍රිත දේශීය කුරුඳු අන්තර්ගත කුරුඳු කැපූ කූරු, කුරුඳු කුඩු, කුරුඳු ශාක පත්‍ර තෙල් සහ කුරුඳු කඳ ආශ්‍රිත තෙල් ඇතුළුව අගය එකතුකළ දේශීය කුරුඳු ඇසුරුම්වලට දේශීය කුරුඳුවලට අදාළ ආරක්ෂිත භූගෝලීය දර්ශක සලකුණ (‘PGI Mark”) භාවිතා කිරීම පිණිස ACCPGI සාමාජිකයන් වන සහ අනෙකුත් යෝග්‍යතා නිර්ණායක සපුරාලන පාර්ශවකරුවන් විසින් අයදුම්කළ හැකි ය.

විගණන පැවැත්වීම සහ භූගෝලීය දර්ශක සහතිකරණය සඳහා ගොවි අගය දාම 10ක් සහ විභව්‍ය නිෂ්පාදකවරු 35 දෙනෙකු හඳුනාගන්නා ලදී. ආරක්ෂිත භූගෝලීය දර්ශක සලකුණ සම්බන්ධිත අනුකූලතාවය සම්බන්ධයෙන් සමාගම්/ තැනැත්තන් 30 දෙනෙකු භෞතික වශයෙන් විගණනය කරන ලදී.

දේශීය කුරුඳු සහ මැඩගස්කරයේ කුරුඳු අතර සංසන්දනාත්මක කාර්යය සඳහා වූ ජෛව විද්‍යාත්මක සහ රසායනික විශ්ලේෂණයක් සඳහා සී ෂෙල්ස්හි මහ කොමසාරිස් කාර්යාලයෙන් මැඩගස්කරයේ සහතිකලත් කුරුඳු සාම්පල ඉල්ලා සිටින ලදී.

ජාතික අපනයන සන්නාම

ශ්‍රී ලාංකික නිෂ්පාදන සම්බන්ධයෙන් ගැනුම්කරුවන් අතර පවතින පිළිගැනීම ඉහළ නංවාලමින් ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සහ සේවා සඳහා වූ ගෝලීය පිළිගැනීම වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජාතික අපනයන සන්නාම සහ ප්‍රවර්ධන සැලසුමක් සකස් කර තිබේ.

බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2023 නොවැම්බර් 23 දිනැතිව පැවති ජනාධිපති අපනයන සම්මාන උළෙලේ දී අතිගරු ජනාධිපති විසින් ජාතික අපනයන සන්නාම නිල වශයෙන් ආරම්භ කරන ලදී. ජාතික අපනයන සන්නාමවලට අදාළව මෙරට සම්බන්ධයෙන් සකස්කළ වීඩියෝවක් මුදා හැරීම ද මෙම අවස්ථාවේ සිදුවිය.

2.4 වෙළඳපොළ වාණිජමය අගයක් ඇති යාවත්කාලීන තොරතුරු

- වෙළඳපොළ වාර්තා 48ක් සකස් කර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කර තිබේ. https://www.srilankabusiness.com/exporters/market-profiles/ (තුර්කිය, ඉරානය, රුසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉරාකය, ඊශ්‍රායලය, සවුදි අරාබිය, ජෝර්දානය, කටාර්, කුවේට්, ලෙබනන්, ඕමානය, බහරේන්, සයිප්‍රස්, ලිබියාව, දකුණු අප්‍රිකාව, කෙන්යාව, ඊජිප්තුව, ඉතියෝපියාව, නයිජීරියාව, සීෂෙල්ස්, ටැන්සානියාව, මොසැම්බික්, ඝානා, මොරොක්කෝ, ඉන්දුනීසියාව, මැලේසියාව, පකිස්තානය, හොංකොං, චීනය, නවසීලන්තය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, ජපානය, සිංගප්පූරුව, ජර්මනිය, ප්‍රංශය, ඔස්ට්‍රියාව, ඉතාලිය, බෙල්ජියම, නෙදර්ලන්තය, පෝලන්තය, ස්ලෝවැකියාව, හංගේරියාව, රුමේනියාව සහ නේපාලය)
- ජපානය සම්බන්ධයෙන් ඇඟළුම් ක්ෂේත්‍රයට අදාළ වෙළඳපොළ පර්යේෂණය සිදුකර අවසන් කිරීමෙන් අනතුරුව එහි තොරතුරු ක්ෂේත්‍රය තුළ ව්‍යාප්ත කර තිබේ. කැනඩාව සම්බන්ධයෙන් වන වෙළඳපොළ පර්යේෂණය අවසන් අදියරේ පවතින අතර ඕස්ට්‍රේලියාව සම්බන්ධයෙන් වන වෙළඳපොළ පර්යේෂණය සිදුකෙරෙමින් පවතී.
- ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (IFC) සහයෝගිතාවය යටතේ Euromonitor International සමඟින් අගය එකතුකළ කුරුඳු නිෂ්පාදන සම්බන්ධයෙන් වෙළඳපොළ අධ්‍යයනයක් සිදුකරන ලදී.
- "ගෝලීය අගය දාම (GVCs) සමඟ සම්බන්ධවීමේ දී ශ්‍රී ලංකාවේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් සංරචක ක්ෂේත්‍රයේ අපනයනකරුවන් සඳහා පවතින අභියෝග හා අවස්ථා සහ අපනයන ඉහළ නැංවීමේ යෝජනා" සම්බන්ධයෙන් වූ පර්යේෂණ අධ්‍යයනය අවසන් කර තිබේ.
- අගය එකතු කළ රෙදිපිළි/ඇඟළුම්, මාළු සහ මත්ස්‍ය ආහාර, සැකසුම් කළ ආහාර සඳහා ස්විස් සහ යුරෝපා වෙළඳපොළ තුළ පවතින අවස්ථා සම්බන්ධයෙන් වූ වෙළඳපොළ අධ්‍යයන වාර්තා ත්‍රිත්වයක් ස්විස් ආනයන ප්‍රවර්ධන වැඩසටහන (SIPPO) සමඟ සහයෝගිතාවයෙන් සකස් කර තිබේ. මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලද සම්මන්ත්‍රණයකින් අනතුරුව, වෙළඳපොළ අධ්‍යයන වාර්තාවෙන් අනාවරණය වූ කරුණු පර්යේෂණ අධ්‍යයන සිදුකළ උපදේශකවරුන්ගේ

සහභාගිත්වයෙන් පැවති මාර්ගගත සම්මන්ත්‍රණ තුනක් ඔස්සේ අපනයනකරුවන් සහ පොදු ජනතාව වෙත ව්‍යාප්ත කරන ලදී. මෙම අධ්‍යයන වාර්තා, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර තිබේ.

- "කෘෂිකාර්මික නිපැයුම් වෙළඳපොළට ප්‍රවේශ කරවීම සඳහා සම්පූර්ණකළ යුතු අවශ්‍යතා - චීනය, ජපානය, ඕස්ට්‍රේලියාව, රුසියාව සහ ඇමරිකා එක්සත් ජනපදය" මැයෙන් වූ වාර්තාව සම්පූර්ණ කර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.
- ශ්‍රී ලංකාවේ කොහුබත් කර්මාන්තය විසින් ගෝලීය වෙළඳපොළ ග්‍රහණය කරගැනීමේ හැකියාව සම්බන්ධයෙන් වෙළඳපොළ පර්යේෂණයක් සිදුකළ අතර එය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.
- "කෘෂිකාර්මික නිපැයුම් වෙළඳපොළට ප්‍රවේශ කරවීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා" සහ "ශාකමය ආහාර නිෂ්පාදන සඳහා වෙළඳපොළ" සම්බන්ධයෙන් වෙළඳපොළ පර්යේෂණ සිදුකරන ලද අතර ඒවා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවියේ පළ කර තිබේ.

2.5 ශ්‍රී ලාංකික නිෂ්පාදන චීනය වෙත යැවීමේ දී වෙළඳපොළ නිෂ්කාශනය

- **කුරුඳු**

  චීන වෙළඳපොළ වෙත කුරුඳු අපනයනය කිරීමේ දී පවතින බාධක ඉවත් කරගැනීම සඳහා අවශ්‍ය කාර්යපටිපාටියක් (Protocol) සම්බන්ධයෙන් කටයුතු අවසන් කිරීම සඳහා පළමු අනුමැතිය මහජන චීන සමූහාණ්ඩුවේ රේගු දෙපාර්තමේන්තුව (GACC) සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙතින් බීජිංහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්වී 2023 සැප්තැම්බර් මාසයේ දී ලබාගන්නා ලදී. අදාළ කාර්ය පටිපාටිය අත්සන් කිරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය එකඟ විණි.

  මේ ආශ්‍රිත සියලු ශාක නිරෝධායන ගැටලු සාකච්ඡා කිරීම සඳහා ශාක නිරෝධානය අංශයේ ප්‍රධානී සමඟ රැස්වීමක් 2023 සැප්තැම්බර් 18 වැනි දින ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ දී පැවැත්විණි.

  කර්මාන්තවලට ගොස් සිදුකළ යුතු කරුණු අධ්‍යයනවල (factory visits) 1 වැනි අදියර සඳහා යෝග්‍ය අපනයනකරුවන්/ නිෂ්පාදකයන් හඳුනාගන්නා ලද අතර එම විස්තර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ද ලබාදෙන ලදී.

  අමිශ්‍ර දේශීය කුරුඳු (PCC) ලාංඡනය ලබාදීම සඳහා නව සමාගම් 5ක් ඇගයීමට ලක්කළ අතර, ඉන් සමාගම් 3ක් සඳහා නිර්දේශ ලැබුණු අතර ගිවිසුම් අත්සන් කිරීමට නියමිත ය.

- **මුහුදු ආහාර**

  ජලජ මත්ස්‍ය නිෂ්පාදන ආශ්‍රිත මත්ස්‍ය ආහාර කර්මාන්ත කාර්ය පටිපාටියක් යෝජනා වී ඇති අතර එතැන් පරීක්ෂාවක් හෝ වීඩියෝ මාර්ග ඔස්සේ පරීක්ෂාවක් සිදුකිරීමට මත්තෙන් චීන විශේෂඥවරු විසින් පූර්ව ඇගයීමක් සිදුකිරීම සඳහා නියාමන ද්‍රව්‍ය සහ ව්‍යවසාය තොරතුරු මහජන චීන සමූහාණ්ඩුවේ රේගු දෙපාර්තමේන්තුව (GACC) විසින් ඉල්ලා තිබේ.

ශ්‍රී ලංකාව පාර්ශවයෙන් මෙහි නිසි බලධරයා වන ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිසි අයුරින් සම්පූර්ණ කළ ප්‍රශ්නාවලිය සහ තොරතුරු හැකි ඉක්මනින් බීජිංහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා මහජන චීන සමූහාණ්ඩුවේ රේගු දෙපාර්තමේන්තුව (GACC) වෙත ඉදිරිපත් කළ යුතු ය.

අවසන් වශයෙන් කෙටුම්පත් කර ඇති කාර්ය පටිපාටිය ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිංහල පරිවර්තනයක් ද සමඟින් මහජන චීන සමූහාණ්ඩුවේ රේගු දෙපාර්තමේන්තුව (GACC) වෙත ඉදිරිපත් කර තිබේ.

මෙම කාර්ය පටිපාටිය අත්සන් කිරීම සඳහා ලැබී ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් 2023 ජනවාරි 15 දිනැතිව චීන තානාපති කාර්යාලය දැනුවත් කර තිබේ.

අදාළ පාර්ශවයන් කල්තබා සූදානම් කරවීම සඳහා දුරස්ථ නිරීක්ෂණ සැලැස්මේ කෙටුම්පත සහ වීඩියෝ මාර්ග ඔස්සේ පරීක්ෂා සිදුකිරීමට අදාළ අනෙකුත් තොරතුරු තානාපති කාර්යාලය වෙතින් ඉල්ලා තිබේ.

තෝරාගත් සමාගම් සහ අනෙකුත් අදාළ ස්ථාන (ධීවර වරායන්, බෝට්ටු, පරීක්ෂණාගාර ආදිය) ධීවර අමාත්‍යාංශය විසින් පරීක්ෂා කර තිබේ.

- **අන්නාසි**

භාණ්ඩ ආනයනය සහ අපනයනයේ දී අයකරනු ලබන බදු නොවන බාධක (non-tariff barriers) ඉවත් කරමින් චීන වෙළඳපොළ වෙත ශ්‍රී ලංකාවේ අන්නාසි අපනයන විවෘත කරලීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟින් පහසුකම් සලස්වන ලදී. මෙම කාර්යය සඳහා, චීනයේ වාණිජ අමාත්‍යවරයා, ජාතික ශාක නිරෝධායන සේවය (NPQS), පලතුරු සහ එළවළු නිෂ්පාදකයන් හා සැකසුම්කරුවන්ගේ හා අපනයනකරුවන්ගේ සංගමය සමඟ රැස්වීමක් පැවති අතර, චීන රටෙහි පාර්ශවයෙන් ලබාගත යුතු යම් පැහැදිලි කිරීම් ලබාගැනීම සඳහා තානාපති කාර්යාලය හරහා අදාළ කරුණු යොමු කරන ලදී.

මීට අදාළව පලතුරු සහ එළවළු වගාකරන්නන්ගේ සංගමය සමඟ සාකච්ඡා කර අන්නාසි වගාකරන වතු සහ ඇසුරුම්කරණ මධ්‍යස්ථාන පිළිබඳ දත්ත සමුදායක් සකස් කරන ලදී. ජාතික ශාක නිරෝධායන සේවයේ (NPQS) නිලධාරීන් සමඟ අන්නාසි වතු 08ක සහ ඇසුරුම්කරණ මධ්‍යස්ථාන 04ක පූර්ව පරීක්ෂා කිරීම් අවසන් කරන ලදී. තෝරාගත් අන්නාසි වතු සහ ඇසුරුම්කරණ මධ්‍යස්ථාන පිළිබඳ ඉලෙක්ට්‍රොනික් දත්ත මහජන චීන සමූහාණ්ඩුවේ රේගු දෙපාර්තමේන්තුව (GACC) වෙත වීඩියෝ මාර්ගය ඔස්සේ පරීක්ෂාව සඳහා යොමු කරන ලදී.

3 අපනයනකරුවන්ගේ කුසලතා සංවර්ධනය/ පුහුණුව

3.1 ජර්මනියේ Import Promotion Desk සමඟ සහයෝගීතාවයෙන් සුළු සහ මධ්‍ය පරිමාණ ආහාර අමුද්‍රව්‍ය නිෂ්පාදක/ අපනයන ව්‍යවසායකයින් සඳහා යුරෝපා වෙළඳපොළ වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම

- Biofach 2023 ප්‍රදර්ශනය සඳහා සහභාගීවීමට සමාගම් 4කට පහසුකම් සලස්වන ලදී. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක සමාගම් 2ක් සඳහා 60% ක් වශයෙන් මූල්‍ය අනුග්‍රහය ලබාදෙන ලද අතර සමාගම් හතරම සඳහා ව්‍යාපාරික හමු සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ දී Biofach, SIAL Canada, Thaifex සහ Anuga යන ප්‍රදර්ශන සඳහා සහභාගීවූ පිරිස් වෙත (Biofach - 08, SIAL Canada 10, Thaifex - 08 සහ Anuga - 12) එම ප්‍රදර්ශනවලට පූර්ව වශයෙන් සංවිධානය කළ වැඩමුළු (PFW) තුනක් පවත්වන ලදී.
- යුරෝපා සංගමයේ වෙළඳපොළ වෙත ප්‍රවේශය සම්බන්ධයෙන් වූ පුහුණු වැඩසටහනක් සහභාගිකයන් 30 දෙනෙකු සඳහා මහනුවර දී පවත්වන ලදී. මීළඟ IPD දූත පිරිස සඳහා සහභාගිවීම පිණිස විභවතාවයක් සහිත සමාගම් 7ක් හඳුනාගන්නා ලදී.
- ජර්මනියේ, බර්ලින්හි GIZ නියෝජිතායතනයේ සහයෝගයෙන් සංවිධානය කළ 'flavour of Sri Lanka' සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමාගම් 08ක් සහභාගි විය.
- 2023 ජූලි 11 සිට 17 දක්වා දූත මෙහෙවරක් පැවති අතර, IPD වැඩසටහන සඳහා නව සමාගම් 06ක් තෝරාගන්නා ලදී.
- නව අයදුම්කරුවන් වෙනුවෙන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ IPD වැඩසටහන මගින් ඇගයීම් රැස්වීම් ආරම්භ කරන ලද අතර අයදුම්කරුවන් 16ක් සම්බන්ධයෙන් කටයුතු අවසන් කරන ලදී.
- ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවල දී රටවල් වෙනුවෙන් ආකර්ෂණීය කුටි සංවිධානය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් 25 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

3.2 ආයතනික මනා අධීක්ෂණය සම්බන්ධිත ජර්මනියේ නව පනත පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ පුහුණු කිරීමේ නිලධාරීන් විසින් සැපයුම්දාමවලදී ආයතනික මනා අධීක්ෂණය පිළිබඳ ජර්මනියේ නව පනත සම්බන්ධයෙන් වූ මාර්ගගත වැඩමුළු මාලාවක් 2023 මාර්තු 21, 28 සහ 30 යන දිනවල දී පවත්වන ලදී. තව ද, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් AHK සහ UNIDO සමඟ සහයෝගීතාවයෙන් ජර්මනියේ මෙම පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ සැසියක් 2023 අප්‍රේල් මස 25 වැනි දින මූව් ඇන්ඩ් පික් හෝටලයේ දී පවත්වන ලදී.

3.3 අනෙකුත් මාර්ගගත සම්මන්ත්‍රණ/ සමුළු/ වැඩමුළු

- ශ්‍රී ලංකාවේ ඇගළුම් ක්ෂේත්‍රයේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් දැනුවත්භාවයක් ඇති කරලීම සඳහා විදේශවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල සහ ඒකාබද්ධ ඇඟළුම් සංගම් සංසදය (JAAF) සමඟ මාර්ගගත සම්මන්ත්‍රණයක් සංවිධානය කළ අතර, හඳුනාගත් වෙළඳපොළවල් (ඕස්ට්‍රේලියාව, කැනඩාව, ජපානය, දකුණු කොරියාව, රුසියාව සහ මැද පෙරදිග) ඔස්සේ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළවල් තුළ ශ්‍රී ලංකාවේ ඇගළුම් ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සහයෝගය ද ඉල්ලා සිටින ලදී.
- "කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනකරුවන් වෙත අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනයන් (TIEP) යටතේ පහසුකම්" මැයෙන් අපනයන සමාගම් 69ක් සඳහා වූ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් 2023 මාර්තු 8 දිනැතිව පවත්වන ලදී. ශ්‍රී ලංකා රේගුව සමඟ ලියාපදිංචිම සඳහා සමාගම් පහක් විසින් අයදුම් කරන ලදී.
- විදේශ රටවලින් සහභාගී වූ පිරිස් ද ඇතුළුව සහභාගිකයන් 40 දෙනෙකු සඳහා ශ්‍රී ලංකාවේ ජලජීවී කර්මාන්ත අංශය සම්බන්ධයෙන් වූ මාර්ගගත සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.
- චීනය වෙත අපනයන සිදුකළ යුතු ක්‍රමවේදය සම්බන්ධ පුහුණු සැසියක් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය ආහාර සහ ජලජීවී සමාගම් 38ක් සඳහා පවත්වන ලදී.
- "මුහුදු පැලැටි සැකසුම්කරණය සහ අගය එකතු කිරීම" මැයෙන් වූ මාර්ගගත සම්මන්ත්‍රණය සහභාගිකයන් 105ක් වෙනුවෙන් පවත්වන ලදී.
- 163 වැනි වරටත් පවත්වනු ලබන ආනයන සහ අපනයන කාර්ය පටිපාටි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සිසුන් 36 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ජූලි 08 දිනැතිව ආරම්භ විය. මෙම පාඨමාලාවෙන් ලැබූ සමස්ත ආදායම රු. මිලියන 1.1 කි.
- 94 වැනි වරටත් පවත්වනු ලබන ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් පැතිකඩ සම්බන්ධ පාඨමාලාව සිසුන් 40 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2023 අගෝස්තු 19 දිනැතිව ආරම්භ විය. මෙම පාඨමාලාවෙන් ලැබූ සමස්ත ආදායම රු. මිලියන 1.3 කි.
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් යුරෝපා කොමිසමේ ජාත්‍යන්තර වෙළඳපොළ අංශයේ රෙදිපිළි සම්බන්ධ ඒකකයේ සහ බෙල්ජියමේ, බ්‍රසල්ස්හි තානාපති කාර්යාලය සමඟ සහයෝගිතාවයෙන් රෙදිපිළි පිළිබඳ යුරෝපා සංගමයේ තිරසර සහ චක්‍රීය ක්‍රමෝපාය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමේ සැසියක් 2023 ජූලි 20 වන දින පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා සමාගම් 51ක් සහභාගී විය.

4 නිපැවුම්/නිෂ්පාදන සංවර්ධන වැඩසටහන්

4.1 ශ්‍රී ලංකාවේ තිරසර කාබනික කෘෂිකාර්මික පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම

ජාතික කාබනික ප්‍රමිතීන් ලබාගැනීමට සහාය ලබාදීම සඳහා මෙම වැඩසටහන යටතේ ගොවීන්/ සැකසුම්කරුවන්/ යෙදවුම් නිෂ්පාදකයන් 43 දෙනෙකු තෝරාගන්නා ලදී. තෝරාගත් ප්‍රතිලාභීන් 43 සඳහා කාබනික කළමනාකරණ සැලැස්ම සම්බන්ධයෙන් මාර්ගගත පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

ජාත්‍යන්තර කාබනික ප්‍රමිති හඳුන්වාදීම සඳහා ගොවීන් 500 දෙනෙකු ද ඇතුළුව ගොවි කණ්ඩායම් තෝරාගන්නා ලදී.

ජාතික කාබනික සහතිකකරණ ලකුණ හඳුන්වාදීම සඳහා කොළඹ දී ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වන ලද අතර, ඉන් අනතුරුව සහතික ලකුණ සම්බන්ධයෙන් ප්‍රවර්ධනය කිරීමට සහ දැනුවත්බව ව්‍යාප්තකරලීම සඳහා වූ පුවත්හසුන් 15ක් පමණ ප්‍රකාශයට පත් කරන ලදී.

GIZ නියෝජිතායතනයේ මූල්‍ය සහයෝගීතාවයෙන් ITC තාක්ෂණික සහයෝගිතාවයෙන් ස්වයංක්‍රීය ආකාරයෙන් පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතියක් ආරම්භ කරන ලදී. මෙම ප්‍රයත්නයේ කොටසක් ලෙසින් පාර්ශවකරුවන් වෙත සහතික 08ක් නිකුත් කර තිබේ.

මීට අමතරව, “www.nocu.lk” නමින් සකස් කළ වෙබ් අඩවිය නිල වශයෙන් ආරම්භ කිරීමේ උත්සවය 2023 සැප්තැම්බර් මස 22 වැනි දින පවත්වන ලදී. යුරෝපා සංගමයේ සහ GIZ Sri Lanka සම මූල්‍ය අනුග්‍රාහකත්වය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකාවේ කාබනික කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ව්‍යාපෘති සහාය යටතේ මෙම වෙබ් අඩවිය සංවර්ධනය කරන ලදී.

4.2 ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානය (NPC) යළි පනගැන්වීම

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්තයේ වර්ධනය සඳහා රුකුලක් සැපයීම සඳහා ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල පරිශ්‍රය තුළම ස්ථාවර වශයෙන් ස්ථාපනය කර තිබේ. තව ද, දේශීය ඇසුරුම් ද්‍රව්‍ය උපයෝගී කරගෙන මෙරට දී නිර්මාණය කරනු ලබන නව්‍ය ඇසුරුම්කරණයන් ප්‍රදර්ශනය කිරීම සඳහා ඇසුරුම්කරණ සැලසුම් ප්‍රදර්ශන ඒකකයක් ද ආරම්භ කරන ලදී. මෙම කාර්යය ආරම්භ කිරීමේ උත්සවය ගරු ජනාධිපතිතුමාගේ අතිරේක ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහ ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වයෙන් 2023 අගෝස්තු 15 වැනි දින ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ දී පැවැත්විණි.
- ඇසුරුම්කරණ ක්ෂේත්‍රයේ විවිධ අංශවල විශේෂඥයන් 10 දෙනෙකු හඳුනාගත් අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ඔවුන්ගේ විස්තර ඇගයීම සිදුකරමින් පවතී.

- බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2023 මාර්තු 23 සහ 24 යන දිනවල පැවති ශ්‍රී ලංකා අත්කම් ප්‍රදර්ශනයේ දී දේශීය සහ අපනයන වෙළඳපොළ සඳහා අත්කම් ඇසුරුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 150 දෙනෙකු සඳහා පවත්වන ලදී.
- කුළුබඩු ක්ෂේත්‍රය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් 2023 ජූනි මස 08 දිනැතිව පවත්වන ලදී.
- 2023 ජූනි 15 වැනි දින පැවති ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වැඩසටහනේ දී (EDB Open Day Programme) ඇසුරුම්කරණය පිළිබඳව දැනුවත් කිරීමේ සැසි 08 ක් පවත්වන ලදී.
- "කර්මාන්ත ප්‍රදර්ශනය 2023" අවස්ථාවේ දී ඇසුරුම්කරණය පිළිබඳව මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- මාතර දිස්ත්‍රික්කයේ විභව්‍ය අපනයනකරුවන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 43 දෙනෙකු සඳහා ඇසුරුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී.
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ප්‍රවාහන කටයුතුවලදී පලතුරු සහ එළවළුවල පසු අස්වැනු හානි අවම කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කරන ලදී.

5 අපනයන සඳහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනයට පහසුකම් සැලසීම

නව අපනයනකරුවන් බිහිකිරීමේ සහ අපනයන වෙළඳපොළ තුළ පවතින අවස්ථා සම්බන්ධයෙන් දැනුවත්බවක් ඇතිකරලීමේ අරමුණින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නව අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන (NEDP) යටතේ පළාත්වල සිටින ව්‍යවසායකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු, නිෂ්පාදක-අපනයනකරු සම්බන්ධකිරීමේ වැඩසටහන්, නිෂ්පාදිත/ සැපයුම් සංවර්ධන වැඩසටහන් සහ වෙළඳපොළ වෙත විවෘතවීමේ වැඩසටහන් වශයෙන් වූ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 200 දෙනෙකු හඳුනාගෙන අදාළ ක්ෂේත්‍ර අනුව කාණ්ඩගත කරන ලදී. 2023 අප්‍රේල් - ජූලි අතර කාල සීමාව තුළ කෘෂිකර්මය පදනම් කරගත් සහ කාර්මික නිෂ්පාදන පදනම් කරගත් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 140 දෙනෙකු සඳහා ඇගයීම් සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී.
- USAID, UNIDO සහ කාර්මික තාක්ෂණ ආයතනය සමඟ සහයෝගීතාවයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමාගම් 20ක් සඳහා 2023 අප්‍රේල් 27 හා 28 යන දෙදින තුළ ඇසුරුම්කරණ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදෙන ලදී.
- ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ සහයෝගීතාවයෙන් UNIDO විසින් සංවිධානය කළ 2023 මාර්තු 28, අප්‍රේල් 4 සහ 27 යන දිනවල පැවති "Quality – for Small and Medium-Sized Enterprises ensuring the demand for the NQI services" මැයෙන් වූ වැඩමුළුව සඳහා

ප්‍රාදේශීය වශයෙන් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමාගම් (ගාල්ල, යාපනය, මහනුවර) 43කට සහභාගීවීමේ අවස්ථාව සලස්වන ලදී.

- ජපානය වෙත සිදුකළ යුතු අපනයන ඇණවුමක් සපුරාලීම සඳහා සැපයුම් පදනමක් සකස් කරගැනීම පිණිස Shigen Exports (Pvt) Ltd සමඟ කොළපත් ආශ්‍රිත නිෂ්පාදනයක් සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකරන ලදී.
- වයඹ/ උතුරු මැද පළාත්වල අත්කම් නිෂ්පාදන සඳහා සමාගම් 07 ක් සහ සම්බන්ධිත අපනයනකරු සමඟ 2023 ජූනි 2 දිනැතිව ව්‍යාපාරික රැස්වීමක් පවත්වන ලදී.
- විභව්‍ය අපනයනකරුවන්/ අපනයන කටයුතු සඳහා සූදානම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්/ නව ව්‍යවසායකයන් සඳහා වැඩසටහනක් (an open day) 2023 ජූනි 15 වැනි දින පවත්වන ලද අතර එම වැඩසටහන සඳහා ආසන්න වශයෙන් 900කට අධික පිරිසක් සහභාගි විය. හඳුනාගත් පිරිස් සමඟ පසුවිපරම් කටයුතු සිදුකරමින් පවතී. එම වැඩසටහනේ ඉදිරි කටයුත්තක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සමාගම් 13ක් අපනයනකරුවන් සමඟ සම්බන්ධ කරවන ලදී.
- ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව Print care Pvt Ltd (Slick) සමඟ සහයෝගිතාවයෙන් කාන්තා මූලික ව්‍යාපාර සඳහා 2023 මාර්තු 3, 15 සහ 18 යන දිනවලදී පහත වැඩසටහන් සංවිධානය කරන ලදී.
    - ඇසුරුම්කරණය ඔස්සේ සන්නාමකරණය මැයෙන් මාර්ගගත ක්‍රමය ඔස්සේ වූ දැනුම බෙදාගැනීමේ පැය දෙකක වැඩමුළුවක් කාන්තා ව්‍යවසායකයන් 54 දෙනෙකු සඳහා 2023 මාර්තු 03 දිනැතිව පවත්වන ලදී.
    - කාන්තා ව්‍යවසායකයන් 14 දෙනෙකු විසින් ''ඇසුරුම්කරණය ඔස්සේ සිය නිෂ්පාදන සඳහා සන්නාම ලබාදීමේ සිය සැලසුම්'' මැයෙන් වූ ස්වකීය ඉදිරිපත් කිරීම් 2023 මාර්තු 15 දිනැතිව විනිශ්චය මඬුල්ලක් හමුවේ ඉදිරිපත් කරන ලදී.
    - සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවයක් සහ කුඩා ප්‍රදර්ශනයක් 2023 මාර්තු 18 දින ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ දී පැවති අතර Print care Pvt Ltd (Slick) විසින් ජයග්‍රාහකයන් සය දෙනෙකු සඳහා සහතික පත්‍ර සහ ත්‍යාග පිරිනමන ලදී. මීට අමතරව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා පවතින මුද්‍රණ සහ ඇසුරුම්කරණ විසඳුම් සම්බන්ධයෙන් පළමු මට්ටමේ අත්දැකීමක් ලබාගැනීම සඳහා කාන්තා ව්‍යවසායකයන් 14 දෙනෙකු සඳහා කැළණියේ පිහිටි Print care Pvt Ltd (Slick) ආයතනය වෙත ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලදී. තීරුබදු රහිත ආනයන පහසුකම හරහා අවශ්‍ය කරන අමුද්‍රව්‍ය ලබාගැනීම පිණිස සියලු සමාගම් රේගුව වෙත යොමුකරන ලදී.

6 ජනාධිපති අපනයන සම්මාන

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කළ 25 වැනි ජනාධිපති අපනයන සම්මාන උත්සවය, ගරු ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2023 නොවැම්බර් මස 23 දින පවත්වන ලදී. සම්මානලාභීන් වෙත වටිනා ජනාධිපති සම්මානය සහ සහතික පත්‍රය පිළිගන්වන ලද අතර සම්මානලාභීන්ට වසර තුනක කාලසීමාවක් සඳහා අලෙවි ප්‍රවර්ධන මෙවලමක් ලෙස සම්මාන ලාංඡනය භාවිතා කිරීමේ වරප්‍රසාදය හිමි ය.

මෙම වර්ෂයේ සම්මාන උත්සවයේ දී මූල්‍ය වර්ෂ දෙකක්, එනම් 2021/22 සහ 2022/23 සඳහා හොඳම අපනයනකරුවන් හඳුනා ගැනීමට නියමිත ය. සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම සමස්ත සම්මාන 13ක් සහ නිෂ්පාදන/සේවා ක්ෂේත්‍ර සම්මාන 51 ක් වශයෙන් ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ සම්මාන ප්‍රදානය කරනු ලැබේ. තව ද අයදුම්කරුවන්ගේ කාර්යසාධන මත පදනම්ව, විනිසුරු මඬුල්ල විසින් තීරණය කරන පරිදි සම්මාන ලැබීමට සුදුසුවන ක්ෂේත්‍ර සඳහා ද කුසලතා සම්මාන පිරිනමන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාම ගිය විනිසුරුවරයකුගේ ප්‍රධානත්වයෙන් යුතු විශිෂ්ට විනිසුරු මඬුල්ලක් විසින් සම්මාන සඳහා තේරීම් සිදුකරනු ලැබේ.

නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ අපනයන පුළුල් කිරීම සඳහා නව ක්‍රමෝපාය දියත් කරන ලදී. ඒ අනුව, වෙළඳපොළ විවිධාංගීකරණය, නිෂ්පාදන විවිධාංගිකරණය, නවෝත්පාදන, අගය එකතු කිරීම්, ලෝකය වෙත දේශීය සන්නාම හඳුන්වා දීම, අපනයනයේ දී තිරසර ප්‍රයත්නයන්, කලාපීය අගය දාමවල සංවර්ධනය වැනි ක්ෂේත්‍ර ආශ්‍රිතව අපනයනකරුවන් විසින් නව මූලාරම්භයන් සිදුකර තිබේ.

7 අපනයන ආශ්‍රිත ප්‍රකාශන

- "Sailing Around Sri Lanka's Blue Economy" යන මාතෘකාව ඔස්සේ Business Lanka Magazine නැමති සඟරාව සම්පාදනය වෙමින් පවතී.
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සංඛ්‍යාලේඛන ප්‍රකාශනය වන “Export Performance Indicators 2022”, එහි වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කර තිබෙන අතර අන්තර්ජාලය ඔස්සේ මිලදී ගැනීමේ පහසුකම් ද සලසා ඇත.

8 අපනයනකරුවන්ගේ සංසදය

වෙළඳ කටයුතුවල මෙහෙයුම් සහ ප්‍රතිපත්තිමය කරුණුවලට අදාළව ව්‍යාපාරික ප්‍රජාව සහ අපනයනකරුවන් මුහුණ දෙස සුවිශේෂී ගැටලු විසඳීම සඳහා පොදු වේදිකාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයනකරුවන්ගේ සංසදයක් සංවිධානය කරන ලදී. 23 වැනි වරටත් පැවති අපනයනකරුවන්ගේ සංසදයේ රැස්වීම ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023 නොවැම්බර් 02 වැනි දින පවත්වන ලදී.

එම සැසිය අතරතුර දී, අදාළ ගැටලු අටක් සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර, මීට අදාළ ක්‍රියාමාර්ග දැනට කෙරීගෙන යමින් පවතී.

මීට අමතරව, ගෝලීය වෙළඳ අවකාශය තුළ තරඟකාරී අයුරින් පැවතීමට සවිබල ගැන්වීමේ හිතකර පරිසරයක් ගොඩනැඟීමේ ප්‍රමුඛ අරමුණින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අනෙකුත් රේඛීය නියෝජිතායතන සමඟ සහයෝගීතාවයෙන් අපනයනකරුවන් විසින් මුහුණ දෙන මූල්‍ය ගැටලු විසඳීම සඳහා පහසුකම් සපයන ලදී.

9 ඊ-වෙළඳපොළ - ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ප්‍රවර්ධනය කිරීම

වෙළඳපොළ ප්‍රවේශය, ව්‍යාපාරික - ව්‍යාපාරික සහ ව්‍යාපාරික - පාරිභෝගික ගනුදෙනු ඉහළ නැංවීමේ සහ ඊ-වාණිජ්‍යය කරා යොමුවීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ අනෙකුත් ව්‍යවසායකන්ට පහසුකම් සැලසීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා අපනයනකරුවන්ගේ ජාතික ප්‍රවේශය ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිය වෙබ් අඩවිය වන www.srilankabusiness.com ප්‍රවර්ධනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකරන සේවා සැපයුමේ කාර්යක්ෂමතාවට වැඩිදියුණු කිරීම සඳහා සිදුකරන අනෙකුත් තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා.

- ජනාධිපති අපනයන සම්මාන 2023 ට අදාළව වෙබ් අඩවි නාමාවලියක් සකස් කිරීම සහ ජනාධිපති අපනයන සම්මාන 2023ට අදාළව නිෂ්පාදන අංශයේ ඇගයීම් සඳහා වාර්තාවක් සකස් කිරීම. මෙහි අයදුම්පත් දත්ත කළමනාකරණය සඳහා SQL දත්ත සමුදායක් සකස් කිරීම.
- ප්‍රදර්ශන අවස්ථා සඳහා සහභාගිකයන් ලියාපදිංචි කිරීම සහ EDB Open Day සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ලියාපදිංචි කරවීම සඳහා මාර්ගගත අයදුම්පත් දෙකක් සකස් කිරීම.
- අපනයනකරුවන්ගේ විස්තර යාවත්කාලීන කිරිම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ලබාදෙන අයදුම්පත.
- සේවක පුහුණු කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම.
- EDB ජංගම යෙදුම සැකසීම.
- මූල්‍ය අංශය සඳහා ණය වාර්තාව සැකසීම.
- සේවකයන්ගේ පුහුණු විස්තර වාර්තාවක් නිර්මාණය කිරීම.
- සේවක කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම.
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවකයන්ගේ Payroll Slip Transaction පද්ධතිය වැඩිදියුණු කිරීම.
- මණ්ඩලයේ වෙබ් අඩවිය වෙත ප්‍රවේශවන පිරිස සම්බන්ධ තොරතුරු (EDB Visitor tracking System) යාවත්කාලීන කිරීම
- EDB Slip Transaction Database යාවත්කාලීන කිරීම.

- Learning Management System උපයෝගී කරගෙන අපනයන සහ ආනයන කාර්ය පටිපාටි පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලා දෙකක් (162 වැනි සහ 163 වැනි කණ්ඩායම්) සහ ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් පැතිකඩ පිළිබඳ පාඨමාලාව (94 වැනි කණ්ඩායම) යන පාඨමාලා මාර්ගගත ආකාරයෙන් පැවැත්වීම.

ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායික සැලසුම් අංශය

10 ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කෙටි සහ මධ්‍ය කාලීන වශයෙන් ගත යුතු පියවරවල සාරාංශයක් 2022-2024

අපනයන ඉපැයුම් වැඩිකිරීම දිරිගැන්වීමේ සහ ජාතියේ ආර්ථික ප්‍රගමනය දිරිගැන්වීමේ අභිප්‍රායෙන් ශ්‍රී ලංකාවේ අපනයනවල වර්ධනය සහ ප්‍රවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටී. නෛතික වශයෙන් බලය පැවරී ඇති ප්‍රමුඛතම වෙළඳ ප්‍රවර්ධන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ජාත්‍යන්තර වෙළඳාමට අදාළ සියලු කටයුතු සඳහා කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරනු ලැබේ. ප්‍රතිපත්ති උපදේශක, අධීක්ෂක, ප්‍රවර්ධක, පහසුකම් සපයන්නා සහ දැනුම් සම්පාදකයා වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සිය භූමිකාව ඉටු කරන අතර අපනයන දිරිගැන්වෙන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අඛණ්ඩව පහසුකම් සලසන අතරම අපනයන හිතකාමී පරිසරයක් ගොඩනංවන අතර ජාතික අපනයන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා නව්‍ය ක්‍රමෝපාය ක්‍රියාත්මක කරනු ලැබේ.

1. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා සඳහා ගෝලීය වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම

- සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ඉලක්කගත ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන ආදී අවස්ථා සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය ලබාදීමට කටයුතු සංවිධානය කිරීම.
- තෝරාගත් වෙළඳපොළවල් තුළ ආමුඛ සහ ප්‍රතිමුඛ වෙළඳ දූත ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම.
- කාලීන වශයෙන් වැදගත්කමකින් හෙබි වෙළඳපොළ තොරතුරු ලබාදීම.
- අපනයනකරුවන් සමඟ ගැනුම්කරුවන් සම්බන්ධ කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ එතෙර පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම.
- හඳුනාගත් ක්ෂේත්‍ර සඳහා මාර්ගගත සම්මන්ත්‍රණ සහ මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ව්‍යාපාරික හමු පැවැත්වීම.
- ද්විපාර්ශවික සහයෝගිතාවයන් සඳහා එතෙර ශ්‍රී ලංකා තානාපති කාර්යාල සහ මෙරට පිහිටි විදේශ රටවල තානාපති කාර්යාල සමඟ අඛණ්ඩව අවශ්‍ය සංවාදවල නිරතවීම.
- දැනට ක්‍රියාත්මක වන නිදහස් වෙළඳ ගිවිසුම්, ඒකාබද්ධ ආර්ථික සහයෝගිතා, වෙළඳ හා ආයෝජන රාමුගත ගිවිසුම්/ වරණීය පහසුකම්, අවබෝධතා ගිවිසුම් ආදිය සම්බන්ධිත කටයුතු.

2. ශ්‍රී ලංකාවේ සන්නාමය ප්‍රචලිත කිරීම සහ ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ස්ථානගත කිරීම

- Cassia වලින් ශ්‍රී ලංකාවේ කුරුඳු වෙන්කර හඳුනාගැනීම සඳහා “Pure Ceylon Cinnamon” වෙළඳ ලකුණ ප්‍රවර්ධනය කිරීම.
- “Ceylon Spice” සන්නාමය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.
- ආරක්ෂිත භූගෝලීය දර්ශකයක් ලෙස ශ්‍රී ලංකාවේ කුරුඳු ප්‍රවර්ධනය කිරීම.
- 2024-2027 කාල පරිච්ඡේදය සඳහා වන ජාතික අපනයන සන්නාම ප්‍රවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

3. වෙළඳ තොරතුරු සහ කාලීන වැදගත්කමකින් හෙබි වෙළඳපොළ තොරතුරු

- වෙළඳ තොරතුරු, වෙළඳපොළ තොරතුරු, ඊ-වාණිජ්‍යය සේවා සහ අපනයන ආශ්‍රිත ප්‍රකාශන ව්‍යාප්ත කිරීම.
- Business Lanka Magazine සහ Sri Lanka Exporters Directory ප්‍රකාශයට පත්කිරීම.
- ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම.

4. මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පෙනී සිටීම වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපාරවලට සහාය ලබාදීම

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය ඔස්සේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රවර්ධනය කිරීම.
- ගෝලීය වශයෙන් වෙළඳ කටයුතුවල ගතිකයන්ගේ වෙනස්වීම්වලට අදාළ දැනුම්දීම් නිකුත් කිරීම.

5. අපනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම

- අපනයනකරුවන්ට සහාය ලබාදීමේ කාර්යය සඳහාම වෙන්වූ "HELP DESK" ක්‍රියාත්මක කිරීම.
- අපනයනකරුවන්ගේ සංසද හරහා ඔවුන්ගේ ගැටලු විසඳීම.
- ජනාධිපති අපනයන සම්මාන ඔස්සේ අපනයනකරුවන් සඳහා ගරුත්වය පිරිනැමීම.
- පිහිටුවන ලද උපදේශක කමිටු අධීක්ෂණය කිරීම (24).
- ආනයන/අපනයන කාර්ය පටිපාටි, ජාත්‍යන්තර වෙළඳාම සහ අපනයන ඇසුරුම්කරණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- අපනයන කටයුතුවලට අදාළ විෂයන් සහ ව්‍යවසායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ සහ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

6. ගුණාත්මකබව වැඩිදියුණු කිරීම

- අගය එකතු කළ නිෂ්පාදනවල අපනයනයන් සඳහා තිරසර පද්ධති සංවර්ධනය කිරීම සඳහා විභව්‍ය ව්‍යවසායකයින්/ පර්යේෂණ මධ්‍යස්ථාන සහ දැනට සිටින අපනයනකරුවන් අතර සහයෝගීතාවයන් සඳහා පහසුකම් සැලසීම.
- ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකර්මාන්තයේ අගය දාමය පිළිබඳ ප්‍රතිරූපයේ විශ්වසනීයත්වය සහ සුරක්ෂිතබව ආරක්ෂා කිරීම.
- ජාතික කාබනික පාලන ඒකකය (NOCU) ක්‍රියාත්මකවීම සඳහා පහසුකම් සැලසීම.
- ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය

7. අපනයන අගය දාමය සඳහා ප්‍රාදේශීය දායකත්වය ඉහළ නැංවීම

- ප්‍රාදේශික වශයෙන් සිටින විභව්‍ය අපනයනකරුවන්/ ව්‍යවසායකයන් හඳුනාගැනීම.
- ඔවුන් අපනයනකරුවන් වශයෙන් හැඩගැස්සවීම සඳහා ධාරිතා සංවර්ධනය.
- ජාත්‍යන්තර ප්‍රමිති සහ රටවල්/ වෙළඳපොළ වශයෙන් පවතින අනෙකුත් අවශ්‍යතාවලට අනුව නිෂ්පාදන සකස් කිරීම සහ අනුකූලතාවය.
- අපනයන වෙළඳපොළ තුළට ප්‍රාදේශීය වශයෙන් සිටින අපනයනකරුවන් හඳුන්වා දීම.
- නව අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් සහ කාන්තා ව්‍යවසායකයන් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

8. එක ගමකින් එක් නිෂ්පාදනයක් වැඩසටහන (One Village One Product Programme) හරහා අපනයන සැපයුම්වල පදනම වැඩිදියුණු කිරීම

- නිෂ්පාදන හඳුනාගැනීම සහ තෝරාගැනීම.
- හඳුනාගත් නිෂ්පාදන සඳහා යෝග්‍ය භූගෝලීය ප්‍රදේශ හඳුනාගැනීම.
- පොකුරු සහ ඇඳුම්ගත වශයෙන් අපනයනකරුවන් පෙළ ගැස්සවීම.
- ඔවුන් අපනයනකරුවන් ලෙස මනාව හැඩගැස්සවීම සඳහා ධාරිතා සංවර්ධනය.
- ජාත්‍යන්තර ප්‍රමිති සහ රටවල්/ වෙළඳපොළ වශයෙන් පවතින අනෙකුත් අවශ්‍යතාවලට අනුව නිෂ්පාදන සකස් කිරීම සහ අනුකූලතාවය.

✓ **ජාතික අයවැය 2023**

- පූර්ණ වශයෙන්ම අපනයන කාර්යය සඳහා පමණක්ම ත්‍රෛයිලෝක විජයපත්‍ර භෝගය නිෂ්පාදනය කිරීමේ විභවය පරීක්ෂාකර බැලීම.
- ප්‍රවර්තන ජාතික අපනයන ක්‍රමෝපාය (National Export Strategy - NES) 2023-2024 සමාලෝචනය කිරීම සහ සංශෝධනය

ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායික සැලසුම් අංශය

11 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ නව සැලසුම්

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2024 වර්ෂය සඳහා සැලසුම් කළ අපේක්ෂිත අපනයන ඉලක්කය ඇ.ඩො.බිලියන 16.4 ක් වන අතර මෙය වෙළඳ භාණ්ඩ සහ සේවා අංශ යන අපනයන ක්ෂේත්‍ර දෙකම සඳහාම වේ. වෙළඳ භාණ්ඩ අපනයනවලින් අපේක්ෂිත ආදායම ඇ.ඩො.බිලියන 12.8 ක් වන අතර සේවා අංශයේ අපනයනවලින් අපේක්ෂිත ආදායම ඇ.ඩො.බිලියන 3.6කි.

මෙම ඉලක්කය සාක්ෂාත් කරගැනීම සඳහා වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාමාර්ග වර්තමාන ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් අභ්‍යන්තරික වශයෙන් සකස් කළ නව ආයතනික සැලැස්මේ දක්වා ඇති පහත ක්‍රමෝපායික අරමුණු හා අනුගත වේ.

- ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සහ සේවා සඳහා සුවිශේෂී ප්‍රතිරූපයක් ගොඩනැංවීම.
- ඉහළ අගය එකතු කිරීමක් සහ සන්නාමකරණයක් සමඟ නිෂ්පාදන සහ සේවාවල අපනයන අගය ඉහළ නැංවීම.
- දැනට පවතින ඉහළ ගුණාත්මකබවකින් හා වටිනාකමකින් යුතු භාණ්ඩ අපනයන කෙරෙන වෙළඳපොළවල් (premium markets) ස්ථාවර කරගනිමින්, විභවතාවයක් සහිත සුවිශේෂී කාණ්ඩගත වෙළඳපොළවල් (niche markets) වෙත සිදුකරන අපනයන ඉහළ නැංවීම.
- මනා වෙළඳපොළ ප්‍රවේශයක් සමඟින් කලාපීය අගයදාම ජාලයන් සමඟ ඒකාබද්ධවීම.
- අපනයන ක්ෂේත්‍රය සඳහා අගය දාම ක්‍රියාකාරකම්වල දායකත්වය වැඩිදියුණු කිරීම.
- පුළුල් පදනමකින් යුතු අපනයන භාණ්ඩ සංයුතිය සහ අපනයනකරුවන්ගේ ප්‍රජාව.
- කාර්යක්ෂම, පාරදෘශ්‍ය සහ පිරිවැය ඵලදායි අයුරින් රටවල් හරහා වෙළඳ කටයුතු සිදුකිරීම සහතික කරලීම සඳහා වෙළඳ පහසුකම් සැලසීම.
- ජාත්‍යන්තර රෙගුලාසි සහ ප්‍රමිත සමඟ අනුකූලවීම සඳහා අපනයනකරුවන් දිරිගැන්වීම සහ පාරිසරික, සමාජ සහ පාලන (ESG) මූලධර්මවල සාමූහික වාසි අත්පත් කරගැනීම.
- සේවක ඵලදායිතාවය සහ කැපවීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරමින් හරාත්මක අගයන් මත පදනම් වූ සේවක කණ්ඩායමක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය තුළ ගොඩනැංවීම.

ඉහත දැක්වූ කරුණුවලට අමතරව, ප්‍රමුඛ අවධානිත ක්ෂේත්‍රයක් වනුයේ අපනයන සඳහා ශක්‍යතාවය සහිත පරිසරයක් ගොඩනැංවීම සඳහා පහසුකම් සැලසීම යි.

- 12 -

මූල්‍ය ප්‍රකාශන

2023

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	සටහන	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු.	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2022.12.31 රු.
ආදායම			
ආදායම්	(3)	628,648,002	478,466,579
අනෙකුත් ආදායම්	(4)	85,718,546	101,573,893
මුළු ආදායම		714,366,548	580,040,472
වියදම්			
අපනයන සංවර්ධන වියදම්	(5)	317,891,972	145,840,677
පරිපාලන වියදම්	(6)	400,232,173	356,889,269
ආයෝජන හා අනෙකුත් ලැබීම් සඳහා හානිකරණ වෙන්කිරීම්	(7)	2,550,431	(137,446,488)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වියදම් ඉක්මවූ ආදායම		(6,308,028)	214,757,014
මූල්‍ය වියදම්	(8)	115,321	133,224
වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින්		(6,423,349)	214,623,790
ආශ්‍රිත සමාගමේ ලාභය/(අලාභය) කොටස		90,189,877	4,233,297
		83,766,528	218,857,087
අනෙකුත් විස්තීර්ණ ආදායම්			
- දේපළ, පිරියත ප්‍රත්‍යාගණනයේ ලාභය මූල්‍ය වත්කම්		-	85,996,927
ආයුගණක තක්සේරු ලාභය/අලාභය		(6,108,802)	9,475,227
වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම්		(6,108,802)	95,472,154
වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම්		**77,657,726**	**314,329,241**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	ශ්‍රී.ලං.ගි.පු 2023.12.31 රු.	ශ්‍රී.ලං.ගි.පු 2022.12.31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ, ශුද්ධ	(9)	87,928,377	101,407,909
අස්පෘශ්‍ය වත්කම් (ශුද්ධ)	(10)	3,853,702	145,298
ආශ්‍රිත සමාගම්වල ආයෝජන - ලැයිස්තුගත නොකළ	(11)	1,341,453,480	
		1,433,235,559	1,352,816,810
අනෙකුත් ජංගම නොවන මූල්‍ය වත්කම්	(12)	201,322,635	202,472,821
මුළු ජංගම නොවන වත්කම්		1,634,558,194	1,555,289,631
ජංගම වත්කම්			
තොග	(13)	3,508,758	3,225,364
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	(14)	9,675,963	12,397,592
අත්තිකාරම් හා පූර්ව ගෙවීම්	(15)	78,489,048	38,116,012
මුදල් හා මුදල් සමාන දෑ	(16)	183,450,373	121,808,990
		275,124,142	175,547,958
මුළු වත්කම්		**1,909,682,336**	**1,730,837,589**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ලැබූ ප්‍රදානයන් - හිමිකම් දායකත්වය	(17)	10,014,284	10,014,284
වියදම් ඉක්ම වූ උපචිත ආදායම		1,632,017,200	1,554,359,474
මුළු හිමිකම්		1,642,031,484	1,564,373,758
ප්‍රදානයන්			
ලැබූ ප්‍රදානයන් - අනෙකුත්	(18)	22,264,655	14,933,725
		22,264,655	14,933,725
ජංගම නොවන වගකීම්			
වෙන් කිරීම් හා අනෙකුත් වගකීම්	(19)	175,431,634	58,373,071
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්	(20)	33,998,835	27,771,814
		209,430,469	86,144,885
ජංගම නොවන වගකීම්			
අනෙකුත් ගෙවිය යුතු දෑ	(21)	35,955,728	65,385,221
		35,955,728	65,385,221
මුළු හිමිකම් හා වගකීම්		**1,909,682,336**	**1,730,837,589**

පිටු අංක 11 සිට 23 දක්වා වූ ගිණුම්කරණ ප්‍රමිත හා පිටු අංක 24 සිට 40 දක්වා වන සටහන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සැකසූ මෙම මූල්‍ය ප්‍රකාශනවලම ඒකාබද්ධ කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගකීම දරන අතර මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අතර ඒ වෙනුවෙන් අත්සන් තබනුයේ

ආචාර්ය. කින්ග්ස්ලි බර්නාඩ්	කේ.ජී.විමලෙන්තිරරාජා	රේණුකා එම්.වීරකෝන්	කේ.ඩී.පෙරේරා
සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**අධ්‍යක්ෂ මුදල්**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	හිමිකම් දායකත්වය	සංචිත පොළිය	ප්‍රත්‍යාගණනික සංචිතය	එකතුව
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	10,014,284	1,241,833,712	-	1,251,847,996
වියදම් ඉක්ම වූ ආදායම	-	228,332,313	85,996,927	314,329,240
පූර්ව වර්ෂ ගැලපුම්	-	(1,803,478)		(1,803,478)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,014,284**	**1,468,362,547**	**85,996,927**	**1,564,373,758**
වියදම් ඉක්ම වූ අතිරික්ත ආදායම	-	77,657,726	-	77,657,726
පූර්ව වර්ෂ ගැලපුම්	-	-		-
2023 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**10,014,284**	**1,546,020,273**	**85,996,927**	**1,642,031,484**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
බදුවලට පෙර වර්ෂය සඳහා අතිරික්තය		77,657,726	314,329,241
ගැලපුම් කළා			
ස්ථාවර වත්කම් ක්ෂය කිරීම		21,732,900	10,586,350
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		475,357	67,500
ආයෝජනවලින් ලද ආදායම (ලාභාංශ, පොළිය, ලාභයේ පංගුව)		(160,734,162)	(102,639,316)
මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණනිත ලාභය		-	(85,996,927)
ආයුගණක තක්සේරු ලාභය/ පාඩුව		6,108,802	(9,475,227)
පූර්ව වර්ෂය සඳහා ගැලපුම්		-	(1,803,478)
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය		(6,371,198)	(6,113,619)
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		7,029,764	(24,525,105)
කාර්ය මණ්ඩල ණය ක්‍රමක්ෂය		4,427,352	3,519,821
ගැලපුම් කළ පොළිය		(8,167,658)	3,656,960
විවිධ වත්කම් මිල දී ගැනුම්		-	81,121
ස්ථාවර වත්කම් අලෙවිය		-	(415,449)
වටිනාකමක් වශයෙන් හානිකරණය සඳහා වෙන්කිරීම්		2,550,431	(137,446,488)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)		**(55,290,686)**	**(36,174,616)**
තොග (වැඩිවීම)/ අඩුවීම		(283,394)	(567,308)
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		1,110,603	3,931,801
අත්තිකාරම් හා පූර්ව ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම		(40,373,036)	(15,112,268)
වෙන්කිරීම් හා අනෙකුත් වගකීම් වැඩිවීම/(අඩුවීම)		117,058,563	21,322,875
අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)		(29,429,493)	(10,542,428)
මෙහෙයුම්වලින් ජනිත මුදල්		**(7,207,443)**	**(37,141,944)**
ගෙවන ලද මූල්‍ය පිරිවැය			-
ගෙවන ලද නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය		(6,911,545)	(6,452,434)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්		**(14,118,988)**	**(43,594,378)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
අපනයනකරුවන්ගේ ණය ආපසු අය කර ගැනීම		146,492	626,500
ණය ආපසු අයකරගැනීම		3,804,595	1,190,418
ස්ථාවර වත්කම් අලෙවිය	3	-	415,449
දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම	9	(8,253,368)	(2,150,900)
පරිගණක මෘදුකාංග අත්පත් කරගැනීම	9	(4,183,761)	
ලැබූ ලාභාංශ	4	58,193,884	90,668,264
ලැබූ පොලී ආදායම	4	12,350,401	7,737,755
ආයෝජන ක්‍රියාකාරකම්වල උපයෝජනය කළ ශුද්ධ මුදල්		**62,058,243**	**98,487,486**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ/ (උපයෝජනය කළ)			
රජයේ ප්‍රදාන වශයෙන්/GIZ අරමුදලෙන් ලැබූ		13,702,128	2,150,900
මූල්‍ය ක්‍රියාකාරකම්වල උපයෝජනය කළ ශුද්ධ මුදල්		**13,702,128**	**2,150,900**
මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		**61,641,383**	**57,044,007**
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**121,808,990**	**64,764,983**
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**183,450,373**	**121,808,990**
මුදල් හා මුදල් සමාන දෑ වල විශ්ලේෂණය			
අතැති මුදල්	16	1,864	1,000
බැංකුවේ ඇති මුදල් - වාසිදායක	16	183,448,509	121,807,990
		183,450,373	**121,808,990**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා
පොදු තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තාකරණය සඳහා අධිකාරියේ කළමනාකාරිත්වයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල පනතේ 16 වැනි වගන්තිය (රාජ්‍ය සංස්ථා සඳහා (මුදල් පාලන) පනතේ විධිවිධාන යෙදීම) ප්‍රකාරව, මණ්ඩලයේ කළමනාකාරිත්වය පහත කරුණු සම්බන්ධයෙන් වගකීම දරනු ලැබේ.

i. අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා වගකීම් සහ අනෙකුත් සියලුම මූල්‍ය ගනුදෙනු පිළිබඳ විධිමත් ගිණුම් පොත් පවත්වාගෙන යෑම.

ii. මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සම්මත කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව ගිණුම් පිළියෙල කිරීම.

iii. මණ්ඩලයේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් හා අනෙකුත් අක්‍රමවත් ක්‍රියා වැළැක්වීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා
පොදු තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු තොරතුරු

1.1 ප්‍රතිෂ්ඨාපනය හා නෛතික ආකාරය

1979 අංක 40 දරන පනත යටතේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර ප්‍රතිෂ්ඨාපිත කර තිබේ. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, නවම් මාවතේ අංක 42 දරන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

ශ්‍රී ලංකාවේ අපනයනයන් සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමට සහ ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමේ කාර්යයෙහි ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මූලික වශයෙන් නිරත වේ.

1.3 නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 අප්‍රේල් මස 18 වැනි දින අනුමත කර තිබේ.

1.4 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් මණ්ඩලය විසින් නිකුත් කළ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින් (IFRS) නියෝජනය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට (SLFRS සහ LKAS) අනුකූලව 2023 දෙසැම්බර් 31 වන දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා සටහන් සමඟ විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්වල සාරාංශයක් ("මූල්‍ය ප්‍රකාශ") පිළියෙල කර ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරනු ලැබේ.

1.6 මිනුම්කරණයේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ අගයට නියමිත අනාවරණය කිරීම් සිදුකර ඇත්නම් හැර, මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර තිබේ. වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව සහ ඒවයේ සාපේක්ෂ ද්‍රවශීලතාවය පිළිබිඹු කිරීම අනුව පෙළගස්සවා කාණ්ඩ ගතකර තිබේ.

1.7 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, කළමනාකාරිත්වය විසින් මණ්ඩලයට සිය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යැමේ හැකියාව තක්සේරු කර ඇත. අපේක්ෂිත අනාගතය සඳහා මෙහෙයුම් කටයුතුවල පවත්වාගෙන යැම සඳහා මණ්ඩලය සතුව ප්‍රමාණවත් සම්පත් ඇති බවට කළමනාකාරිත්වයට සාධාරණ අපේක්ෂාවක් පවතී. අනාගතය සම්බන්ධයෙන් පවතින සියලු තොරතුරු අවධානයට යොමුකළ විට, ඇවර කිරීමට හෝ මෙහෙයුම් කටයුතු නැවත්වීම සඳහා අවශ්‍යතාවයක් මණ්ඩලයට කලින් දැනගත නොහැකි ය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මණ්ඩලය විසින් අඛණ්ඩ පැවැත්ම සංකල්පය අඛණ්ඩවම යොදාගනු ඇත.

1.8 විශේෂිත ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් එහි වාර්තාකරණ දිනයට ආදායම්, වියදම්, වත්කම් හා වගකීම්වල වාර්තාවන අගයන් හා අවිනිශ්චිත වගකීම් මත බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන සිදුකිරීම අවශ්‍ය කෙරේ. එසේ වුව ද, මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවය හේතුවෙන් අනාගතයේ දී බලපාන වත්කම් හෝ වගකීම්වල ධාරණ අගයන් වෙත ප්‍රමාණාත්මක ගැලපුමක් සිදුකිරීමට අවශ්‍ය ප්‍රතිඵල ඇතිකරවයි. මෙම සාධකවලට තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන ඇතුළත් විය හැකි ය.

1.9 ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම්වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමක් හටගන්නා සුවිශේෂී අවදානමක් සහිත අනාගතයට අදාළ ප්‍රධාන උපකල්පන හා වාර්තාකරණ දිනයට අවිනිශ්චිතතාවය ඇස්තමේන්තු කිරීමේ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර පහත සාකච්ඡා කෙරේ.

(අ) *<u>මූල්‍ය උපකරණවල සාධාරණ අගය</u>*

ශේෂ පත්‍රයේ වාර්තා වන මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්වල සාධාරණ අගය, සක්‍රිය වෙළඳපොළවල් වලින් ව්‍යුත්පන්න කළ නොහැකි විටක දී, තක්සේරු කිරීමේ විවිධ ශිල්පීය න්‍යාය භාවිතා එය නිර්ණය කරන අතර මීට වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ආකෘතිය සහ/හෝ ගණිතමය තක්සේරු ක්‍රම ආදිය ඇතුළත් ය. හැකි අවස්ථාවවලදී නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්තවලින් මෙම ආකෘති සඳහා යෙදවුම් ව්‍යුත්පන්න කරගන්නා නමුදු, නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත නොමැති විටක දී, සාධාරණ අගය තහවුරු කිරීම සඳහා විනිශ්චයන් අවශ්‍ය කෙරේ.

මෙම සාධක සම්බන්ධයෙන් සිදුකරන උපකල්පනවල වෙනස්වීම් මූල්‍ය උපකරණවල වාර්තාකළ සාධාරණ අගය මත බලපෑ හැකි ය.

(ආ) *<u>නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් තක්සේරු කිරීම</u>*

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 19 යටතේ දී උපචිත වගකීම් හා විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්වල ප්‍රවර්තන සේවා වියදම නිර්ණය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා ගැනීම අවශ්‍ය කෙරේ. මෙම ක්‍රමයේ අරමුණ වනුයේ, විවිධ ආයුගණක උපකල්පන ද සැලකිල්ලට ගෙන, සැලසුම යටතේ වන සෑම සේවකයෙකුගේම ප්‍රතිලාභ ඔවුන් විසින් උපචිත කරගනු ලබන විට දී වියදම් දැරීම යි. මෙහි දී යොදාගන්නා ප්‍රවේශය වනුයේ විශ්‍රාම යෑම, සේවයෙන් ඉල්ලා අස්වීම, මරණය සහ පූර්ණ දුබලතාවයක් හේතුවෙන් සෑම තනි සාමාජිකයෙකු වෙත ගෙවිය යුතු ප්‍රතිලාභයේ උපචිත අගය ඇස්තමේන්තු කිරීම යි. සෑම සාමාජිකයෙකු සඳහාම වූ ඇස්තමේන්තුගත උපචිත ප්‍රතිලාභ ඉන් අනතුරුව තක්සේරුකරණ දිනයට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ආයුගණක වර්තමාන අගය ගණනය සඳහා එකතු කරනු ලැබේ. වෙනත් වචනවලින් කියහොත්, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමක වර්තමාන අගය යනු සේවකයෙකුගේ වර්තමාන හා පූර්ව කාල පරිච්ඡේද සේවා කාලය හේතුවෙන් ප්‍රතිඵල වන බැඳීමක් පියවීම සඳහා අවශ්‍ය කරන අපේක්ෂිත අනාගත ගෙවීම්වල ආයුගණක වර්තමාන අගය යි.

2023/12/31 දිනැතිව සිදුකළ ආයුගණක තක්සේරුව මත පදනම්ව නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම්වල පිරිවැය නිර්ණය කරනු ලැබී ය. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශේෂ පත්‍ර දිනට ධාරණ අගය රු. 33,998,835 කි.

(ඇ) <u>සාධාරණ අගය</u>

සාධාරණ අගය යනු දන්නා, කැමැත්තක් දක්වන පාර්ශව අතර එකී පාර්ශව සඳහා එසේ කිරීම සඳහා කිසිදු බලකිරීමක් සිදුනොවූ ගනුදෙනුවක දී එකඟවන ලද ප්‍රතිෂ්ඨාවක අගය යි. යම් මූල්‍ය උපකරණයක් මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ දී, එහි සාධාරණ අගය යනු ගෙවනු ලබන හෝ ලැබෙන ප්‍රතිෂ්ඨාවේ වටිනාකම යි. මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව, සක්‍රිය වෙළඳපොලකදී මූල්‍ය වත්කමක සාධාරණ අගය වශයෙන් සාමාන්‍යයෙන් දැක්වෙනුයේ ලංසු අගය වන අතර, සක්‍රිය වෙළඳපොලකදී මූල්‍ය වගකීමක් සඳහා සාධාරණ අගය වශයෙන් සාමාන්‍යයෙන් දැක්වෙනුයේ ඒ සම්බන්ධයෙන් ඉල්ලා සිටින මිල යි. කෙටි කාල සීමාවක් සහිත මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන වැනි මූල්‍ය උපකරණ සඳහා, මෙවැනි උපකරණවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය වේ.

2. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 වත්කම් හා ඒවා තක්සේරු කිරිමේ පදනම

ජංගම වත්කම් වශයෙන් ශේෂ පත්‍රයේ වර්ගීකරණය වන වත්කම් වනුයේ මුදල් හා බැංකු ශේෂ සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක දී හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත යන දෙකින් කෙටි කාල සීමාව තුළ මුදල් බවට පත්කළ හැකි දෑ ය.

2.2 මූල්‍ය උපකරණ

2.2.1 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

පසුව ක්‍රමක්ෂය පිරිවැයට, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හෝ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට හෝ මෙම ද්විත්ව පදනම ඔස්සේම මිනුම්කරණය වන මූල්‍ය වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 09 අනුව පහත කාණ්ඩවලට වර්ග කෙරේ:

(අ) මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වන අස්තිත්වයේ ව්‍යාපාරික ආකෘතිය සහ

(ආ) මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ අනුව

මුල් හඳුනාගැනීමේ අවස්ථාවේ දී කළමනාකාරීත්වය විසින් වර්ගීකරණය කිරීම තීරණය කරන අතර ආයෝජන අත්පත් කරගනු ලැබුවේ කුමන කාර්යයකට ද යන්න මත එය රඳා පවතී.

2.2.2 වර්ගීකරණය, හඳුනාගැනීම සහ මිණුම්කරණය

(i) පහත කොන්දේසි දෙකම සම්පූර්ණ කෙරේ නම්, මූල්‍ය වත්කමක් ***ක්‍රමක්ෂය පිරිවැයට*** මිනුම්කරණය කළ හැක:

(අ) ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා මූල්‍ය වත්කම් රඳවාගැනීම අරමුණු වූ ව්‍යාපාරික ආකෘතියක් තුළ එහි රඳවා ගැනෙන මූල්‍ය වත්කම්, සහ

(ආ) හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධන මුදල මත පොලී ගෙවීම් නියෝජනය කරන ආකාරයේ නිශ්චිතව දක්වන දිනවලදී මුදල් ප්‍රවාහ ඉහළ යෑමට හේතුවන මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි සහිත වීම.

(ii) පහත කොන්දේසි දෙකම සම්පූර්ණ කෙරේ නම්, මූල්‍ය වත්කමක් අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට මිනුම්කරණය කළ හැක:

(අ) මූල්‍ය වත්කම් රඳවාගැනීම අරමුණු වූ ව්‍යාපාරික ආකෘතියක් තුළ දී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සහ මූල්‍ය වත්කම් අලෙවිය යන දෙකම ඔස්සේ සිය ව්‍යාපාරික අරමුණු ඉටු කර ගැනීම, සහ

(ආ) හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධන මුදල මත පොලී ගෙවීම් නියෝජනය කරන ආකාරයේ නිශ්චිතව දක්වන දිනයන් වලදී මුදල් ප්‍රවාහ ඉහළ යැමට හේතුවන මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි සහිත වීම.

(iii) ක්‍රමක්ෂය පිරිවැයට හෝ අනෙකුත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කර නොමැති මූල්‍ය වත්කමක් *ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට* මිනුම්කරණය කළ යුතු ය.

2.2.3 සාධාරණ අගය නිර්ණය කිරීම

ණය ගුණාත්මකතාවය, ද්‍රවශීලතාවය හා පිරිවැය සැලකිල්ලට ගෙන ගිවිසුම්ගතව එකඟ වූ මුදල් ප්‍රවාහ පදනම මත වර්තමාන අගය ආකෘතිය භාවිතා කරමින් ණය හා අත්තිකාරම් මෙන්ම වගකීම්වල සාධාරණ අගය නිර්ණය කෙරේ.

ධාරණ අගය අඩු කළ වෙළඳ ලැබිය යුතු හා ගෙවිය යුතු දෑවල ක්‍රමක්ෂය වෙන්කිරීම් ඒවායේ ආසන්නතම සාධාරණ අගයට උපකල්පනය කෙරේ.

2.2.4 ප්‍රතිවර්ගීකරණය

වත්කම් කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාරික ආකෘතිය වෙනස් කරන අවස්ථාවේ සහ එම අවස්ථාවේ දී පමණක් බලපෑමට ලක්වන සියලු මූල්‍ය වත්කම්, යථොක්ත මූල්‍ය වත්කම් කාණ්ඩවලට අනුව නැවත වර්ගීකරණය කිරීම අවශ්‍ය කෙරේ.

2.2.5 හානිකරණය

(අ) *ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්වල ධාරණ අගය*

සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වී ඇත්දැයි සම්බන්ධයෙන් විෂය මූලික සාක්ෂි තිබෙද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වීම හෝ හානිකරණ පාඩුව වනුයේ වත්කමක මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවීමක් හෝ සිදුවීම් වැඩි ගණනක් ('හානි සිදුවීමක්') සිදු වූ බවට හා එකී හානි සිදුවීම (සිදුවීම්) ඔස්සේ මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහවලට බලපෑමක් වන බවට විශ්වසනීය අයුරින් ඇස්තමේන්තු කළ හැකි විෂය මූලික සාක්ෂි තිබේ නම් පමණි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වූ බවට සැලකෙන විෂය මූලික සාක්ෂි යටතට පහත සිද්ධි සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට ගැනෙන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වේ:

- නිකුත් කරන්නා හෝ ණයකරු සම්බන්ධිත සුවිශේෂී මූල්‍ය අසීරුතාවයක්;
- ගෙවීම් පැහැර හැරීම සහ ඒ සම්බන්ධිත යුතුකම් පැහැර හැරීම වැනි කොන්ත්‍රාත් ගිවිසුම් කඩකිරීම;

- නිකුත් කරන්නා හෝ ණයකරු බංකලොත්බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත් විය හැකි බවට වන සම්භාවිතාවය;
- මූල්‍ය අසීරුතා හේතුවෙන් සලකනු ලබන මූල්‍ය වත්කම සඳහා පවතින සක්‍රිය වෙළඳපොළ ඉවත්වීම; හෝ
- මූල්‍ය වත්කම් කාණ්ඩයක මුල් හඳුනාගැනීමේ සිට ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහවල මිනුම්කරණය කළ හැකි අඩුවීමක් දැක්වෙන නිරීක්ෂණය කළ හැකි දත්ත.

වෙන් වෙන් වශයෙන් සුවිශේෂී වන මූල්‍ය වත්කම් සඳහා හානිකරණ වෙන් වෙන් වශයෙන් පවතී ද යන්න පිළිබඳ විෂය මූලික සාක්ෂි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පළමුව තක්සේරු කරනු ලැබේ. වෙන් වෙන් වශයෙන් තක්සේරු කළ මූල්‍ය වත්කමක් සඳහා සැලකිය යුතු හෝ නොවන හානිකරණ පවතී ද යන්න පිළිබඳ විෂය මූලික සාක්ෂි නොමැති බවට මණ්ඩලය විසින් තීරණය කළහොත්, එකී වත්කම සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුළ අන්තර්ගත කිරීම සහ සාමූහික හානිකරණ සඳහා තක්සේරු කිරීම සිදුකරනු ලැබේ. හානිකරණය සඳහා වෙන් වෙන් වශයෙන් තක්සේරු කළ වත්කම් සඳහා හානිකරණ අඛණ්ඩව හඳුනාගත හැකි නම් එකී වත්කම් සාමූහික හානිකරණ සඳහා තක්සේරු කිරීම තුළ අන්තර්ගත නොකෙරේ.

හානිකරණ අලාභ ණය හෝ ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය පිරිවැයෙහි ධාරණ අගයට වැය දරා ඇති බවට විෂය මූලික සාක්ෂි තිබේ නම්, මූල්‍ය වත්කමෙහි මුල් බලාත්මක පොලී අනුපාතිකයට වට්ටම කළ වත්කමෙහි ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය(දරා ඇති අනාගත හානි ණය හැර) අතර වෙනස වශයෙන් හානියේ වටිනාකම මිනුම්කරණය කෙරේ. දීමනා ගිණුමක් භාවිතයෙන් වත්කමක ධාරණ අගය අඩු කෙරෙන අතර, හානි වන අගය ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ. සාමූහික හානිකරණ ඇගයීමේ කාර්යය සඳහා මූල්‍ය වත්කම් සමාන ණය අවදානම් සහිත යන පදනමින් කාණ්ඩ කෙරේ.

ඉන් අනතුරුව කාල පරිච්ඡේදයක දී, හානිකරණ අලාභ අඩුවී එකී අඩුවීම විෂයනිශ්‍රිත වශයෙන් හානිකරණය හඳුනාගත් දිනය පසු සිද්ධියකට සම්බන්ධ කළහැකි නම් (වැඩිදියුණු වූ ණය ශ්‍රේණිගතවීම වැනි), පූර්ව වශයෙන් හඳුනාගත් හානිකරණ අලාභය, දීමනා ගිණුම ගැලපුම් කිරීමෙන් ප්‍රතිවර්තනය කෙරේ. එසේ ප්‍රතිවර්තනය කළ අගය ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

(ආ) *අනෙකුත් මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය*

අනිශ්චිත ඵලදායි ජීව කාලයක් සහිත වත්කම් ක්‍රමක්ෂය සඳහා බඳුන් නොවන අතර එකී වත්කම් වාර්ෂිකව හානිකරණය සඳහා පරීක්ෂා කෙරේ. ධාරණ අගය ආපසු ලබාගත නොහැකිබවට හැඟෙවෙන සිද්ධි හෝ වාතාවරණයන්ගේ වෙනස්වීමක් සිදුවන ඕනෑම අවස්ථාවක දී ක්‍රමක්ෂය සඳහා බඳුන්වෙන වත්කම් හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය ඉක්මවා යන අගයේ වටිනාකමට හානිකරණ පාඩුව හඳුනාගැනේ. ආපසු අයකරගත හැකි අගය යනු වත්කමක සාධාරණ අගයෙන් විකිණීම සහ භාවිතා අගය සඳහා පිරිවැය අඩුකළ පසු වැඩි අගය යි. හානිකරණය තක්සේරු කිරීම සඳහා, වත්කම් ඒවායේ වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි මුදල් ප්‍රවාහ ඇති මට්ටම දක්වා අවම මට්ටමට කාණ්ඩ කෙරේ (මුදල් උත්පාදන ඒකක).

2.2.6 හඳුනාගැනීම අත්හැරීම

මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන පරිද්දෙන් මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) පහත සඳහන් අවස්ථාවන්හි දී හඳුනාගැනීම අත්හැරේ:

- වත්කම් මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය ඉකුත් වී තිබීම.
- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය මණ්ඩලය විසින් පවරා ඇති විටෙක හෝ සමනය කරගැනීමේ ආකාරයක් වශයෙන් ලැබෙන මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශවයකට ගෙවීමට බැඳීමක් ඇති කරගෙන අවස්ථාවක දී; හෝ නැතහොත්

(අ) වත්කමක සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙසින් මණ්ඩලය විසින් පවරා ඇති විටක, හෝ

(ආ) වත්කමට අදාළ සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ සැලකිය යුතු මට්ටමකට මණ්ඩලය විසින් පැවරීම හෝ රඳවාගැනීම සිදු නොකර, නමුත් වත්කමක පාලනය පවරා ඇති විටක.

මණ්ඩලය විසින් වත්කමක් මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය වෙනත් පාර්ශවයකට පවරා ඇතිවිට හෝ මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශවයකට ගෙවීම සඳහා බැඳීමක් ඇතිකරගත් විට, සහ වත්කම්වලට අදාළ සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ සැලකිය යුතු මට්ටමකට මණ්ඩලය විසින් පැවරීම හෝ රඳවාගැනීම සිදු නොකර, නමුත් වත්කම්හි පාලනය පවරා ඇති විටක, වත්කමෙහි කටයුතු සම්බන්ධයෙන් මණ්ඩලයේ අඛණ්ඩ සහභාගිත්වයේ ප්‍රමාණය අනුව අදාළ වත්කම හඳුනාගනු ලැබේ. එවැනි අවස්ථාවක දී, මණ්ඩලය විසින් ආශ්‍රිත වගකීමක් ද හඳුනාගනු ලබයි. මණ්ඩලය විසින් රඳවා ගනු ලැබූ අයිතීන් හා වගකීම් පිළිබිඹු වන ආකාරයක පදනමකින් පවරනු ලැබූ වත්කම් හා ආශ්‍රිත වගකීම් මනිනු ලැබේ. පවරනු ලැබූ වත්කමක් සඳහා ඇපයක ආකාරයෙන් පවත්නා අඛණ්ඩ සහභාගිත්වයක් වත්කමෙහි මුල් ධාරණ අගයේ අවමය හා මණ්ඩලය විසින් ආපසු ගෙවීම අවශ්‍ය විය හැකි ප්‍රතිෂ්ඨාවේ උපරිම අගය අනුව මනිනු ලැබේ.

2.2.7 මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කරනුයේ, එසේ එම අගයන් හිලව් කිරීම සඳහා මණ්ඩලයට නීතිමය අයිතියක් පවතී නම් හා ශුද්ධ පදනමක් මත පියවීම හෝ එක්වර වත්කම් උපලබ්ධිවීම හා වගකීම් පියවීම සඳහා අපේක්ෂා කරන්නේ නම් පමණි.

2.3 දේපළ, පිරියත හා උපකරණ

2.3.1 හඳුනාගැනීම හා මිනුම්කරණය

දේපළ, පිරියත හා උපකරණ අයිතම සමුච්චිත ක්ෂයකිරීම් සහ හානිකරණයන් අඩුකර පිරිවැය හෝ තක්සේරු අගයට ගිණුම්ගත කෙරේ. මෙම පිරිවැයට වත්කම අත්පත් කරගැනීම සඳහා සෘජුවම අදාළ වන වියදම් ද ඇතුළත් වේ. ස්වයං- නිර්මිත වත්කමක පිරිවැයට එය සෑදීම සඳහා යොදාගත් ද්‍රව්‍යවල පිරිවැය හා සෘජු ශ්‍රමය, එහි අපේක්ෂිත භාවිතය සඳහා වන ක්‍රියාකාරි තත්ත්වයට රැගෙන ඒම සඳහා සෘජුවම අදාළ වන වෙනත් පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත හා උපකරණවල ප්‍රතිසංස්කරණය හෝ වත්කම්වලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සඳහා අලුත්වැඩියා හෝ නඩත්තු කිරීම සඳහා වන වැය දැරීම් වියදම් වශයෙන් ඒවා වැය කරන අවස්ථාවේ දී හඳුනාගැනේ.

2.3.2 පසුකාලීන පිරිවැය

ප්‍රධාන පරීක්ෂා කිරීම් හා කොටස් කර පිරික්සුම් ද ඇතුළුව දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන වියදම් වෙන්ව ගිණුම්ගත කරන අතර, කල්බදු කාල සීමාව තුළ දී ප්‍රාග්ධනීකරණය කර කපා හැරේ. අනෙකුත් පසුකාලීන පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනුයේ එම කොටස තුළ අන්තර්ගත වී ඇති අනාගත ආර්ථික වාසි මණ්ඩලය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් ඇතිවිට හා එය විශ්වාසනීය අයුරින් මිනුම්කරණය කළහැකි නම් පමණි. දේපළ, පිරියත හෝ උපකරණවල දෛනික සේවා කිරීම් වැය දැරූ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

2.3.3 ක්ෂය කිරීම්

දේපළ, පිරියත හා උපකරණවල වැය/ තක්සේරුව මත සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ක්ෂයකිරීම් සඳහා වෙන්කිරීම් ගණනය කෙරේ. ඉඩම් හැර සියලුම දේපළ, පිරියත හා උපකරණ ඒවායේ ඵලදායි ජීව කාලය මුළුල්ලේ පහත දැක්වෙන ප්‍රතිශතවලට අදාළ වන අගයවල් වලින් කපා හැරීම සඳහා වාර්ෂිකව ක්ෂය කරනු ලැබේ.

අවුරුදු 10ට වඩා නොපැරණි මෝටර් වාහන	10%	අවුරුදු 10ට වඩා පැරණි මෝටර් වාහන	20%
පරිගණක	20%		
පරිගණක උපකරණ	25%	රූපවාහිනී උපකරණ	10%
දුරකතන ස්ථාපනය කිරීම්	20%	ගෘහභාණ්ඩ හා සවි කිරීම්	10%
නේවාසික දුරකතන	10%	කාර්යාලීය උපකරණ	10%
PABX පද්ධතිය	10%	KIOSK පද්ධතිය	20%
අනෙකුත් උපකරණ	33 1/3%		

මිලදී ගනු ලැබූ දිනයේ සිට ආරම්භ වන පරිද්දෙන් සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ක්ෂය කිරීම් සිදුකරනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 16 හි දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂයේ දී ලබාගත හැකි ප්‍රශස්තතම තොරතුරු මත පාදකව දේපළ, පිරියත හා උපකරණවල ආර්ථික ජීව කාලය යළි තක්සේරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් දේපළ, පිරියත හා උපකරණ සඳහා ක්ෂය කිරීමේ අනුපාතය වෙනස්විය. වත්කම්වල ඵලදායි ජීවකාලය වෙනස්වීමේ මගින් ඇති වූ ප්‍රතිඵලය 2012 වර්ෂයේ සිට ඉදිරියට වන පරිද්දෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කරන ලදී.

2.3.4 හඳුනාගැනීම අත්හැරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතම බැහැර කිරීම හෝ එහි භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරක අවස්ථාවේ දී ඒවා හඳුනා ගැනීම අත්හරිනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණයක් බැහැර කිරීමේ දී ඇතිවන ලාභය හෝ අලාභය තීරණය කරනු ලබන්නේ එහි විකුණුම් ආදායම හා වත්කමේ ධාරණ අගය අතර වෙනස වශයෙන් වන අතර එය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදී ම, එහි ස්පෘශ්‍ය වත්කම්වලට හානිකරණ පාඩුවක් සිදුවී ඇති බවට ඇඟවීමක් තිබේ ද යන්න නිර්ණය කරගැනීම සඳහා මණ්ඩලය විසින් එහි ස්පෘශ්‍ය වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඇඟවීමක් පවතී නම්, හානිකරණ පාඩුවේ ප්‍රමාණය (එසේ පවතී නම්) නිර්ණය කිරීම සඳහා වත්කමේ ආපසු අය කරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කෙරේ. තනි වත්කමක ආපසු කරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කිරීම සිදුකළ නොහැකි නම්, එකී වත්කම අයත්වන මුදල්-උත්පාදන ඒකකය සඳහා අය කරගත හැකි වටිනාකම නිර්ණය කෙරේ.

සාධාරණීය හා සංගත පදනමකින් වෙන්කිරීම් හඳුනාගත හැකි නම්, වත්කම් තනි මුදල්-උත්පාදන ඒකකවලට ද වෙන්කළ හැකි ය. එසේ නැත්නම් එකී වත්කම් කුඩාතම මුදල්-උත්පාදන ඒකක සමූහයකට වෙන්කරන අතර එහිදී සාධාරණීය හා සංගත පදනමකින් වෙන්කිරීම් හඳුනාගත හැකි ය.

ආපසු අයකර ගත හැකි අගය යනු විකුණුම් පිරිවැය හෝ භාවිත අගය අඩුකළ සාධාරණ අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය යි. භාවිත අගය තක්සේරු කිරීමේ දී මුදලේ කාල අගය හා වත්කමට සුවිශේෂී වූ අවදානම්වල ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරු පිළිබිඹු කරන බදුවලට පෙර වට්ටම් අනුපාතියක් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

වත්කමක (හෝ මුදල් ජනන ඒකකයක) ආපසු අයකර ගත හැකි වටිනාකම එහි ධාරණ අගයට වඩා අඩු බවට ඇස්තමේන්තු ගත කරයි නම්, වත්කමේ (හෝ මුදල් ජනන ඒකකයේ) ධාරණ අගය එහි ආපසු අයකර ගත හැකි වටිනාකමට අඩු කරනු ලැබේ. හානිකරණ පාඩුව ප්‍රත්‍යාගණනිත අඩු වීමක් ලෙස සැලකෙන අවස්ථාවක් වන අදාළ වත්කම ප්‍රත්‍යාගණනිත වටිනාකමට දක්වන්නේ නැතහොත්, හානිකරණ පාඩුව වහාම ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

2.3.6 පුනරාවර්තන වියදම් (විවිධ වත්කම්) ලෙස වාර්තා කෙරෙන ප්‍රමාණාත්මක නොවන ජංගම නොවන වත්කම්වල පිරිවැය)

දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 16) ඔස්සේ "අමතර කොටස් හා සේවා කිරීමේ උපකරණ තොග ලෙස දැක්වෙන අතර භාවිතයට ගන්නා විට ලාභ හෝ අලාභවල දී හඳුනාගනී " ලෙසින් මඟ පෙන්වයි.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නඩත්තු පිරිවැය/ තොරතුරු තාක්ෂණයට අදාළ අමතර කොටස් ආදිය ඇතුළුව සියලු කුඩා වටිනාකම්වල වැය අයිතමයන් විවිධ වත්කම්වල පිරිවැය ලෙස එම පිරිවැය දරන අවස්ථාවේ ගිණුම් ගත කිරීම සිදුකරනු මිස, ස්ථිර වත්කම්වල අගය සමඟ සංසන්දනය කිරීමේ දී ප්‍රමාණවත් නොවන හෙයින් ස්ථිර වත්කම්වල පිරිවැය කොටසක් ලෙස ගිණුම්ගත නොකෙරේ.

2.4 ආශ්‍රිත සමාගම්වල ආයෝජන - ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ආශ්‍රිත සමාගමක ආයෝජනය මුලින් පිරිවැයට හඳුනාගන්නා අතර අත්පත් කරගත් දිනයෙන් පසු ආයෝජිතයාගේ ලාභයෙන් හෝ අලාභයෙන් මණ්ඩලයේ පංගුව හඳුනාගැනීම සඳහා ධාරණ අගය ඉහළ හෝ පහළ දැමීම සිදුවේ (හිමිකම් ක්‍රමය). ධාරණ අගයට සිදුකරන ගැලපුම් (දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමෙන් හෝ විදේශ විනිමය හුවමාරු වෙනස්කම් හේතුවෙන් ඇතිවන වෙනස්වීම්) ආයෝජිතයා වෙත මණ්ඩලයේ සමානුපාතික අයිතිය යටතේ 2013 වර්ෂයේ සිට ඉදිරියට හඳුනාගනු ලබන අතර මෙය පැන නඟිනුයේ ආයෝජිතයාගේ අනෙකුත් විස්තීර්ණ ආදායම්වල වෙනස්වීම් හේතුවෙනි.

2.5 අස්පෘශ්‍ය වත්කම්

(අ) වත්කමට අදාළ සේවා විභවයෙන් අපේක්ෂිත ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම්; සහ

(ආ) වත්කමෙහි පිරිවැය හෝ සාධාරණ අගය විශ්වාසනීය අයුරින් මැනිය හැකි නම්

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනී.

LKAS 38ට අනුකූලව අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීම සඳහා මණ්ඩලය විසින් පිරිවැය ආකෘතිය යොදා ගනී. පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් යටතේ වර්ගීකරණය කර ඇති අතර එහි ඵලදායී ජීව කාලය මුළුල්ලේ ක්‍රමානුකූල පදනමකින් ක්ෂය ප්‍රමාණ වෙන් කෙරේ. අදාළ වන ක්‍රමක්ෂය අනුපාතිකය 25% කි.

2.6 තොග

පිරිවැය හෝ ශුද්ධ ආපසු ලබාගත හැකි අගයෙන් අඩු අගයට සියලුම තොග අගය කෙරේ. පළමුව ලැබී ඇති තොග පළමුව නිකුත් කළ යුතුය (FIFO) මත පදනම්ව පිරිවැය නිර්ණය කෙරේ.

2.7 අනෙකුත් වත්කම්

අනෙකුත් ණයකරුවන් හා ලැබිය යුතු දෑ, අත්තිකාරම්, තැන්පතු, පූර්ව ගෙවීම්, ලැබිය යුතු බදු අනෙකුත් වත්කම් යටතට ඇතුළත් වේ.

(අ) <u>අත්තිකාරම්, තැන්පතු, කලින් ගෙවූ වියදම්</u>
එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා වාසි හා සබඳතාවයක් සහිත යැයි සැලකෙන වියදම් අත්තිකාරම්, තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කෙරේ. කාලයට සමානුරූපී ආකාරයෙන් එයට අදාළ වන කාල සීමාව මුළුල්ලේ එවැනි වියදම් කපා හැරේ.

(ආ) <u>අනෙකුත් ණයකරුවෝ</u>
හානිකරණ අලාභයෙන් පිරිවැය අඩුකර අනෙකුත් ණයකරුවන් හඳුනාගනී.

2.8 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් සහ පහසුවෙන් දන්නා මුදල් ප්‍රමාණ බවට පරිවර්තනය කළ හැකි හා වටිනාකමේ වෙනස්වීම් සම්බන්ධයෙන් නොසැලකිය යුතු අවදානමකට යටත්වන කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතා ආයෝජනවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ. කෙටි කාලීන මුදල් බැඳීම් සපුරා ගැනීම සඳහා මේවා පවත්වා ගනී.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් හා ගෙවීමට ඇති බැංකු අයිරා හැර බැංකුවල ඇති ශුද්ධ තැන්පතු ප්‍රමාණය වේ. කෙටිකාලීන කල්පිරීම් සහිත ආයෝජන එනම්, අත්පත් කරගත් දිනයේ සිට මාස තුන හෝ ඊට අඩු ආයෝජන ද මුදල් සමාන දෑ වශයෙන් සැලකේ. ඒකාබද්ධ ශේෂ පත්‍රයේ දී, බැංකු අයිරා දැක්වෙනුයේ ණය ගැනුම් ඇතුළත ජංගම වගකීම් යටතේ ය.

2.9 මූල්‍ය වගකීම්

2.9.1 මූල්‍ය වගකීම් වර්ගීකරණය

පහත සඳහන් මූල්‍ය වගකීම් හැර, අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පසු අවස්ථාවේ දී ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කළ වශයෙන් හඳුනාගැනේ:

(අ) ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කළ මූල්‍ය වගකීම්, එවැනි වගකීම්, වගකීම් වන ව්‍යුත්පන්නයන් ද ඇතුළුව පසු අවස්ථාවේ දී සාධාරණ අගයට මිනුම්කරණය කළ යුතු ය.
(ආ) මූල්‍ය වත්කමක් පවරනු ලබන අවස්ථාවේ දී හඳුනාගැනීම බැහැර කිරීම සඳහා සුදුසුකම් නොලබනවිට හෝ අඛණ්ඩ සහභාගි ප්‍රවේශය අදාළ වීමෙන් හට ගන්නා මූල්‍ය වගකීම්.
(ඇ)මූල්‍ය ඇපකරු කොන්ත්‍රාත්
(ඈ) වෙළඳ පොළ පොලී අනුපාතිකයට වඩා අඩු පොලී අනුපාතිකයක් යටතේ ණයක් සැපයීම සඳහා බැඳීම්.

ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 09 විෂය පථය තුළ වන මූල්‍ය බැරකම් අදාළ වන පරිද්දෙන් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කළ මූල්‍ය වගකීම් හෝ ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. මුල් හඳුනාගැනීමේ අවස්ථාවේ දී මණ්ඩලය විසින් එහි මූල්‍ය වගකීම්වල වර්ගීකරණය නිර්ණය කරනු ලැබේ.
මණ්ඩලයේ මූල්‍ය වගකීම්වලට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුළත් වේ.

2.9.2 අනෙකුත් වගකීම්

අනෙකුත් වගකීම්වලට උපචිත වියදම් ඇතුළත් වේ. මෙම වගකීම් ඒවායේ ඓතිහාසික අගයට සඳහන් කරන අතර එය ඒවායේ සාධාරණ අගය වශයෙන් සැල කේ.

2.10 රජයේ ප්‍රදාන

ප්‍රදාන ඒවායේ සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශවල හඳුනාගනී. යම් ප්‍රදානයක් වියදමකට අදාළ වේ නම්, එහි වියදම සමඟ අනුරූපී වීමට අවශ්‍ය කාලසීමාව මුළුල්ලේ ආදායමක් ලෙස හඳුනාගන්නා අතර, මෙය ක්‍රමානුකූල පදනමකින් හානිපූරණය සඳහා අපේක්ෂිත ය.

වත්කම්වලට අදාළ ප්‍රදාන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ විලම්බිත වශයෙන් හඳුනාගන්නා අතර වත්කමෙහි ප්‍රයෝජ්‍ය කාලය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

2016 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත *LKAS 20* - රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම හා රජයේ සහාය අනාවරණය කිරීම ප්‍රකාරව, රජයේ අරමුදල් භාවිතාකරමින් මණ්ඩලයේ සංවර්ධන අයවැය යටතේ මිලදී ගත් ස්ථාවර වත්කම්වල පිරිවැය, රජයේ ප්‍රදාන ගිණුමට මාරු කරන අතර ඒවයේ ඵලදායි ජීවකාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ (ක්ෂය අනුපාතිකයට සමානව).

මණ්ඩලය ස්ථාපනය කරන අවස්ථාවේ පහත ආයතනවලින් මණ්ඩලයට පැවරුනු වත්කම් සහ මණ්ඩලය වෙත ඉන් අනතුරුව මිලදී ගත් වත්කම් රජයේ ප්‍රදානවල වටිනාකමින් පිළිබිඹු වේ.

රජයේ දායකත්වය	-	රු.	7,904,002
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දායකත්වය	-	රු.	2,110,282
රජයේ ප්‍රදාන - මොටර් වාහන	-	රු.	3,162,227
රජයේ ප්‍රදාන - අනෙකුත්	-	රු.	19,102,428
එකතුව	-	රු.	32,278,939

2.11 සේවක ප්‍රතිලාභ

නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ආඥා පනත් හා රෙගුලාසිවලට අනුකූලව සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ (EPF) ට සහ සේවක භාරකාර අරමුදලේ (ETF) දායකත්වයන්ට සුදුසුකම් ලබයි. අධිකාරිය විසින් සේවකයන්ගේ දළ වැටුපෙන් නිශ්චිත දායකත්වයන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) වෙත ගෙවනු ලබන අතර ඊට අමතරව ගෙවීම සඳහා නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් නොමැත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් හැරුන විට පශ්චාත් රැකියා සැලසුම් වේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව, පාරිතෝෂික ගෙවීම සඳහා බැඳී සිටී. බැඳීම් හා වියදම් මිනුම්කරණය සඳහා ආයුගණක උපකල්පන අවශ්‍ය කරන හෙයින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගිණුම්කරණය සංකීර්ණ වන අතර, ආයුගණක ලාභ හෝ පාඩු සඳහා භව්‍යතාවයක් පවතී. තවද, බැඳීම් වට්ටම් ගත පදනමින් මිනුම් කරනු ලබන අතර මීට හේතුව වනුයේ සේවකයා විසින් අදාළ සේවය ලබා දීමෙන් වසර ගණනාවක් ගෙවී යාමෙන් අනතුරුව ඒවා පියවීම සිදුවීම යි.

වෘත්තීය උපදේශක සමාගමක් වන ස්මයිල්ස් ග්ලෝබල් පුද්ගලික සමාගම විසින් ආයුගණක තක්සේරුකරණය සිදුකරනු ලැබේ. වට්ටම් අනුපාතිකය 13%ක්, වැටුප් උද්ධමන අනුපාතිකය 2%ක්, මරණ අනුපාතිකය A67/70 Ult tables, ආපසු ගැනීමේ අනුපාතිකය 6%ක් වශයෙන් මෙම සමාගම විසින් උපකල්පන සිදුකර තිබේ.

2.12 ආදායම් බදු

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාරව,

(අ) මණ්ඩලයේ ලාභ සහ ආදායම; සහ

(ආ) අරමුදලින් මණ්ඩලය විසින් සහනාධාරයක් හෝ ආධාර මුදලක් වශයෙන් යම් තැනැත්තෙකුට ගෙවනු ලබන මුදලක්

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

2.13 ආදායම් හඳුනාගැනීම

අ. රජයේ ප්‍රදාන
රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අරමුදල් මෙමගින් නියෝජනය වේ. පුරෝකතනය කළ මුදල් ප්‍රවාහ අවශ්‍යතා මත පදනම්ව, මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත අවශ්‍ය අරමුදල් සපයනු ලැබේ. එබැවින්, මෙමගින් මණ්ඩලය වෙත ලැබූ ප්‍රදානයකට අදාළ වියදම් නියෝජනය වන අතර මෙය සාධාරණ අගයට හඳුනාගැනේ.

ආ. අනෙකුත් ආදායම්
අදාළ සේවා ඉටුකළ කාල සීමාව තුළ පැනනගින ඉන්වොයිස් ප්‍රකාරව සේවා හා තොරතුරු ලබාදීමෙන් ලැබෙන ආදායම ලැබූ ප්‍රතිෂ්ඨාවේ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ.

ඇ. පොලී ආදායම
පොලී දරන සියලුම මූල්‍ය වත්කම් සඳහා පොලී ආදායම සඵල පොලී අනුපාතික ක්‍රමවේදය භාවිතා කරමින් වාරිකය නැවත ගෙවනු ලබන අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී.

ඈ. ලාභාංශ ආදායම
ගෙවීම ලැබීමට මණ්ඩලයට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

2.14 වියදම් හඳුනාගැනීම

සියලු වියදම් දුන් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මිනුම්කරණය කරන අතර එකී වියදම් අදාළ වන කාල පරිච්ඡේදය තුළ හඳුනාගනී. ක්ෂයවීම් කාලය වෙනස් කිරීමෙන් අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලයේ වෙනස්වීම් හෝ වත්කම් තුළ ගැබ වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජනය සඳහා අපේක්ෂිත රටාව සැලකිල්ලට ගනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවේ වෙනසක් ලෙස එය සලකනු ලැබේ.

2.15 ණය ගැනීම් පිරිවැය

ණය ගැනීම් පිරිවැය යනු අරමුදල් ණයට ගැනීමේ දී මණ්ඩලය විසින් දරන පොළිය සහ අනෙකුත් පිරිවැය යි. ණය ගැනීම් පිරිවැය එකී පිරිවැය දරන කාලසීමාව තුළ පිරිවැයක් වශයෙන් හඳුනාගනී.

2.16 විදේශීය මුදල් පරිවර්තනය කිරීම/ ගනුදෙනු

ගනුදෙනු සිදුකරන අවස්ථාවේ දී පැවති විනිමය අනුපාතිකය මත, ක්‍රියාකාරී මුදල් ඒකකය හැර වෙනත් මුදල් ඒකකවලින් සිදුකරන සියලු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලින් වාර්තාකරනු ලැබේ. සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනයකට විදේශ ව්‍යවහාර මුදලින් පවතින මුදල් වත්කම් හා වගකීම් ශේෂ පත්‍ර දිනයට බලාත්මක විනිමය අනුපාතික යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් පවතින මූල්‍ය නොවන වත්කම් හා වගකීම් එකී ගනුදෙනු සිදුවූ දිනයේ පවතින විනිමය අනුපාතිකය භාවිතා කරමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. මුදල් අයිතම පියවන අවස්ථාවේ දී සහ මුදල් අයිතම නැවත පරිවර්තනය කිරීමේදී හටගන්නා විනිමය අනුපාතික වෙනස්කම් එකී වෙනස්කම් හටගන්නා වර්ෂයේදී ම ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

2.17 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

මණ්ඩලයට එහි ආශ්‍රිත සමාගම, එනම් ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමග ආශ්‍රිත පාර්ශව සබඳතාවයක් පවතී. මණ්ඩලය විසින් රජයේ තක්සේරුකරු විසින් සිදුකරන තක්සේරුවට අනුව ආශ්‍රිත සමාගම වෙත භාවිතා කරන ඉඩකඩ සඳහා මාසික කුලිය ගෙවන අතර, ශ්‍රවණාගාරය කුලියට ගැනීමේ ගාස්තු ද ගෙවනු ලැබේ.

හිටපු සභාපති සහ ප්‍රධාන විධායක සුරේෂ් ඩී ද මෙල් මහතා 2023/03/31 වැනි දින දක්වා ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වූ අතර, වර්තමාන සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී වන ආචාර්ය කිංග්ස්ලි බර්නාඩ් මහතා 2023/04/03 වැනි දින සිට ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස අලුතින් පත් කරන ලදී. ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් නම් කරන ලද අධ්‍යක්ෂවරු වශයෙන් එස්.ආර්.පී ඉන්ද්‍රකීර්ති මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය සහ පාලන), ඩී.ටී.විජේරත්න මිය - නීති නිලධාරිනී සහ කේ.ඩී.පෙරේරා මහතා - අධ්‍යක්ෂ මූල්‍ය කටයුතු කරනු ලැබේ.

2023 වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හතරක් පවත්වා තිබූ අතර එක් රැස්වීම් වාරයක් සඳහා රු.10,000 ක් බැගින් වූ සහභාගිත්ව දීමනාවක් ගෙවා තිබුණි.

ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස සමඟ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24හි (LKAS- 24) ආශ්‍රිත පාර්ශව අනාවරණය කිරීම් ප්‍රකාරව, ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස යනු මණ්ඩලයේ සැලසුම්, මෙහෙයැවීම හා ක්‍රියාකාරකම් පාලනය සඳහා අධිකාරි බලය හා වගකීම දරන පිරිස් ය.

වැ.බ. අධ්‍යක්ෂ ජනරාල් - මාලනී බැද්දේගමගේ මහත්මිය සභාපතිනිය වශයෙන්, අධ්‍යක්ෂ (මුදල්) - කේ.ඩී.පෙරේරා මහතා කළමනාකරණ අධ්‍යක්ෂ වශයෙන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අපනයන කෘෂිකර්ම අංශය) - ගයනි විජේතිලක මහත්මිය හතු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ (MDTC) අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතුවල අඛණ්ඩව නිරත වන ලදී. 2023 වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දෙකක් පවත්වා තිබූ අතර එක් රැස්වීම් වාරයක් සඳහා සභාපති වෙත රු.5,000 ක් සහ අනෙකුත් අධ්‍යක්ෂවරුන් දෙදනා වෙත රු.3,500 බැගින් වූ සහභාගිත්ව දීමනාවක් ගෙවා තිබුණි. කළමනාකාර අධ්‍යක්ෂවරයා වෙත රු.4,000ක මාසික දීමනාවක් ගෙවන ලදී.

රජය විසින් සිය අතුරු අයවැය -2022 යටතේ (අයවැය යෝජනා අංක 32) ඇසුරුම් කර්මාන්තයේ ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය (NPC) යළි සක්‍රිය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), කාර්මික තාක්ෂණ ආයතනය (ITI), ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD), ලංකා කොයිරුගේටඩ් කාටන් මැනුෆැක්චරස් සංගමය (LCCMA) හා ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය (SLIP) යන ආයතනවලින් ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය වේ.

ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයේ (NPC) සභාපති වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති ආචාර්ය කිංග්ස්ලි බර්නාඩ් මහතා පත් කරන ලද අතර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් පී.වී.ඒ.එම්.බැද්දේගමගේ මහත්මිය මණ්ඩලය නියෝජනය කරමින් ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් වශයෙන් පත් කරන ලදී. අධ්‍යක්ෂ මූල්‍ය - කුසල් ඩී.පෙරේරා මහතා ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයේ ගණකාධිකාරී වශයෙන් පත්කරන ලදී.

2.18 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

අධ්‍යක්ෂවරු විසින් සිද්ධි සම්පව අධීක්ෂණය කරන අතර යෝග්‍ය පරිද්දෙන් ශේෂ පත්‍ර දිනයෙන් පසු ප්‍රමාණාත්මක සිද්ධිවලට අදාළව ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යතානුකූලව ගැලපුම් හෝ අනාවරණය කිරීම් සිදුකරනු ලැබේ.

2.19 අසම්භව්‍ය බැරකම්

අ) අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් විභව්‍ය අනාගත බැඳීමක් හෝ අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් විභව්‍ය වර්තමාන බැඳීමක් පැවතිය ද, මෙම ගෙවීම් ද්විත්වයම සිදුකළ හැකි දැයි අවිනිශ්චිත හෝ වටිනාකම සාධාරණ අයුරින් ඇස්තමේන්තු කළ නොහැකි විට දී අසම්භව්‍ය බැරකම් අනාවරණය කෙරේ.

ආ) මණ්ඩලය සමග සිදුකළ විවිධ ගනුදෙනුවලට අදාළව මණ්ඩලය වෙත ලැබිය යුතු මුදල් යළි ලබාගැනීම සඳහා මණ්ඩලය විසින් පාර්ශව 17 කට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. මෙම ගනුදෙනු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වල **සටහන් අංක 25** යටතේ සඳහන් කර තිබේ.

2.20 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7ට අනුකූලව මුදල් ප්‍රවාහ පිළියෙල කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කරනු ලැබේ.

මුදල් නොවන ස්වභාවයේ ගනුදෙනු, පූර්ව හෝ අනාගත මෙහෙයුම් මුදල් ලැබීම් හෝ ගෙවීම් විලම්භනය හෝ උපචිත වීම් හෝ මුදල් ප්‍රවාහ මත ආයෝජන හෝ මූල්‍යායන ආශ්‍රිත ආදායම් හෝ වැය අයිතමවල බලපෑම් මගින් ගැලපුම් කළ ලාභය හෝ අලාභය වක්‍ර ක්‍රමය ඔස්සේ අනාවරණය වේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

		සටහන්	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු.	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2022.12.31 රු.
(3)	ආදායම			
	ලැබූ භාණ්ඩාගාර අරමුදල්		363,754,900	351,522,100
	GIZ අරමුදල		8,122,959	-
	සංවර්ධන කාර්යයන් වෙනුවෙන් අපනයනකරුවන්ගේ දායකත්වය		233,474,824	118,951,875
	ඊ-සේවා ආදායම		691,846	650,303
	අපනයන සංවර්ධන මණ්ඩලයේ ඊ-වෙළඳපොළ අවකාශය		60,711	114,487
	සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු		7,337,143	5,963,251
	පොත් අලෙවිය		139,275	218,735
	ස්ථාවර වත්කම් විකිණීම		-	415,449
	ජනාධිපති අපනයන සම්මාන - 2022		13,878,278	-
	අපනයනකරුවන්ගේ සේවා ආදායම		792,780	-
	Pure Ceylon Cinnamon වශයෙන් හැඳින්වෙන දේශීය කුරුඳු සඳහා වූ සන්නාමය ලියාපදිංචි කිරීම		114,000	221,567
	නැවත ආපසු නොගෙවන තැන්පතු		217,500	372,000
	විවිධ ආදායම්		63,786	36,812
			628,648,002	**478,466,579**

		සටහන්	2023.12.31	2022.12.31
(4)	අනෙකුත් ආදායම්			
	පොලී ආදායම - කාර්ය මණ්ඩල ණය		1,793,597	1,864,859
	(අඩුකළා/එකතු කළා: කාර්ය මණ්ඩල පිරිවැය (IFRS ගැලපුම්)		8,167,658	(3,656,960)
	කාර්ය මණ්ඩල ණය මත ශුද්ධ පොලී ආදායම		9,961,255	(1,792,101)
	ලාභාංශ ආදායම	**(4.1)**	58,193,884	90,668,264
	ආයෝජන මත පොලී ආදායම	**(4.1)**	10,556,804	5,872,896
	අනෙකුත් විවිධ ආදායම්		635,405	711,215
	රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය		6,371,198	6,113,619
			85,718,546	**101,573,893**

(4.1) 2023 වර්ෂයේ රඳවා ගත් බදු අඩුකළ පසු ලාභාංශ ආදායම සහ පොළී ආදායම

	ලාභාංශ ආදායම	පොලී ආදායම
දළ වටිනාකම	68,463,393	12,419,769
අඩුකළා: රඳවාගත් බදු	10,269,509	1,862,965
ශුද්ධ ආදායම	**58,193,884**	**10,556,804**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

	සටහන්	ශ්‍රී.ලං.ගි.පු 2023.12.31 රු.	ශ්‍රී.ලං.ගි.පු 2022.12.31 රු.
(5) අපනයන සංවර්ධන වියදම්			
නිෂ්පාදිත/ වෙළඳපොළ සංවර්ධන වැඩසටහන්		6,402,941	20,060,096
වෙළඳ ප්‍රදර්ශනය - විදේශීය		265,332,061	118,070,523
B2B වශයෙන් හැඳින්වෙන ව්‍යාපාරික රැස්වීම් සහ අනෙකුත් - විදේශීය		1,596,080	62,731
අපනයන වෙළඳපොළ ප්‍රවර්ධන - දේශීය		128,662	10,622
ප්‍රතිපත්ති හා සැලසුම් වියදම්		232,772	73,818
ප්‍රාදේශීය සංවර්ධන වියදම්		1,295,866	1,737
වෙළඳ තොරතුරු සහ සේවා වියදම්		10,995,691	6,584,201
GIZ වියදම්		662,950	-
Ceylon Cinnamon සන්නාමය		678,797	974,443
වෙළඳපොළ ප්‍රවේශය සඳහා සහාය යෝජනා ක්‍රමය		18,717,021	-
ජනාධිපති අපනයන සම්මාන		11,849,131	2,508
		317,891,972	145,840,677
(7) පරිපාලන වියදම්			
වැටුප් හා වේතන		125,040,742	141,071,880
අතිකාල සහ නිවාඩු දින සඳහා ගෙවීම්		8,372,384	8,207,198
ප්‍රසාද දීමනා		2,905,333	3,303,175
සේවක අර්ථසාධක අරමුදල		16,255,881	18,180,664
සේවක භාරකාර අරමුදල		3,251,176	3,636,079
පාරිතෝෂික		7,029,764	(24,525,105)
විශේෂ ජීවන වියදම් දීමනාවෙහි නොගෙවූ හිඟ මුදල්		-	6,400,487
සේවක සුභසාධන කටයුතු		13,718,796	12,623,855
වෛද්‍ය හා විවේක නිවාඩු සඳහා මුදල් ගෙවීම		7,676,371	8,740,071
බඳවාගැනීමේ ගාස්තු		387,314	182,550
විදුලිය		29,469,545	15,209,402
ජලය		1,135,845	782,198
නීති සහ අනෙකුත් වෘත්තීය ගාස්තු		1,231,501	71,388
වෙළඳ ප්‍රචාරණය		534,976	624,896
ආරක්ෂක සේවා		2,234,869	2,316,599
විගණන ගාස්තු		1,854,630	1,410,000
මුද්‍රණ ගාස්තු		251,984	150,955
ප්‍රවාහන සහ ගමන් වියදම් ගාස්තු		17,816,581	26,741,733
ප්‍රභූ රැස්වීම් වියදම්		318,070	147,802
අනෙකුත් පොදු වියදම්		192,642	303,211
කාර්ය මණ්ඩල පිරිවැය ක්‍රමක්ෂය		4,427,352	3,519,821
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ගාස්තු හා වියදම්		860,078	660,050
කාර්යාල උපකරණ නඩත්තුව		2,169,583	1,600,556
කුලී		97,887,575	88,852,626

<u>ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය</u>
<u>2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ</u>
<u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>

	සටහන්	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු.	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2022.12.31 රු.
ඉන්ධන සහ ස්නේහක		10,237,478	8,383,550
වාහන අලුත්වැඩියාව හා නඩත්තුව		5,290,587	3,703,721
පුද්ගලික පිරිස් කුලියට ගැනීමේ ගාස්තු		12,800	1,429,778
සන්නිවේදන හා දායකත්ව මුදල්		7,998,125	7,191,335
ස්ථාවර වත්කම් ක්ෂයවීම්		21,732,900	10,586,350
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		475,357	67,500
කාර්යාල ගොඩනැගිලිවලින් මාරුවීමේ වියදම්		2,519,326	-
දේශීය පුහුණු		437,989	870,182
විදේශීය පුහුණු		1,935,472	761,252
සැපයුම් අවශ්‍යතා		3,330,889	3,280,807
රක්ෂණ හා බලපත්‍ර අලුත් කිරීම්		201,540	189,950
විවිධ වත්කම් මිලදී ගැනීම		232,000	152,871
මුද්දර ගාස්තු		804,718	59,882
		400,232,173	**356,889,269**

(6) ආයෝජන හා අනෙකුත් ලැබිය යුතු දෑ හානිකරණය සඳහා වෙන්කිරීම්

හවුල් ආයෝජනයට අදාළ වෙන් කිරීම් ප්‍රතිවර්තනය කිරීම (සටහන 12.1)	1,267,160	(144,264,494)
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා අදාළ හානිකරණ වෙන් කිරීම් (සටහන 14 යටතේ දක්වා ඇත්තේ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා අදාළව දිගු කාලයක් මුළුල්ලේ දැක්වෙන හානිකරණ වෙන්කිරීම් වේ).	1,429,763	6,559,557
සේවා සඳහා ලබාදී ඇති තැන්පතු සඳහා හානිකරණ වෙන්කිරීම් (සටහන 15 යටතේ දක්වා ඇත)	-	884,949
අපනයන ණයවලට අදාළ වෙන් කිරීම් ප්‍රතිවර්තනය කිරීම (සටහන 14 යටතේ දක්වා ඇත)	(146,492)	(626,500)
	2,550,431	**(137,446,488)**

(8) මූල්‍ය පිරිවැය

මූල්‍ය ගාස්තු	115,321	133,224
	115,321	**133,224**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

-9 දේපළ, පිරියත හා උපකරණ

(9.1) පිරිවැය

2022/01/01 දිනට ශේෂය	වත්කම්	2023/01/01 දිනට ශේෂය	එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය	ඉවත්කිරීම්	2023/12/31 දිනට ශේෂය
71,726,450	මෝටර් වාහන	93,000,000	-	-	-	93,000,000
46,928,648	පරිගණක	26,992,824	5,799,042	-	-	32,791,866
2,376,546	පරිගණක උපකරණ	1,312,152	1,354,001	-	-	2,666,153
735,930	Kiosk පද්ධතිය	735,930	-	-	-	735,930
4,816,845	රූපවාහිනී උපකරණ	4,196,296	-	-	-	4,196,296
143,174	PABX උපකරණ	143,174	-	-	-	143,174
1,849,955	දුරකතන ස්ථාපිත කිරීම්	1,903,827	54,900	-	-	1,958,727
16,656,554	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	15,522,317	31,199	-	-	15,553,516
19,358,914	කාර්යාලීය උපකරණ	13,176,074	1,014,226	-	-	14,190,300
34,740	අනෙකුත් උපකරණ	34,740	-	-	-	34,740
69,240	ගෘහස්ත දුරකතන	69,240	-	-	-	69,240
164,696,997		**157,086,574**	**8,253,368**	-	-	**165,339,942**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(9.2) ක්ෂය කිරීම්

2022/01/01 දිනට ශේෂය	ක්ෂය කිරීම්	2023/01/01 දිනට ශේෂය	පූර්ව වර්ෂ සඳහා ගැලපුම්	වර්ෂය සඳහා අයකිරීම්	ඉවත්කිරීම් සඳහා ක්ෂය කිරීම්	2023/12/31 දිනට ශේෂය
62,158,933	මෝටර් වාහන	4,820,000	-	15,560,000	-	20,380,000
41,564,551	පරිගණක	22,388,895	-	2,183,352	-	24,572,247
1,866,530	පරිගණක උපකරණ	954,964	-	255,447	-	1,210,411
735,930	Kiosk පද්ධතිය	735,930	-	-	-	735,930
4,907,364	රූපවාහිනී උපකරණ	2,421,709	-	68,690	-	2,490,399
94,226	PABX උපකරණ	82,324	-	19,450	-	101,774
1,715,396	දුරකතන ස්ථාපිත කිරීම	1,773,393	-	92,360	-	1,865,753
11,458,201	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	10,654,314	-	4,232,469	-	14,886,783
17,430,617	කාර්යාලීය උපකරණ	11,743,156	-	(678,868)	-	11,064,288
33,655	අනෙකුත් උපකරණ	34,740	-	-	-	34,740
69,240	ගෘහස්ත දුරකතන	69,240	-	-	-	69,240
142,034,643		**55,678,665**	-	**21,732,900**	-	**77,411,565**

(9.2.1) **වර්ෂය සඳහා අයකිරීම්**

2023 වර්ෂය සඳහා ක්ෂය කිරීම්	18,811,638
පූර්ව වර්ෂ සඳහා වැරදි නිවැරදි කිරීම්	2,921,262
	21,732,900

	ලියා හරින ලද අගය	2023	2022
164,696,997	පිරිවැය	165,339,942	157,086,574
(142,034,643)	උපචිත: ක්ෂය කිරීම	(77,411,565)	(55,678,665)
22,662,354	ලියා හරින ලද අගය	**87,928,377**	**101,407,909**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(9.3) වාර්තා කරන දිනය වන විට ද තවමත් භාවිතයේ ඇති සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය පහත පරිදි වේ.

	2023.12.31	2022.12.31
	රු.	රු.
පරිගණක උපකරණ	801,308	606,112
පරිගණක	20,638,684	17,554,884
PABX පද්ධතිය	65,549	65,549
පරිගණක මෘදුකාංග	3,539,600	3,539,600
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	14,034,659	13,303,159
KIOSK පද්ධතිය	735,930	735,930
කාර්යාලීය උපකරණ	7,517,995	6,807,615
අනෙකුත් උපකරණ	34,740	15,240
ගෘහස්ත දූරකතන	69,240	69,240
දූරකතන ස්ථාපිත කිරීම්	1,779,474	1,691,374
රූපවාහිනී උපකරණ	2,023,606	1,411,695
	51,240,785	**45,800,399**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(10) අස්පෘශ්‍ය වත්කම්

(10.1) පිරිවැය

2022/01/01 දිනට ශේෂය	වත්කම	2023/01/01 දිනට ශේෂය	එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය	ඉවත්කිරීම්	2023/12/31 දිනට ශේෂය
6,004,481	පරිගණක මෘදුකාංග	3,809,599	4,183,761	-	-	7,993,360
6,004,481		**3,809,599**	**4,183,761**	-	-	**7,993,360**

(10.2) ක්ෂය කිරීම

2022/01/01 දිනට ශේෂය	ක්ෂය කිරීම්	2023/01/01 දිනට 01/01/2023	පූර්ව වර්ෂ සඳහා ගැලපුම්	වර්ෂය සඳහා අයකිරීම	ඉවත්කිරීම් සඳහා ක්ෂය කිරීම්	2023/12/31 දිනට ශේෂය
5,791,483	පරිගණක මෘදුකාංග	3,664,301	-	475,357	-	4,139,658
5,791,483		**3,664,301**	-	**475,357**	-	**4,139,658**

(10.2.1) **වර්ෂය සඳහා අයකිරීම්**

2023 වර්ෂය සඳහා ක්‍රමක්ෂය	503,309
පූර්ව වර්ෂ සඳහා වැරදි නිවැරදි කිරීම්	(27,952)
	475,357

	ලියා හරින ලද අගය	2023	2022
6,004,481	පිරිවැය	7,993,360	3,809,599
(5,791,483)	උපචිත: ක්ෂය කිරීම්	(4,139,658)	(3,664,301)
212,998	ලියා හරින ලද අගය	**3,853,702**	**145,298**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

		සටහන්	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු.	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2022.12.31 රු.
(11)	**ආශ්‍රිත සමාගම්වල ආයෝජන - ලැයිස්තුගත කර නොමැති**			
	ආශ්‍රිත සමාගම්වල ආයෝජන - DHPL		1,341,453,480	1,251,263,603
			1,341,453,480	**1,251,263,603**
(12)	**අනෙකුත් ජංගම නොවන මූල්‍ය වත්කම්**			
	කොටස්වල ආයෝජන	**(12.1)**	168,030,485	169,297,644
	කාර්ය මණ්ඩල ණය - ජංගම නොවන	**(14.1)**	33,292,150	33,175,177
			201,322,635	**202,472,821**
(12.1)	**කොටස්වල ආයෝජන**			
	කොටස්වල ආයෝජන		161,449,831	161,449,832
	(-) හානිකරණ අගය සඳහා වෙන්කිරීම්		6,580,654	7,847,812
			168,030,485	**169,297,644**

නම	2022/12/31 දිනට ආයෝජිත මුදල	2022/12/31 දිනට වෙන් කිරීම්	2022/12/31 දිනට අගය
කළඹු ඩොක්යාඩ් පීඑල්සී	1,258,600	(7,337,582)	8,596,182
ලංකා කැනරීස් ලිමිටඩ්	399,600	399,600	-
ලංකා ටයිල්ස් පීඑල්සී	9,950	(393,961)	403,911
එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ්	13,150,000	(145,489,356)	158,639,356
දඹදෙණිය ඊපීඩී	15,000		15,000
ලුම්බිණි ඇක්වේරියා (ප්‍රයිවට්) ලිමිටඩ්	2,200,000	2,200,000	-
සීඩබ්ජී හම්බන්තොට (ප්‍රයිවට්) ලිමිටඩ්	8,000,000	8,000,000	-
ලක් ලේටෙක්ස් සෙන්ට්‍රිෆියුජ් (ප්‍රයිවට්) ලිමිටඩ්	285,000	-	285,000
ලේටෙක්ස්එම් ග්ලවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්	158,195	-	158,195
කැළණි වැලි කැනරීස් ලිමිටඩ්	1,200,000	-	1,200,000
අනෙකුත් කොටස්	134,773,487	134,773,487	-
එකතුව	**161,449,832**	**(7,847,812)**	**169,297,644**

නම	2023/12/31 දිනට ආයෝජිත මුදල	2023/12/31 දිනට වෙන් කිරීම්	2023/12/31 දිනට අගය
කළඹු ඩොක්යාඩ් පීඑල්සී	1,258,600	(6,099,149)	7,357,749
*** ලංකා කැනරීස් ලිමිටඩ්	399,600	399,600	-
ලංකා ටයිල්ස් පීඑල්සී	9,950	(365,234)	375,184
එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ්	13,150,000	(145,489,356)	158,639,356
දඹදෙණිය ඊපීඩී	15,000		15,000
ලුම්බිණි ඇක්වේරියා (ප්‍රයිවට්) ලිමිටඩ්	2,200,000	2,200,000	-
සීඩබ්ජී හම්බන්තොට (ප්‍රයිවට්) ලිමිටඩ්	8,000,000	8,000,000	-
ලක් ලේටෙක්ස් සෙන්ට්‍රිෆියුජ් (ප්‍රයිවට්) ලිමිටඩ්	285,000	-	285,000
ලේටෙක්ස්එම් ග්ලවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්	158,195	-	158,195
කැළණි වැලි කැනරීස් ලිමිටඩ්	1,200,000	-	1,200,000
අනෙකුත් කොටස්	134,773,487	134,773,487	-
එකතුව	**161,449,832**	**(6,580,652)**	**168,030,484**

එබැවින් ආදායම් ප්‍රකාශය මත බලපෑම 1,267,160

*** ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සතු ලංකා කැනරීස් ලිමිටඩ්හි කොටස් 3,996ක් මහා භාණ්ඩාගාරය වෙත පැවරීමට සිදුවූ බැවින් එම කොටස් මත සිදුකර ඇති ආයෝජන සාධාරණ අගය මත මිනුම්කරණය කර නොමැත.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

නම	කොටස් සංඛ්‍යාව	කොටසක වෙළඳපොළ අගය	2023/12/31 දිනට කොටස්වල අගය
කළම්බු ඩොක්යාඩ් පීඑල්සී	145,698	50.50	7,357,749
ලංකා ටයිල්ස් පීඑල්සී	8,705	43.10	375,186
එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ්	1,413,772	112.21	158,639,356

එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ් සතු කොටස්වල අගය නිර්ණය කරගනු ලැබුවේ සමාන සමාගමක් පදෘ 337
336.64න් 1/3ක් පමණක් තක්සේරු කිරීම සඳහා ගන්නා ලදී. 112

*** ශ්‍රී.ල.ගි.ප්‍ර LKAS 39 ප්‍රකාරව හානිකරණය සඳහා හිමිකම් කොටස්වල සිදුකළ ආයෝජන පරීක්ෂා කරන ලදී. කළම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ ලංකා ටයිල්ස් පීඑල්සී යන සමාගම්වල කොටස් 2023.12.31 දිනට වෙළඳපොළ අගය මත මිනුම්කරණය කළ අතර එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස් ඊට සමාන සමාගමක 2022.12.31 දිනට වෙළඳපොළ අගය මත මිනුම්කරණය කරන ලදී.

2023 වර්ෂයේ දී එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඊට සමාන සමාගම යන සමාගම් ද්විත්වයම පාඩු ලබන ලදී. එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස්වල වටිනාකම හානිකරණය සඳහා පරීක්ෂා කරන ලද අතර අගය හානිකරණය සඳහා සාක්ෂි නොතිබිණි.

		සටහන්	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු.	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2022.12.31 රු.
(13)	තොග			
	ලිපිද්‍රව්‍ය		3,429,856	3,225,364
	තොග - විවිධ වත්කම්		78,902	-
			3,508,758	**3,225,364**
(14)	වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ			
	අපනයනකරුවන්ගේ ණය		38,027,520	38,174,012
	ඌව පරණගම අපනයන ප්‍රවර්ධන ගම්මාන - පාලන ගිණුම්		10,403,683	10,403,683
	(-) ණය සඳහා හානිකරණ වෙන් කිරීම්		(48,431,203)	(48,577,695)
			-	-
	කාර්ය මණ්ඩල ණය - ජංගම	**(14.1)**	7,426,425	7,607,687
	ආයෝජන සඳහා ලැබිය යුතු පොලිය		364,780	
	අනෙකුත් ණයකරුවෝ		9,874,079	11,349,462
	(-) ණය සඳහා හානිකරණ වෙන් කිරීම්		(7,989,321)	(6,559,557)
			9,675,963	**12,397,592**
(14.1)	**කාර්ය මණ්ඩල ණය (2021 වර්ෂයේ දී නැවත සඳහන් කළ වටිනාකම්)**			
	ජංගම නොවන			
	කාර්ය මණ්ඩල ණය		31,920,337	34,718,497
	පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (සටහන 14.1.2)		10,422,223	10,497,454
	අඩු කළා: වෙළඳපොළෙන් බැහැර අනුපාතික මත පොලිය සඳහා විලම්භනය කළ සාධාරණ අගය ගැලපුම්		(9,050,410)	(12,040,774)
			33,292,150	**33,175,177**
	ජංගම			
	කාර්ය මණ්ඩල ණය		8,517,037	9,523,472
	පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (සටහන 14.1.2)		1,449,904	1,498,482
	අඩු කළා: වෙළඳපොළෙන් බැහැර අනුපාතික මත පොලිය සඳහා විලම්භනය කළ සාධාරණ අගය ගැලපුම්		(2,540,516)	(3,414,267)
			7,426,425	**7,607,687**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

		සටහන්	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු.	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2022.12.31 රු.
(15)	අත්තිකාරම් හා පෙර ගෙවීම්			
	පෙර ගෙවීම් (සටහන 15.1)		71,817,890	35,409,544
	අත්තිකාරම් (සටහන 15.2)		6,199,657	2,133,092
	සේවා සඳහා තැන්පතු		1,356,450	1,458,325
	(-) ණය හානිකරණ සඳහා වෙන් කිරීම්		(884,949)	(884,949)
			78,489,048	**38,116,012**
(15.1)	පෙර ගෙවීම් - ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය		67,526,426	34,941,705
	පෙර ගෙවීම් - අනෙකුත්		4,291,464	467,839
			71,817,890	**35,409,544**
(15.2)	ජාතික අපනයන සන්නාම සකස් කිරීම සඳහා පෙර ගෙවීම්		1,894,357	-
	අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සහාය ලබාදීමේ යෝජනා ක්‍රමය 2023		1,903,440	-
	ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා අත්		667,957	-
	රෙදිපිළි සඳහා අත්තිකාරම්		1,057,500	1,432,500
	අනෙකුත් අත්තිකාරම්		676,403	700,592
			6,199,657	**2,133,092**
(16)	මුදල් හා මුදල් සමාන ද			
	කෙටි කාලීන ආයෝජන	**(16.1)**	155,581,307	63,490,411
	ලංකා බැංකුව - ලේක්විව් (306605)		27,172,951	56,944,135
	ජාතික සංවර්ධන බැංකුව		167,946	363,402
	ලංකා බැංකුව - ආයතනික ශාඛාව		523,087	1,004,290
	සම්පත් බැංකුව - මහනුවර		185	100
	සම්පත් බැංකුව - ගාල්ල		1,033	1,042
	ලංකා බැංකුව - මන්නාරම		1,500	1,583
	සම්පත් බැංකුව - කුරුණෑගල		500	527
	ලංකා බැංකුව - බැංකුව මගින් සිදුකරන තැන්පතු		-	2,500
	අතැති මුදල්		1,864	1,000
			183,450,373	**121,808,990**
(16.1)	කෙටිකාලීන ආයෝජන			
	ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව - ලේක් විව් ශාඛාව		35,581,307	53,490,411
	ඒක්ෂණ තැන්පතු - ලංකා බැංකුව - ලේක් විව් ශාඛාව		120,000,000	10,000,000
			155,581,307	**63,490,411**
(17)	ලැබූ ප්‍රදාන - **හිමිකම් දායකත්වය**			
	මහා භාණ්ඩාගාරය මගින් ලබාදුන් ප්‍රාග්ධනය		7,904,002	7,904,002
	UNDP දායකත්වය		2,110,282	2,110,282
			10,014,284	**10,014,284**
(18)	ලැබූ ප්‍රදාන			
	රජයේ දායකත්වය - මෝටර් වාහන		38,826,450	38,826,450
	රජයේ දායකත්වය - අනෙකුත්		26,924,743	24,979,643
	ප්‍රදාන - අනෙකුත්		11,757,028	-
	ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ (ITC) දායකත්වය		12,716	12,716
	අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය		202,677	202,677
	ප්‍රදාන - වෙළඳපොළ ප්‍රවේශ වැඩසටහන		939,000	939,000
	(-) රජයේ ප්‍රදානයන් ක්‍රමක්ෂය		(56,397,959)	(50,026,761)
			22,264,655	**14,933,725**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

		සටහන්	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු.	ශ්‍රී.ලං.ගි.ප්‍ර 2022.12.31 රු.
(19)	**වෙන් කිරීම් හා අනෙකුත් වගකීම්**			
	අපනයනකරුවන්ගේ දායකත්වය		166,513,106	49,484,543
	නැවත ආපසු ගෙවන තැන්පතු		8,918,528	8,888,528
			175,431,634	**58,373,071**
(20)	**විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්**			
	ඉදිරියට ගෙන ආ ශේෂය		27,771,814	68,224,580
	වර්ෂය තුළ වෙන් කිරීම්		13,138,566	(34,000,332)
	වර්ෂය තුළ ගෙවීම්		(6,911,545)	(6,452,434)
	ඉදිරියට ගෙන ගිය ශේෂය		**33,998,835**	**27,771,814**
(21)	**වෙළඳ ගෙවිය යුතු**			
	ගෙවිය යුතු මුද්දර ගාස්තු		23,760	23,285
	ගෙවිය යුතුව ඇති උපයන විට ගෙවීමේ බද්ද		175,303	742
	හිමිකම් නොඉල්ල වූ විවිධ ගෙවීම්		47,165	49,740
	සේවක අර්ථසාධක අරමුදල සඳහා ගෙවිය යුතු		2,166,535	-
	සේවක භාරකාර අරමුදල සඳහා ගෙවිය යුතු		259,984	-
	සේවකයින්ගේ අවසන් ගෙවීම්		43,997	43,997
	ගෙවිය යුතු විගණන ගාස්තු		1,546,980	1,200,000
	නැවත ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු - මුදල් අයකැමි		-	2,500
	ටෙන්ඩර්වලට අදාළව නැවත ආපසු ගෙවන තැන්පතු මුදල්		49,000	111,000
	ඉදිරිපත් නොකළ චෙක්පත් - ණය හිමියෝ		105,416	292,133
	සේවා ගිවිසුම්වලට අදාළ හිඟ හිටි වැටුප් සඳහා වෙන් කිරීම්		6,400,487	6,400,487
	අනෙකුත් උපචිත වියදම්		22,970,037	34,156,154
	පාලන ගිණුම - ජාතික අපනයන උපාය මාර්ග		124,276	434,071
	පාලන ගිණුම - වෙළඳ පොළ ප්‍රවේශ වැඩසටහන		-	18,518,654
	පාලන ගිණුම - කිතුල් නිෂ්පාදන වැඩිදියුණු කිරීම		288,122	517,475
	පාලන ගිණුම - කෝපි අපනයන ප්‍රවර්ධන ගම්මාන වැඩසටහන 202		642,213	642,213
	IP- ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය පාලන ගිණුම		-	2,992,770
	බැංකු ඇප සුරක්ෂණ	**(21.1)**	1,112,453	-
			35,955,728	**65,385,221**

(21.1) ජාතික අපනයන සන්නාම සංවර්ධන වැඩසටහන යටතේ බැංකු ඇප සුරක්ෂණවල හිමිකම්වලින් ලැබූ ඉපැයුම්.

(22) ශ්‍රී.ල.ගි.ප්‍ර LKAS 39 ප්‍රකාරව, හිමිකම් කොටස්වල සිදුකළ ආයෝජන සම්බන්ධයෙන් හානිකරණය සඳහා පරීක්ෂා කරන ලදී. කළම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ ලංකා ටයිල්ස් පීඑල්සී කොටස් 2022.12.31 දිනට වෙළඳපොළ අගය මත මිනුම්කරණය කළ අතර එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස් ඊට සමාන සමාගමක 2022.12.31 දිනට වෙළඳපොළ අගය මත මිනුම්කරණය කරන ලදී.

2023 වර්ෂයේ දී, එස්. ඒ. සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ රේණුකා ඇග්‍රි ෆුඩ්ස් පීඑල්සී යන සමාගම් දෙකම එකී වර්ෂය සඳහා අලාභ ලබන ලදී. එස්. ඒ. සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස්වල වටිනාකම හානිකරණය සඳහා පරීක්ෂා කරන ලද අතර අගය හානිකරණය සඳහා සාක්ෂි නොතිබිණි.

(23) කාර්ය මණ්ඩල ණය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවකයන් සහනදායි පොලී අනුපාතික යටතේ වන ණය පහසුකම් සඳහා හිමිකම් ලබයි. ගිණුම්කරන ප්‍රමිත IFRS 9 - "මූල්‍ය උපකරණ" ප්‍රකාරව එම ණය, වට්ටම්ගත කළ මුදල් ප්‍රවාහ යටතේ සාධාරණ අගයට පවතී. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත SLFRS 9 - "මූල්‍ය උපකරණ" ප්‍රකාරව කාර්ය මණ්ඩල ණය මුලින් සාධාරණ අගයට හඳුනාගන්නා අතර ඉන් අනතුරුව ඵලදායි පොලී අනුපාතිකය (EIR) භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැයෙන් හානිකරණ සඳහා වෙන් කිරීම් අඩුකර මිනුම්කරණය කෙරේ.

වෙන්කළ අගය හා එහි සාධාරණ අගය අතර වෙනස පෙර ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැයක් සහ සාධාරණ අගය හානිවීමක් ලෙස සලකනු ලැබේ. ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය ක්‍රමක්ෂය කරනුයේ අපේක්ෂිත සේවකයාගේ ජීව සේවා කාලය අනුවය.

සාධාරණ අගය හානිය ගණනය කරනුයේ ඵලදායි පොලී අනුපාතිකයේ අනිවාර්යෙන් පැවතිය යුතු කොටස් වන අත්පත් කරගැනීම හා ගාස්තු හා පිරිවැය මත වන වට්ටම් කිරීමක් හෝ වාරික මුදලකි. සාධාරණ අගය හානිය ලාභ හෝ අලාභ ප්‍රකාශයේ "අනෙකුත් ආදායම්" යටතේ ඇතුළත් කරගනු ලැබේ.

වට්ටම් අනුපාතිකය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් එකඟ වූ පරිදි කොමර්ෂල් බැංකුවේ සාමාන්‍ය භරිත ණය දීමේ අනුපාතිකය (AWLR) වට්ටම් අනුපාතිකය වශයෙන් යොදා ගන්නා අතර, එය ණය කාල සීමාව අනුව වෙනස් වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව 2023 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය භරිත ණය දීමේ අනුපාතිකය 14.66% කි.

කාර්ය මණ්ඩල ණය සම්බන්ධයෙන් වූ පහත කොටස්වලට අදාළ ගිණුම්කරණය SLFRS 9 සහ LKAS 19 යන ප්‍රමිත අනුව සිදු කෙරේ.

කාර්ය මණ්ඩල ණය	රු.	40,437,373
අඩු කළා: වෙළඳපොළෙන් බැහැර ණය අනුපාතික මත විලම්භිත සාධාරණ අගය මත ගැලපුම් (සටහන 23.1)	රු.	(11,590,926)
පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (සටහන 23.2)	රු.	11,872,127
කාර්ය මණ්ඩල ණය මත ශුද්ධ පොලී ආදායම	රු.	40,718,574

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

සටහන (23.1) වෙළඳපොළෙන් බැහැර අනුපාතික යටතේ වන ණය මත විලම්භිත සාධාරණ අගය ගැලපුම්

ආරම්භක ශේෂය	රු.	15,455,041
වාර්තාකරණ දිනයට පූර්ව වර්ෂ ගැලපුම්	රු.	(8,167,658)
වර්ෂය තුළ ප්‍රදානය කළ ණයවලින් සාධාරණ අගය හානිය/ (ලාභය)	රු.	4,303,543
අවසන් දළ ධාරණ අගය	රු.	11,590,926

සටහන (23.2) පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

ආරම්භක ශේෂය	රු.	11,995,936
වර්ෂය තුළ ප්‍රදානය කළ ණයවලින් සාධාරණ අගය හානිය/ (ලාභය)	රු.	4,303,543
අඩුකළා:කාර්ය මණ්ඩල ණය ප්‍රතිලාභ ක්‍රමක්ෂය	රු.	(4,427,352)
අවසන් දළ ධාරණ අගය	රු.	11,872,127

(24) ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

(24.1) ආශ්‍රිත සමාගම - ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ආශ්‍රිත පාර්ශව ගනුදෙනු වශයෙන් සලකනු ලබන නිශ්චිත ඇතැම් ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු අතරේ දී එහි ආශ්‍රිත සමාගම් වෙත, එනම් ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ගෙවීම් සිදු කරනු ලැබේ. වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ, හිඟ හිටි ශේෂ හා බැදීම් ඇතුළත් පහත ගනුදෙනු එවැනි ආශ්‍රිත පාර්ශව සමග ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකර තිබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 24 හි දැක්වෙන හෙළිදරව්කිරීමේ අවශ්‍යතා අනුව පහත විස්තර ඉදිරිපත් කෙරේ (27 වැනි පරිච්ඡේදය).

නම	ගනුදෙනු	2023 වටිනාකම (රු.)	2022 වටිනාකම (රු.)
ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස්	කුලී	85,417,958	82,674,000
(ප්‍රයිවට්) ලිමිටඩ්	විදුලිය	25,457,621	13,006,655
	ජලය	415,976	236,468
	පිරිසිදු කිරීමේ සේවා	415,991	323,011
	ශ්‍රවණාගාරය		
	කුලී පදනම මත සැපයීමේ ගාස්තු	91,345	26,375
	නිම්කම් ලැබීම් (රඳවා ගත් බදු හැර)	34,231,362	40,272,190

(24.2) ප්‍රධාන කළමනාකරණ පිරිස්

පහත සඳහන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අධ්‍යක්ෂවරුන්ගෙන් (HM කාණ්ඩය) කළමනාකරණ කමිටුව සමන්විත වන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 24 හි දැක්වෙන හෙළිදරව්කිරීමේ අවශ්‍යතා අනුව 2023 වර්ෂය සඳහා ඔවුන්ගේ සමහාර පාරිතෝෂිකය, ලබාගත් ණයවල විස්තර පහත සඳහන් ආකාරයෙන් වේ.

නම සහ තනතුර			ණය විස්තර (රු.)		
	සමහාර පාරිතෝෂිකය	අනෙකුත් පාරිශ්‍රමික	ලබා දුන් ණය	වර්ෂය තුළ ආපසු අයකරගත් ණය	2023/12/31 දිනට හිඟ හිටි මුදල
එස්.ඩී. ද මෙල් මහතා සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී	594,752	-	-	-	-
ආචාර්ය කේ.බී.ඩිගෝ කලට්ටානිරාලල සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී	1,089,070	-	-	-	-
පී.වී.ඒ.එම්.බැද්දේගමගේ මිය වැ.බ. අධ්‍යක්ෂ ජනරාල්	3,168,659	144,551	250,000	111,111	-
එස්.ආර්.පී.ඉන්ද්‍රකීර්ති මහතා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය සහ පරිපාලන)	2,948,951	146,445	237,270	43,140	125,825
කේ.ඒ.වී.ප්‍රේමතිලක මිය අධ්‍යක්ෂ	2,228,779	140,690	250,000	26,515	-
එස්.එස්.ජයවර්ධන මිය අධ්‍යක්ෂ	2,837,129	140,681	-	-	-
ඕ.එම්.සී. කුමුදුනී මිය අධ්‍යක්ෂ	2,738,285	137,605	250,000	45,455	26,515
එල්.වයි.ආර්.අයි.කොඩිකාර මිය අධ්‍යක්ෂ	1,725,609	110,365	-	-	-
ජේ.එස්.බදුගම මහතා අධ්‍යක්ෂ	2,306,291	108,095	-	-	-
කේ.ඩී.පෙරේරා මහතා අධ්‍යක්ෂ	2,306,291	108,095	-	-	-

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(25) අසම්භාව්‍ය වත්කම් හා වගකීම්

පහත දක්වා ඇති විස්තර හැර ශේෂ පත්‍ර දිනට අසම්භාව්‍ය වත්කම් හෝ වගකීම් වෙනත් කිසිවක් නොමැත.

	2023.12.31 දිනට අසම්භාව්‍ය වත්කමේ ස්වභාවය	අසම්භාව්‍ය වත්කම පැන නැගුන පාර්ශවයේ නම	විභව්‍ය/ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ රු.	මුදල් ප්‍රවාහ ගලා ඒම මිනිය නොහැකි නම්
i.	හිඟ හිට ඇති කුලී, විදුලි හා සනීපාරක්ෂක ගාස්තු නැවත ආපසු අය ගැනීම සඳහා ගොනුකර ඇති නඩුව - වෙන්නායි ට්‍රේඩ් සෙන්ටර්	ජෙම් නේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්	2,226,597	බේරුම්කරණය සඳහා නීති ගාස්තු
		යුනික් මල්ටි ආට්ස්ට්	194,143	
		සාරා ඕස් ලෙදර් (ප්‍රයිවට්) ලිමිටඩ්	1,131,017	
ii.	MASP යටතේ ලබාදී ඇති අත්තිකාරම් ගෙවීම ආපසු අයකර ගැනීම සඳහා ගොනුකර ඇති නඩුව	මොනාලිසා ප්‍රඩක්ට්ස්	2,000,000	නීති ගාස්තු
		ෆැක්ටරි ස්ටයිල් (ප්‍රයිවට්) ලිමිටඩ්	1,735,360	
		බෝම්බුවල රබර්	2,000,000	
iii.	ණය ගෙවීම පැහැර හැරීම	වර්ක්ස් ඔෆ් ආට්ස්	19,000	-
		රාජාස් ජුවලරි	90,418	-
		සිලොන් ඕනමෙන්ටල් සෙරමික්ස්	39,720	-
		සමන් ජෙම්ස් ඇන්ඩ් ජුවෙලර්ස්	73,841	-
		යුනික් මල්ටි ආට්ස්ට්ස්	157,007	-
iv.	අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගෙවා ඇති හිඟ හිටි පෙර ගෙවීම නැවත ලබා ගැනීම සඳහා ගොනුකළ නඩුව	සෝලා ග්‍රීන් ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	2,303,225	-
v.	වැටුප් ආපසු ලබාගැනීම	ඩබ්.එච්.සී.ඩබ්.ප්‍රනාන්දු	34,783	-
		ආර්.එම්.එස්.කේ.ප්‍රියංකර	26,479	-

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(27) **වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්**

(27.1) **කම්කරු අධිකරණය විසින් විශේෂ ජීවන වියදම් දීමනාව සම්බන්ධයෙන් නිකුත් කළ අවසන් තීන්දුව**

2017/10/01 වන දින සිට ගෙවීම අත්හිටුවා ඇති විශේෂ ජීවන වියදම් දීමනාවට අදාළ කම්කරු ආරවුල් ගැටලුව සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් අවසන් තීරණයක් ප්‍රකාශයට පත් කර තිබේ.

එම කම්කරු උසාවි තීන්දුව ප්‍රකාරව, 2023/03/21 වැනි දින සිට මෙම විශේෂ ජීවන වියදම් දීමනාව සඳහා සේවකයන් 49ක් සුදුසුකම් ලබන අතර 2022.12.31 වැනි දිනට මුළු වගකීම වනුයේ රු. 6,400,487 කි.

ඉහත බේරුම්කරණ තීරණය ප්‍රදානය කිරීමට එරෙහිව රිට් ආඥාවක් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත 2024/02/29 වැනි දිනැතිව රු. 4,915,890.89ක් තැන්පත් කරන ලදී.

- 13 -

විගණකාධිපති වාර්තාව

2023

විගණකාධිපති විසින් 2024 අගෝස්තු 06 දිනැති අංක TAC/E/EDB/FS/2023/25 දරන ලිපිය මඟින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙත යොමුකළ එම මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සිංහල පරිවර්තනය

සභාපති
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

....

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 (LKAS 08) හි 42 වැනි ඡේදයට පටහැනිව, රු. 2,949,214 ක සමුච්චිත වටිනාකමකින් යුතු දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීමට අදාළ පූර්ව වර්ෂ වැරදි, සමාලෝචිත වර්ෂය තුළ දී ගැලපුම්කර තිබුණි.

(ආ) විගණනය සඳහා කොටස් සහතික ඉදිරිපත් නොකළ හෙයින් රු.35,431,905 ක් වශයෙන් පැවති කොටස් ආයෝජන සහ රු. 35,273,710 ක වටිනාකමකට ඒ මත සිදුකළ හානිකරණය ද තහවුරු කළ නොහැකි විණි.

(ඇ) 1994 වර්ෂයේ දී ව්‍යාපෘතියක් සඳහා නැවත ආපසු නොගෙවන රජයේ කොටස වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත සිදුකළ රු. 49,250,000 ක ගෙවීම කොටස්වල ආයෝජනයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) පුද්ගලික සමාගමක කොටස් 1,413,772 ක වෙළඳපොළ අගයට අදාළව මණ්ඩලය විසින් සිදුකර තිබූ රු. 13,150,000 ක ආයෝජනය, 2023 දෙසැම්බර් 31 වැනි දිනට රු. 158,639, 356 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, මෙය 2022 දෙසැම්බර් 31 වැනි දිනට එහි වෙළඳපොළ අගය විය. එසේ වුව ද, කොටස්වල වෙළඳපොළ අගය ගණනය කිරීමේ පදනමෙහි නිරවද්‍යතාවය විගණනය වෙත තහවුරු කර නොතිබූ බැවින්, 2023 දෙසැම්බර් 31 වැනි දිනට කොටස්වල වෙළඳපොළ අගය යනු 2022 දෙසැම්බර් 31 වැනි දිනට කොටස්වල වෙළඳපොළ අගයම බව විගණනයට තහවුරු නොවිණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත්, මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීම යි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නොමැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විසින් මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දීමෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්;

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා සිදුවන බැවිනි.

- මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට මණ්ඩලය විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ සිදුකිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් කරුණු හැර, යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව;

නීති/ විධානයට යොමුව	විස්තරය
(ආ)	මණ්ඩලය විසින් ප්‍රවාහන දීමනා සඳහා හිමිකම් නොලබන එහි PL, MA සහ JM

	2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අංක 01/2015	කාණ්ඩවල සේවකයන් 162 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රවාහන දීමනා වශයෙන් රු. 13,975,608 ක් ගෙවා තිබුණි.
(ඇ)	මුදල් රෙගුලාසි 756(6)	යම් වර්ෂයකට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව එළඹෙන වර්ෂයේ ජූනි 15 වැනි දිනට ප්‍රථමයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, මණ්ඩලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මෙම වාර්තාවේ දිනය වන විට ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් කරුණු හැර, මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර නොමැති බව;

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා තිබූ අනුමැතිය ලබා දී නොතිබුණ ද, මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ 1985 වර්ෂයේ සිට 4.2%ක පොලී අනුපාතිකයක් යටතේ කාණ්ඩ හතරකින් සමන්විත කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරමින් පවතින අතර 2023 දෙසැම්බර් 31 වැනි දිනට කාර්ය මණ්ඩල ණය ශේෂය රු.41,554,053 කි.

(ආ) මණ්ඩලයේ ස්ථිර තනතුරක වසර 25ක් සම්පූර්ණ කර ඇති සේවකයන්ට ඔවුන් විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ සේවයෙන් ඉල්ලා අස්වීමේ දී පවුම් භාගයක වටිනාකමකින් යුතු රන් කාසියක් ත්‍යාග වශයෙන් පිරිනැමීම සිදුකර ඇති අතර, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී මේ සඳහා රු.595,600ක් වැය කර තිබූ අතර මේ සම්බන්ධයෙන් ද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අනුමැතිය නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් කරුණු හැර, මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව;

(අ) මණ්ඩලයේ හිමිකාරිත්වය යටතේ නොපවතින ඉඩමකට සහ මණ්ඩලය පිහිටා ඇති ගොඩනැගිල්ලේ මහල් කුලියට ලබාදීම සඳහා තක්සේරු වාර්තා දෙකක් ලබාගැනීමට සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලය විසින් රු.1,043,150 ක වැයක් දරා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් කොටස් හිමිකාරිත්වය සඳහා ආයෝජන සිදුකර තිබූ සමාගම්වල පැවැත්ම සම්බන්ධයෙන් අඛණ්ඩව පසුවිපරම් කිරීමේ ක්‍රියාපටිපාටියේ අඩුපාඩු හේතුවෙන් සමාගම් ලියාපදිංචි කිරීමේ නාමලේඛනයෙන් නාමය කපා හැර ඇති සමාගම් 26ක කොටස් ආයෝජනය සඳහා වැය කර ඇති රු. 40,217,208 ක මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) මණ්ඩලය විසින් අපනයන ණය ලබාදී ඇති අපනයනකරුවන් අතුරින් අපනයනකරුවන් 146 දෙනෙකු වෙතින් 2023 දෙසැම්බර් 31 වැනි දිනට අයවිය යුතු මුදල රු. 38,027,520 කි. මෙ මුදලින් සියයට 96ක් වසර 25 ක කාල සීමාවක් මුළුල්ලේ අයකර ගෙන නොතිබුණි.

(ඇ) අනෙකුත් ණයකරුවන්ගෙන් අයකර ගත යුතු රු. 7,230,203 ක මුදල වසර 10 ක් මුළුල්ලේම අයකර ගැනීමට මණ්ඩලය විසින් අපොහොසත් වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කළ යුතු බවට ක්‍රියාකාරී සැලැස්ම තුළ සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 30 ක භෞතික ප්‍රගතිය සියයට 10 සිට 50 අතර පරාසයක පැවතිණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 16.487 ක මුදලක් වැය කරමින් අපනයන ප්‍රවර්ධන වැඩසටහන් 07ක් සඳහා සහභාගී වූ අපනයනකරුවන් 92 ක් අතුරින් අපනයනකරුවන් 81 දෙනෙකු සම්බන්ධයෙන් ප්‍රගතිය ඇගයීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමාණවත් පසුවිපරම් ක්‍රියාපටිපාටි ගෙන නොතිබුණි.

(උ) මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාවට අදාළ තනතුරු අතුරින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 06ක්, මධ්‍ය කළමනාකරණ මට්ටමේ තනතුරු 23ක්, කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 14ක්, සහ MA හා PL ශ්‍රේණිවල තනතුරු 46 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින වනවිට පුරප්පාඩුව පැවතිණි.

අත්/කළේ. ඩබ්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති